# පොල් සංවර්ධන අධිකාරිය

# වාර්ෂික වාර්තාව

# කෙටුම්පත

# 2017

# පොල් සංවර්ධන අධිකාරිය

## අපගේ දර්ශනය

"පොල් කර්මාන්තය දල දේශීය

නිෂ්පාදනය සඳහා

වැවිලි ක්ෂේත්‍රයෙන් ඉහළතම

දායකත්වය ලබා දෙන්නා වීම සහ

නිෂ්පාදන අලෙවි විවිධාංගීකරණයේදී

ගෝලීය නායකයා වීම."

## අපගේ මෙහෙවර

**ගෘහස්ථ පාරිභෝජනය සහ කර්මාන්තය සඳහා**

**පොල් සහ පොල් නිෂ්පාදන සැපයුම**

**තහවුරු කිරීම මගින්,**

**පොල් කර්මාන්තය දීර්ඝ කාලීන වාණිජමය**

**ඵලදායීතාවය, තිරසාරත්වය හා ජාතික ආර්ථිකය**

**සඳහා ඉහළ දායකත්වයක් කරා**

**ගෙන ඒම සඳහා පහසුකම් සැපයීම**

## හැඳින්වීම

සමස්ත පොල් කර්මාන්තයේ සංවර්ධනය සඳහා 1971 අංක 46 දරණ පොල් සංවර්ධන පනතෙහි "පොල් සංවර්ධන අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන්නා වූ (මෙහි මින්මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියක් පිහිටවනු ලැබිය යුතුය" යන 111 වන කොටසේ 24 වන වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද ප්‍රධානතම ව්‍යවස්ථාපිත ආයතනය පොල් සංවර්ධන අධිකාරිය වේ.

පොල් සංවර්ධන අධිකාරියේ කර්තව්‍යයන් පනතේ 30 (1) වගන්තිය අනුව පහත පරිදි වේ.

(අ) පොල් කර්මාන්තය සහ පොල් වගාවන් සිදු කරනු ලබන ඉඩම් හා පොල් වගාවන් සඳහා ඉඩම් ආර්ථික වශයෙන් ප්‍රයෝජන ගැනීම සම්බන්ධයෙන් සංවර්ධන ප්‍රමුඛතා පිළිබඳව තීරණය කිරීම හා ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා අමාත්‍යවරයා වෙත සහය ලබා දීම.

(ආ) එසේ තීරණය කරනු ලබන සංවර්ධන ප්‍රමුඛතා වලට අනුකූලව ව්‍යාපෘති හා යෝජනා ක්‍රම සකස් කිරීම හෝ සකස් කිරීම සඳහා සහය වීම.

(ඇ) එසේ සකස් කරනු ලබන ව්‍යාපෘති හා යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා සහය ලබා දීම.

(ඈ) මේ පනත යටතේ අමාත්‍යවරයා විසින් පිහිටුවා ඇති මණ්ඩල වල ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම.

(ඉ) මණ්ඩලවල වාර්ෂික අය වැය අනුමත කිරීම හා ඔවුන් වෙත අරමුදල් ලබා දීම.

(ඊ) නිසි කළමනාකරණ ගිණුම්කරණ පද්ධති සකස් කිරීම ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම සඳහා මණ්ඩල වෙත උපදෙස් ලබා දීම හා සහය ලබා දීම.

(උ)අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන සංවර්ධන ප්‍රමුඛතා හා ප්‍රතිපත්ති සම්බන්ධයෙන් මණ්ඩලවල ප්‍රගතිය ඇගයීම.

(ඌ) පොල් කර්මාන්තය හෝ එහි නිෂ්පාදන පිළිබඳ යම් අංශයක් හෝ පොල් වගාවන් සිදු කරනු ලබන ඉඩම් හා පොල් වගාවන් සඳහා ඉඩම් ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් විද්‍යාත්මක පර්යේෂණ සිදු කරනු ලබන යම් තැනැත්තෙකුට හෝ පුද්ගල මණ්ඩලයකට (සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ) මූල්‍ය සහ වෙනත් යම් ආකාරයක සහය ලබා දීම හා එවැනි පර්යේෂණ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

(එ) අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සමාන හිමිකම් හා කර්තව්‍ය ඉටු කරනු ලබන ජාත්‍යන්තර සංවිධාන සමග සහයෝගීතාවන්ට එළඹීම.

(ඒ) පොල් කර්මාන්තය කෙරෙහි බලපාන හෝ අදාල සියලු කාරණා පිළිබඳව අමාත්‍යවරයා වෙත උපදෙස් ලබා දීම.

(ඔ) පොල් කර්මාන්තය සංවර්ධනය කිරීම හා යලි පණ ගැන්වීම සඳහා අවශ්‍ය යැයි අධිකාරියේ මතය වන සියලු පියවර ගැනීම.

**අධිකාරියේ බලතල පනතේ 31 වන වගන්තිය ප්‍රකාරව පහත පරිදිවේ.**

31 (1) අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි හෝ උචිත හෝ අනුෂංගික වන්නා වූ යම් සියලු ක්‍රියා සිදු කිරීමට වහා පියවර ගැනීමට අධිකාරියට බලතල තිබිය යුතුය.

(2) (1) වන උප වගන්තිය මගින් පවරා ඇති බලතල ව්‍යාපෘතියට අගතියක් නොමැතිව 22 (2) වන වගන්තිය මගින් විධි විධාන සලස්වා ඇති සියලු බලතල මණ්ඩලය හා සමානව අධිකාරිය වෙත තිබිය යුතුය.

(3) අමාත්‍යවරයා විසින් යෝග්‍ය යැයි සලකනු ලබන විට ඔහු විසින් ගැසට් පත්‍රයේ කරනු ලබන නියමයක් මගින් 23 වන වගන්තිය මගින් විධි විධාන සලස්වා ඇති විශේෂ බලතල වලින් එකක් හෝ කිහිපයක් හෝ ඉන් යම් කොටසක් මණ්ඩලය හා සමාන ආකාරයෙන් අධිකාරිය වෙත පවරනු ලැබිය හැකිය.

පොල් කර්මාන්ත ක්ෂේත්‍රයෙන් ශ්‍රී ලංකාව 2017 වසරේදී රුපියල් බිලියන 91 කට ආසන්න විදේශ විනිමය ප්‍රමාණයක් ලබා ඇති අතර, පොල් හා ඒ ආශ්‍රිත කර්මාන්ත වලින් දල දේශීය නිෂ්පාදනයට වාර්ෂිකව විශාල දායකත්වයක් ලබා දේ.

අමාත්‍යාංශය විසින් පොල් කර්මාන්තය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන ප්‍රතිපත්ති හඳුනාගෙන සකස් කිරීමේදී ඒ සඳහා සහය දැක්වීමේ කාර්යයන් ඉටු කිරීමට අමතරව පොල් කර්මාන්තයේ පිරි සැකසුම් සහ අලෙවිකරණ අංශයන් සංවර්ධනය කිරීමේදී, අධීක්ෂණය කිරීමේදී මෙහෙයුම් කාර්යභාරය ක්‍රියාත්මක කිරීම උදෙසා කාර්යමය වශයෙන් පොල් සංවර්ධන අධිකාරියේ සැකසුම් සංවර්ධන අංශය, තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය, අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය, මුදල් අංශය සහ පාලන යනුවෙන් ක්‍රියාකාරී අංශ 5 කින් සමන්විත වන අතර එක් එක් අංශය භාරව අධ්‍යක්ෂවරයෙක් කටයුතු කරයි. මෙම කාර්යයන් ඉටුකරගැනීමේදී ඉංජිනේරු අංශය සහ අභ්‍යන්තර විගණන අංශය ඉහත අංශවලට සහය වේ.

සභාපති ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් කටයුතු කරන අතර අධිකාරියේ වැඩකටයුතු මෙහෙයවීම, අධීක්ෂණය සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සකස් කරනු ලබන ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා හරහා සැකසුම් සංවර්ධන අංශය, තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය, අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය, පාලන අංශය හා මුදල් අංශයේ අධ්‍යක්ෂවරුන් හරහා ඉටු කරනු ලබයි. මෙම අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 259 කි. 2017 වර්ෂයේදී සේවයේ යෙදී සිටි සේවක සංඛ්‍යාව 221 වූ අතර එම සේවක සංඛ්‍යාවෙන් 32 දෙනෙකු කළමනාකරණ මට්ටමේ අය වූහ.

# සභාපතිතුමාගේ සමාලෝචනය - 2017

ලක්ෂ සංඛ්‍යාත ලාංකික ජනකායකගේ සිය ඍජු හා වක්‍ර ආදායම් මාර්ගය බවට පොල් හා ඒ ආශ්‍රිත කර්මාන්ත පත් කරමින් වැවිලි ක්ෂේත්‍රය තුළ සිය නම රැක ගන්නට  පොල් කර්මාන්තය සමත් වී ඇත.ග්‍රාමීය නාගරික සැම පන්තියක්ම නියෝජනය කරන ජනතාවගේ සමාජ ආර්ථික සංස්කෘතික කටයුතු කෙරෙහි ප්‍රබල ලෙස පොල් ගස බද්ධ වී ඇත.

2017 වසරේ පොල් ඵලදාව ගෙඩි මිලියන 2450 කි. සාමාන්‍යයෙන් වාර්ෂිකව ඵලදාවේ අඩු වීමක් වුවද පොල් ආශිත  නිෂ්පාදන වල ප්‍රමාණාත්මක වර්ධනයක් සිදුව ඇත. තැඹිලි , පොල් ක්‍රීම්,  පොල් කිරි, පොල් අරක්කු,  පොල් බටර් හා පොල් පිටි වැනි පොල් මද ආශ්‍රිත නිෂ්පාදන වල ප්‍රමාණාත්මක වැඩි වීමක් සිදුව ඇත.පොල් කටු අඟුරු හා  සක්‍රීය කාබන් නිෂ්පාදන ද පෙර වසර වලට සාපේක්ෂව අපනයන වර්ධනයක් 2017 වසර තුළ සිදුව ඇත.

පොල් ඵලයේ පොල් මද මෙන්ම පොල් ලෙලි භාවිතයෙන් සිදු කරන නිෂ්පාදනයන් වන කොහු ලණු, කඹ,  කොහු බුරුසු,  රබර් මිශ්‍රිත කොහු නිෂ්පාදන,  කොහු බත් හා මිහිසලු ආදියේ සැලකිය යුතු අපනයනයක් සිදු කර ඇත.පසුගිය වසර වලට සාපේක්ෂව පොල් ආශ්‍රිත  නිෂ්පාදන අපනයනකරුවන් නිෂ්පාදනයට හා අලෙවියට වැඩි නැඹුරුතාවයක් දක්වා ඇත.

අපනයනයේ ප්‍රමාණාත්මක වර්ධනයක් පවතිනවා යනු එම නිෂ්පාදන සඳහා අපේක්ෂිත වෙළඳපොළ  තුළ ඉහළ ඉල්ලුමක් පවතිනවා යන්නය.ඉහළ ඉල්ලුමක් පැවතීම යනු භාණ්ඩයේ තත්ත්වය, ප්‍රමිතිය, නිෂ්පාදන ක්‍රමවේද හා ගුණාංග ජාත්‍යන්තර ප්‍රමිතීන් අනුව සිදු වීමයි.ජාත්‍යන්තර ගැනුම්කරුවන් දේශීය පොල් රසයට වැඩි කැමැත්තක් දැක්වීමත් මෙයට ප්‍රබල ලෙස හේතු වී ඇත.

එබැවින් එම සාර්ථකත්වයේ මග පෙන්වන්නා වීම  නිසා පොල් සංවර්ධන අධිකාරිය නිරන්තර සතුටට පත් වෙයි.

අධිකාරියක් ලෙස අපගේ මූලික අරමුණ පොල් කර්මාන්තයේ අපනයන ආදායම වසරින් වසර ඉහළ නැංවීම වන අතර මෙතෙක් පොල් කර්මාන්ත ක්ෂේත්‍රයේ  ලබා ගත් ඉහළම අපනයන ආදායම පසුගිය වසරේ ලබා ගැනීමට හැකිවී ඇත. ඒ රු.බිලියන 91 ද ආදායමකි. අඩු පොල් ඵලදා කාලයකදී පවා එවැනි තත්වයක් අත් පත් කර ගැනීම ම සුවිශේෂී ජයග්‍රහණයකි.

2020 වන විට මුළු අපනයන ආදායම ඇ.ඩො.බි.20 දක්වා ඉහළ නැංවීමට රජය බලාපොරොත්තුවන අතර ඩො.බි.01 ක දායකත්වයක් පොල් සංවර්ධන අධිකාරිය ලබා දිමට අපේක්ෂා කරයි.එය ළගා කරගනිමින් ඉහළ ඉලක්ක කරා ගමන් කිරීමට  කැපවන ගරු ඇමතිතුමා සහ පොල් සංවර්ධන අධිකාරියේ  කාර්යය මණ්ඩලයට මාගේ ස්තුතිය පුද කරමි.

උදය රූපසිංහ
සභාපති

## අධ්‍යක්ෂ ජනරාල්ගේ සමාලෝචනය - 2017

ඈත අතීතයේදී වෙරළාශ්‍රිත ප්‍රදේශ වල සිට ගොඩ බිම අභ්‍යන්තරයට ව්‍යාප්ත වූ තාල වර්ගයට අයත් පොල් ගස *Cocos nucifera* යන විද්‍යාත්මක නමින් හැඳින්වේ. ලාංකීය ජන ජීවිතය හා යහමින් බද්ධ වී ඇති පොල් ගස වර්තමානයේදී 'Tree of Life' හෙවත් කප්රුක නමින් ප්‍රචලිතය. ලාංකීය භූමියෙන් හෙක්ටයාර 364,000 ක ව්‍යාප්ත වී ඇති පොල් ගස මෙරට ප්‍රධානම ආර්ථික භෝග තුනෙන් එකක් වන අතර සෘජු හා වක්‍ර රැකියා විශාල ප්‍රමාණයක් සපයා ඇත.

ලෝකයේ වැඩිම පොල් නිෂ්පාදන රටවල් වන ඉන්දුනීසියාව, පිලිපීනය, ඉන්දියාව හා බ්‍රසීලයට පමණක් පිටුපසින් සිටින ශ්‍රී ලංකාවේ වාර්ෂික පොල් ඵලදාව ගෙඩි මිලියන 3000-3600 ත් අතර වේ. මුලු පොල් නිෂ්පාදනයෙන් 60% ක් පමණ ගෘහාශ්‍රිතව පරිභෝජනයට ද ඉතිරිය පොල් මද ආශ්‍රිත අපනයන කර්මාන්ත වන දිසිදි පොල්, පොල් කිරි, පොල් කිරි පිටි, පොල් ක්‍රීම්, කොප්පරා හා ගෙඩි පොල් වශයෙන් පොල් කර්මාන්තයට යොදා ගනී.

භූමි ප්‍රමාණය අනුව 56% වන පොල් ත්‍රිකෝණයේ (කුරුණෑගල, පුත්තලම, ගම්පහ) වැඩිම පොල් ඝනත්වයක් දැකිය හැකි අතර එම ප්‍රදේශ වල වැඩිම පොල් ආශ්‍රිත කර්මාන්තද කේන්ද්‍ර ගතවී තිබේ. වර්තමානයේ උතුරු පළාතේ යාපනය, මන්නාරම හා මුලතිව් දිස්ත්‍රික්ක ආශ්‍රිතව දෙවන පොල් ත්‍රිකෝණය ඇති කිරීමට පියවර ගැනීම කටයුතු කෙරෙමින් පවතී.

පොල් ලාංකීය ජනතාවගේ දෛනික ආහාර රටාවේ ප්‍රමුඛස්ථානය ගන්නා අතර මධ්‍යම ප්‍රමාණයේ පොල් ගෙඩියක් කැලරි 1405 ක් ද මේදය 133 g ද අන්තර්ගත වේ. එය ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් 15% හා 70% කි. මීට අමතරව ප්‍රෝටීන 5% ලබා දෙන පොල් මදයේ තන්තු අධික වන අතර කොලෙස්ටරෝල් රහිත වේ.

නිවැරදි ආහාර සැකසුම් රටාවක් තුළින් ලංකාවේ ගෘහාශ්‍රිත පොල් පරිභෝජනය අවම කර අතිරික්ත පොල් ප්‍රමාණය පොල් මද ආශ්‍රිත කර්මාන්ත සඳහා යෙදවීමෙන් දැනට අපතේ යවන පොල් ලෙලි හා කටු නිවැරදි කාර්යක්ෂම ක්‍රමවේදයක් හරහා එක්රැස් කර පරිසරයට හිතකාමී ක්‍රමවේද හරහා නිෂ්පාදන ක්‍රියාවලියට යෙදවීමට දැනටමත් පොල් සංවර්ධන අධිකාරිය පියවර ගෙන තිබේ.

ඒ අතරම ජාත්‍යන්තර වෙළඳපොළ අවශ්‍යතාව හඳුනාගනිමින් ඊට ගැළපෙන ගුණාත්මක භාවයෙන් යුතු අගය වැඩි කළ භාණ්ඩ නිෂ්පාදනයට ජනතාව දිරි ගන්වයි. විදේශ වෙළඳපොළ තුළ පොල් ආශ්‍රිතව ශ්‍රී ලංකාවේ කීර්ති නාමය තව දුරටත් පවත්වා ගනිමින් පවතින විදේශ වෙළඳපොළ පුළුල් කිරීම සඳහා පොල් සංවර්ධන අධිකාරිය නිරතුරුව ක්‍රියාත්මක වෙයි.

ශ්‍රී ලංකාවේ දේශීය පොල් කර්මාන්තය නඟා සිටුවීම මෙන්ම, විදේශීය වෙළඳපොළ අවස්ථා වැඩි දියුණු කරගනිමින් තරඟකාරී අපනයන ක්ෂේත්‍රය ජය ගැනීම සඳහා පොල් කර්මාන්තයේ නව පිබිදීමක් ඇති කරලීමට කටයුතු කළ හැකි බව මා විශ්වාස කරමි.



ඒ. එච්. එල්. ඩී. ගාමිණී විජේසිංහ
අධ්‍යක්ෂ ජනරාල්

**2017 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා අධ්‍යක්ෂ**

**මණ්ඩල සාමාජිකයින්**

1. එච්. කේ. උදය රූපසිංහ මයා - සභාපති
2. ජයන්ත ජයවර්ධන මයා
3. කපිල යකන්දාවල මයා
4. ජී. සූරියප්පෙරුම මයා
5. ආර්. බී. අත්තනායක මයා
6. එෆ්. දේවාශිර්වාදම් මයා
7. එස්.පී. ජයරත්න මයා
8. ඩබ්. එම්. වයි. ටී. ප්‍රනාන්දු මෙනවිය
9. එන්. එස්. වනසිංහ මයා
10. ආර්. එම්. ඩී. කේ. නාමල් බණ්ඩාර මයා
11. චමින්ද ගමගේ මයා
12. එම්. සී. ඩී. වී, අපොන්සො මයා

## සභාපති ඇතුළු අංශ ප්‍රධානීන්

| | |
|---|---|
| 1 එච්. කේ. යූ. කේ. රූපසිංහ මහතා | - සභාපති |
| 2. ඒ. එච්. එල්. ඩී. ගාමිණී විජේසිංහ මහතා | - අධ්‍යක්ෂ ජනරාල් -(2017/04/03 දින සිට) |
| 3. ඒ. ටී. රණසිංහ මහතා | - ඉංජිනේරු |
| 4. එස්. එස්. පුරසිංහ මහත්මිය | - අධ්‍යක්ෂ (තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ) |
| 5. එස්. එස්. රාජකරුණා මහත්මිය | - අධ්‍යක්ෂ (පරිපාලන) |
| 6. එම්. පී. සන්ධ්‍යා කාන්ති මහත්මිය | - අධ්‍යක්ෂ (මුදල්) |
| 7. එච්. වී. පී. විජේවර්ධන මහතා | - අධ්‍යක්ෂ (සැකසුම් සංවර්ධන) - 2017/03/06 දක්වා |
| 8. පී. එදිරිමාන්න මහතා | - වැ. බ. අධ්‍යක්ෂ (සැකසුම් සංවර්ධන) - 2017/03/07 දින සිට |
| 9. පී. ඒ. එස්. කේ. සම්පත් සමරවික්‍රම | - අධ්‍යක්ෂ (අලෙවි සංවර්ධන හා පර්යේෂණ) |
| 10. ඩබ්. එම්. ටී. එස්. වීරසූරිය මහතා | - අභ්‍යන්තර විගණක |

# 2017.12.31 දිනට සංවිධාන ව්‍යුහය




**කෙටි යෙදුම් :**

1. ජ්‍යෙෂ්ඨ කළ. - ජ්‍යෙෂ්ඨ කළමණාකරණ මට්ටම
2. ස/නිඅධ්‍යක්ෂ - සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ
3. කළ. මට්. - කළමණාකරණ මට්ටම
4. අභ්‍යන්තර වි.නිලධාරී - අභ්‍යන්තර විගණන නිලධාරී
5. පරි. නිලධාරී - පරිපාලන නිලධාරී
6. ආර්. පර්. නිලධාරී- ආර්ථික පර්යේෂණ නිලධාරී
7. සැ. සං. නිලධාරී - සැකසුම් සංවර්ධන නිලධාරී
8. තත්. පාලන නිලධාරී- තත්ත්ව පාලන නිලධාරී
9. කණි.කළ - කණිෂ්ඨ කළමණාකරණ මට්ටම
10. අලෙ. සං. හා. පර්. - අලෙවි සංවර්ධන හා පර්යේෂණ
11. තත්. පා. හා ආර. තත්ත්ව පාලන හා ආරක්ෂණ

# පටුන

පරිච්ඡේද අංක


| | |
|---|---|
| සැකසුම් සංවර්ධන අංශය | **01** |
| තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය | **02** |
| අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය | **03** |
| පරිපාලන අංශය | **04** |
| මුදල් අංශය | **05** |
| විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව | **06** |
| විගණකාධිපති වාර්තාව | **07** |

# 01. සැකසුම් සංවර්ධන අංශය

සැකසුම් සංවර්ධන අංශයේ ප්‍රධාන කාර්යභාරය වනුයේ පොල් ආශ්‍රිත කර්මාන්ත නියාමනය කිරීම හා පොල් ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනයයි. ඒ යටතේ 2017 වර්ෂයේදී ප්‍රධාන වශයෙන් පහත කාර්යයන් ඉටු කරන ලදී.

- පොල් ආශ්‍රිත කර්මාන්ත ඒකක ලියාපදිංචි කිරීම සහ දෛනික පරීක්ෂා කටයුතු සිදු කිරීම
- පොල් ආශ්‍රිත කර්මාන්ත ආයතන, ගබඩා උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර පරීක්ෂා කිරීම, නියාමනය කිරීම.
- පොල් මද ආශ්‍රිත හා මද නොවන  කර්මාන්ත දේශීය හා ජාත්‍යන්තර ප්‍රමිති පිරිවිතර හා ගැලපෙන පරිදි සහතිකකරණය හා සංවර්ධනය කිරීම.
- පොල් කොහු කෙඳි කර්මාන්තය සංවර්ධනය  කිරීම.
- පොල් ආශ්‍රිත කර්මාන්තකරුවන් සඳහා අවශ්‍ය මූල්‍යමය සහය සඳහා මඟ පෙන්වීම.
- දිසිඳි පොල් කර්මාන්ත සඳහා මෝල් සංවර්ධන අරමුදල යටතේ නවීකරණ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම.

ඉහත කාර්යන් තුළින් පොල් ආශ්‍රිත කර්මාන්ත නියාමනය කිරීම ඔස්සේ නිෂ්පාදනයන්හි ගුණාත්මක භාවය වර්ධනය කිරීම හා  ඉලක්කගත අපනයන ආදායම් වර්ධනය කර ගැනීම අපේක්ෂා කරන ලදී.

2017 වර්ෂයේ සැකසුම් සංවර්ධන අංශයේ  ප්‍රධාන කාර්යයන් යටතේ  ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන් හා වැඩසටහන් පහත පරිදි වේ.

1. පොල් ආශ්‍රිත කර්මාන්ත ලියාපදිංචි කිරීම තුළින් පවත්නා නීති හා රෙගුලාසි අනුව කාර්මාන්තය පවත්වා ගැනීම.
2. පොල් නිෂ්පාදන ආයතන පරීක්ෂා කිරීම , ආදර්ශ ලබා ගැනීම හා  ක්ෂුද්‍රජීවී සහ භෞතික තත්ව සහතික නිකුත් කිරීම තුළින් පොල් ආශ්‍රිත නිෂ්පාදන වල ප්‍රමිති පිරිවිතර පවත්වා ගැනීම සඳහා කර්මාන්තකරුවන් යොමු කිරීම.
3. පොල් ආශ්‍රිත කර්මාන්තකරුවන් සඳහා මහජන බැංකුව හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා එක්ව සහන පොළී ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම තුළින් කර්මාන්ත සංවර්ධනය කිරීම
4. දිසිඳි පොල් නිෂ්පාදන ආයතන සඳහා මෝල් සංවර්ධන අරමුදල යටතේ නවීකරණ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම.
5. පොල් මද ආශ්‍රිත කර්මාන්ත සඳහා ISO 22000 ආහාර සුරක්ෂිතාව පිළිබඳ තත්ත්ව සහතික ක්‍රමවේදය සහ පොල් මද නොවන කර්මාන්ත සඳහා යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) තත්ත්ව පද්ධති යන අන්තර්ජාතික තත්ව සහතික ලබා ගැනීමේ ක්‍රමවේදයන්හි විගණන කටයුතු සඳහා දායකත්වය ලබා දීම තුළින් නිෂ්පාදන ක්‍රියාවලිය සහ නිමි නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම.
6. පොල් කොහු කෙඳි නිෂ්පාදනායතන සඳහා විධිමත් වියලුම් පිට්ටනි ඉදිකිරීමට ආයෝජන සහය ලබා දීම.
7. සාම්ප්‍රදායික පොල් කොහු කෙඳි නිෂ්පාදන කර්මාන්තය සඳහා අගය වැඩි කල නිෂ්පාදන හඳුන්වාදීම සඳහා තාක්ෂණික හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
8. සැකසුම් සංවර්ධන අංශයේ කාර්ය මණ්ඩලය කාර්යක්ෂම හා ඵලදායී ලෙස සේවා නියුක්තිය සඳහා නිපුනතා සංවර්ධනය කිරීම.

## 1.1 පොල් ආශ්‍රිත කර්මාන්ත ලියාපදිංචි කිරීම

- 2016 නොවැම්බර් මස සිට 2017 වර්ෂයේ පොල් ආශ්‍රිත නිෂ්පාදකයන් හා සැකසුම්කරුවන් ලියාපදිංචි කිරීම ආරම්භ කරන ලදී. අදාල ලියාපදිංචි අයදුම් පත් පොල් සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවියෙන් ලබා ගැනීමටත් මාර්ගගත (online) ක්‍රමය ඔස්සේ ලියාපදිංචිය ඉල්ලුම් කිරීමටත් කර්මාන්තකරුවන්ට අවස්ථා සලසා දෙන ලද අතර එමගින් කොළඹින් බැහැර ප්‍රදේශ වල සිට ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීම කඩිනම් හා කාර්යක්ෂම ලෙස සිදු කරන ලදී.

| Coconut Related Products Manufacturer/ Processor Registration | | | |
|---|---|---|---|
| | **Product type** | **2016** | **2017** |
| 1 | Desiccated Coconut දිසිදි | 50 | 50 |
| 2 | Creamed Coconut පොල් කිරම | 12 | 13 |
| 3 | Coconut Cream පිටිකල පොල් කිරි | 10 | 9 |
| 4 | Copra Oil කොප්පරා පොල් තෙල් | 80 | 59 |
| 5 | Virgin Coconut Oil නැවුම් පොල් තෙල් | 80 | 65 |
| 6 | Industrial Coconut Oil කාර්මික පොල් තෙල් | 4 | 9 |
| 7 | Coconut Water පොල් වතුර | 20 | 21 |
| 8 | Coconut Vinegar පොල් විනාකිරි | 1 | 1 |
| 9 | Paring Coconut Oil කුරුටු පොල් තෙල් | 16 | 27 |
| 10 | Coconut Milk පොල් කිරි | 16 | 16 |
| 11 | Powdered Coconut Milk/ පිටිකළ පොල් කිරි | 3 | 4 |
| 12 | Coconut Milk Related Products | 4 | 4 |
| 13 | Activated Carbon සක්‍රීය කාබන් | 8 | 8 |
| 14 | Fibre/Coir Mills කොහු/ කොහු මෝල් | 203 | 191 |
| 15 | Finish Products නිමි භාණ්ඩ | 131 | 105 |
| 16 | Coir Fibre pith Substrate/ කොහු බත් | 138 | 112 |
| 17 | Fibre Intermediate Products කොහු පිරි සැකසුම් | 8 | 22 |
| 18 | Coconut Butter පොල් බටර් | 2 | 4 |
| 19 | Coconut Sugar | 2 | 2 |
| 20 | RBD Coconut Oil | 4 | 6 |
| 21 | Copra Mill කොප්පරා | 20 | 16 |
| 22 | Coconut Spread | 4 | 3 |
| 23 | Shell Charcoal & Brequettes පොල් කටු අඟුරු | 22 | 21 |
| 25 | Coconut Shell Ornamental Products | 5 | 4 |
| 26 | White Coconut Oil සුදු පොල් තෙල් | - | 23 |
| 27 | Other coconut based products | 4 | 13 |
| | එකතුව | 843 | 808 |

වගුව 01 : 2017 හා 2016 වර්ෂයන්හි දී පොල් ආශ්‍රිත නිෂ්පාදකයන්/ සැකසුම්කරුවන්ගේ ලියාපදිංචිය

● 2017 වර්ෂයේ ලියාපදිංචි නිෂ්පාදනායතන පොල් ත්‍රිකෝණයේ හා අනෙකුත් දිස්ත්‍රික්කවල ව්‍යාප්ත වී ඇති ආකාරය රූපය 01හි දක්වා ඇත. ලියාපදිංචි වූ 808ක් වන නිෂ්පාදකයන්ගෙන් කර්මාන්තකරුවන් 317 (39.%) ක් කුරුණෑගල දිස්ත්‍රික්කයේත් පුත්තලම දිස්ත්‍රික්කයේ 199ක්(27%), ගම්පහ 171(21%)ක් ලෙස 85% හා අනෙක් දිස්ත්‍රික්කවල 15%ක් ලෙස ව්‍යාප්ත වී ඇත.




**රූපය 01 : ලියාපදිංචි කර්මාන්ත ව්‍යාප්තිය දිස්ත්‍රික්ක අනුව**

● පොල් මද හා පොල් වතුර නිෂ්පාදන ලියාපදිංචිය 2016 වර්ෂයට සාපේක්ෂව 2%කින්ද පොල් මද ආශ්‍රිත අගය වැඩි කළ නිෂ්පාදන කර්මාන්තවල 2017 වසරේ ලියාපදිංචිය 2016 වසරට සාපේක්ෂව 11% කින්ද වර්ධනය වී ඇත.
● මෙම වර්ෂයේදී නව නිෂ්පාදන කර්මාන්ත 178ක් ලියාපදිංචිය ලබා ගෙන ඇත

## 1.2. පොල් නිෂ්පාදන සඳහා ක්ෂුද්‍රජීවී සහ භෞතික තත්ව සහතික නිකුත් කිරීම

● 2017 වර්ෂය තුල දිසිදි පොල් මෙට්‍රික් ටොන් 29,558.94ක් නිෂ්පාදන වී ඇති අතර ඉන් ක්ෂුද්‍රජීවී සහ භෞතික පරාමිතී විශ්ලේෂණය කිරීම සඳහා දෛනික දිසිදි ආදර්ශ 7099 ක් සැකසුම් සංවර්ධන අංශය වෙත ලැබී ඇත. තත්ත්ව සහතික 1394 ක් නිකුත් කර ඇති අතර ගෙඩි පොල් හිඟතාවය හේතුවෙන් ඇතිවූ නිෂ්පාදන ඌනතාවයෙන් 2016 වර්ෂය හා සසඳන කල එය 60%ක පහළ යාමක් පෙන්නුම් කර ඇත.

| | නිකුත් කල සහතිකපත් ගණන | |
|---|---|---|
| සහතික වර්ගය | **2016** | **2017** |
| සැල්මොනෙල්ලා රහිත බවට | 655 | 347 |
| භෞතික තත්ත්ව විශ්ලේෂණ | 655 | 347 |
| ඇෆ්ලටොක්සින් රහිත බවට | 197 | 211 |
| සල්ෆර් ඩයොක්සයිඩ් රහිත බවට | 182 | 150 |
| **මුළු ගණන** | **1689** | **1394** |

**වගුව 2 : සැල්මොනෙල්ලා රහිත බවට, ඇෆ්ලටොක්සින් රහිත බවට , සල්ෆර් ඩයොක්සයිඩ් රහිත බවට හා භෞතික තත්ත්ව විශ්ලේෂණ සහතික පත් නිකුත් කිරීම**

- අපනයනකරුවන් සහ නිෂ්පාදකයින් විසින් ස්වේච්ඡාවෙන් ගෙනවිත් භාරදෙනු ලබන කොහු, පොල්තෙල්, පුන්නක්කු, කොප්පරා, දිසිදි පොල්, මේදය තරමක් ඉවත් කළ දිසිදි පොල් සහ පොල් කිරි ආදර්ශ, විශ්ලේෂණ කටයුතු සඳහා රසායනාගාරය වෙත යොමු කිරීමෙන් අනතුරුව ලද ප්‍රතිඵල ලේඛන අනුව පහත පරිදි විශ්ලේෂණ වාර්තා සහතික නිකුත් කර ඇත.

| | **නිකුත් කල වාර්තා ගණන** | |
|---|---|---|
| **නිෂ්පාදන වර්ගය** | **2016** | **2017** |
| කොහු | 135 | 184 |
| පොල් තෙල් | 191 | 332 |
| දිසිදි පොල් | 58 | 42 |
| මේදය තරමක් ඉවත් කළ දිසිදි පොල් | 112 | 121 |
| පොල් කිරි | 4 | 7 |
| පූර්ණ සනාවාස ගණන | 257 | 264 |

**වගුව 3: කර්මාන්තකරුවන්ගේ ඉල්ලීම අනුව ලැබෙන ආදර්ශ සඳහා ප්‍රතිඵල වාර්තා නිකුත් කිරීම**

## 1.3. 2017 වාර්ෂික දිසිදි පොල් නිෂ්පාදනය

- 2017 වර්ෂයේ වාර්ෂික දිසිදි පොල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 29,558.94 වන අතර මාසික නිෂ්පාදනයන් පහත වගුවේ පරිදි වේ.

- 2016 වර්ෂයේ දිසිදි පොල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 50,141.60 ක් වූ අතර 2017 වර්ෂයේ දිසිදි පොල් නිෂ්පාදනය 41% පහළ යාමක් පෙන්නුම් කර ඇත.

2016 සහ 2017 වර්ෂ වල දිසිදි පොල් නිෂ්පාදන අගයන්හි මාසික සංසන්දනාත්මක සටහනක් පහත රූපයෙහි වේ.




රූපය 2: 2016 සහ 2017 වර්ෂයන්හි දිසිදි පොල් නිෂ්පාදන අගයන්

## 1. 4. පොල් ආශ්‍රිත කර්මාන්තකරුවන් සඳහා මහජන බැංකුව හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව එක්ව ක්‍රියාත්මක කරනු ලබන සහන පොළී ණය යෝජනා ක්‍රමය

- මහජන බැංකුව කප්රුක නිපැයුම් දිරිය හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි කප්රුක ජය ඉසුර ණය යෝජනා ක්‍රම ද්විත්වය යටතේ ණය ලබා දුන් කර්මාන්තකරුවන් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| විස්තරය | 2016.12.31 දිනට | | | 2017.12.31 දිනට | | |
|---|---|---|---|---|---|---|
| | ණය ලාභීන් ගණන | ණය මුදල (රු.මි ) | අය විය යුතු ණය මුදල (රු.මි ) | ණය ලාභීන් ගණන | ණය මුදල (රු.මි ) | අය විය යුතු ණය මුදල (රු.මි |
| ක්‍රියාත්මක | 154 | 120.144 | 50.252 | 147 | 114.204 | 25.180 |
| ගෙවා අවසන් | 52 | 32.68 | - | 57 | 35.88 | - |
| ක්‍රියා විරහිත | 13 | 8.29 | 5.992 (පොළී - 1.63) | 2 1 | 14.49 | 6.095 (පොළී- 1.855) |

වගුව 4 : මහජන බැංකුවේ “ කප්රුක නිපැයුම් දිරිය “ ණය යෝජනා ක්‍රමය ණය ලාභීන්ගේ විස්තරය

- ඒ අනුව මේ වන විට 2017 වර්ෂයට අදාළව ගෙවා ඇති මුළු පොළී ප්‍රමාණය රු. 2,624,125.42 වේ.

- මහජන බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන කප්රුක නිපැයුම් දිරිය ණය යෝජනා ක්‍රමය යටතේ ඉල්ලුම් කරන ලද හා පොල් සංවර්ධන අධිකාරිය විසින් නිර්දේශ කරන ලද පොළී සහන පිලිබඳ සටහනක් පහතින් දැක්වා ඇත.

| වර්ෂය | 2016 | 2017 |
|---|---|---|
| බැංකුවේ නිර්දේශිත පොළී මුදල (රු.) | 5,877,409.26 | 3,630,484.99 |
| අධිකාරිය මගින් ගෙවීම් (රු.) | 4,026,428.28 | 2,624,125.42 |
| බැංකුවේ නිර්දේශයෙන් ගෙවීම්හි ප්‍රතිශතය | **68.5%** | **72.3%** |

**වගුව 5: 2017 වර්ෂයේ පොලී ප්‍රතිදාන ගෙවීම්**

| | අයදුම්කරුවන් ගණන | වසරේ ආරම්භයේ දී අයවිය යුතු ණය මුදල හා වසර තුලදී ලබා දුන් ණය මුදල (රු.මි.) | වසර අවසානයේ අය විය යුතු ණය මුදල (රු.මි.) |
|---|---|---|---|
| **2016** | 12 | 12.53 | 9.055 |
| **2017** | 15 | 13.26 | 12.432 |

**වගුව 6: - ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ " කප්රුක ජය ඉසුර " ණය යෝජනා ක්‍රමය**

- 2017.08.30 වන දින ණය යෝජනා ක්‍රම දෙක පිළිබඳවත් ව්‍යාපෘති වාර්තා පිළියෙල කරන ආකාරය පිළිබඳවත් , ණය ලබා ගැනීමට ඉල්ලුම් කරනු ලබන ව්‍යවසායකයින් ණය ලබා ගැනීමට සුදුසු ද යන්න හඳුනා ගන්නා ආකාරය පිළිබඳවත් එක් දින පුහුණු වැඩ මුළුවක් මහජන බැංකු හා ප්‍රාදේශීය සංවර්ධන බැංකු නියෝජිතයින් සහභාගී කරගනිමින් අධිකාරියේ නිලධාරීන් හට පවත්වන ලදී .

- මීට අමතරව 2017 වසරේ දී දිස්ත්‍රික්ක 9 ක කප්රුක ණය පිළිබඳව කර්මාන්තකරුවන් දැනුවත් කිරීමේ හා ණය ලබා ගත් ව්‍යවසායකයින් හට ඇති වී තිබෙන ගැටළු පිළිබඳව පසු විපරම් කිරීමේ වැඩ මුළු 8ක් පවත්වන ලදී. මෙම සියලු වැඩ මුළු මගින් ණය ලබා ගනු ලබන ව්‍යවසායකයින්ගේ 2017 වසරට වඩා සතුටුදායක ප්‍රගතියක් 2018 වසරේ දී අපේක්ෂා කෙරේ.

## 1.5. දිසිදි පොල් නිෂ්පාදන ආයතන සඳහා මෝල් සංවර්ධන අරමුදල යටතේ නවීකරණ කටයුතු සඳහා මුල්‍ය ප්‍රතිපාදන ලබා දීම

- සෑම දිසිදි පොල් නිෂ්පාදන කි.ග්‍රෑ 01ක් සඳහාම ශත 20ක මුදලක් එකී දිසිදි පොල් නිෂ්පාදන ආයතනය නමින් පිහිටුවා ඇති දිසිදි පොල් අරමුදල වෙත බැර කරනු ලබයි. අදාල ආයතනයේ නවීකරණ කටයුතු සඳහා එම අරමුදලින් අවශ්‍ය අවස්ථාවලදී මුදල් වෙන් කරනු ලැබේ.ඒ අනුව මුළු දිසිදි කර්මාන්ත 54න් 2017 වර්ෂය සඳහා දිසිදි නිෂ්පාදන කටයුතු වල නියැලී සිටි ආයතන 50ක් සඳහා රු. 5,065,062.39ක මුදලක් මෝල් සංවර්ධන අරමුදල සඳහා බැර කරන ලදී.

| මාසය | මෝල් සංවර්ධන අරමුදල සඳහා දායකත්වය රු |
|---|---|
| ජනවාරි | 529,514.15 |
| පෙබරවාරි | 464,674.04 |
| මාර්තු | 562,813.70 |
| අප්‍රේල් | 279,553.68 |
| මැයි | 438,273.44 |
| ජුනි | 532,678.96 |
| ජුලි | 444,484.65 |
| අගෝස්තු | 597,522.62 |
| සැප්තැම්බර් | 483,705.68 |
| ඔක්තෝම්බර් | 377,353.33 |
| නොවැම්බර් | 227,917.47 |
| දෙසැම්බර් | 126,570.63 |
| **මුළු මුදල රු.** | 5,065,062.39 |

**වගුව 7 : 2017 වර්ෂය සඳහා මෝල් සංවර්ධන අරමුදල සඳහා දායකත්වය**

- දිසිදි පොල් නිෂ්පාදනායතන සඳහා වර්ෂය පුරා පැවති අමුද්‍රව්‍ය හිඟතාවයේ බලපෑම අවම කිරීම සඳහා එම නිෂ්පාදනායතනයන්හි කාරක හා ප්‍රාග්ධන අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම සඳහා රු. මි.45.085 ක මුදලක් දිරි දීමනාවක් ලෙස මෝල් සංවර්ධන අරමුදල් වලින් නිෂ්පාදනායතන 45කට නිදහස් කරන ලදී.

- දිසිදි නිෂ්පාදනායතන 03 සඳහා ලෝහ සංවේදී උපකරණ මිලදී ගැනීමටත්, පොල් ගොඩගසන මිදුල් හා තෙත් අංශය නවීකරණය හා සංවර්ධනය සඳහා රු.මිලි.5.61ක් ප්‍රතිපූර්ණය කරන ලදී.

## 1.6. පොල් කොහු කෙඳි කර්මාන්තය සංවර්ධනය කිරීම

- **කොහු කෙඳි නිෂ්පදනායතන GMP සහතිකකරණය**

පොල් කොහු කෙඳි නිෂ්පාදන වල තත්ත්වය ඉහල නැංවීම හා එමඟින් ස්ථායි වෙළඳපොල හිමිකර ගැනීමේ අවස්ථා පොල් කොහු කෙඳි නිෂ්පාදන කර්මාන්තකරුවන් වෙත ලඟාකරවීමේ අරමුණින් යහපත් නිෂ්පාදන භාවිතායන් සහතිකකරණය (Good Manufacturing Practices/GMP ) පොල් කොහු කෙඳි කර්මාන්තය වෙත හඳුන්වා දෙන ලදී. GMP පිළිබඳ වැඩමුළු 11 ක් පොල් කොහු කෙඳි ආශ්‍රිත කර්මාන්ත බහුලව පවතින ලුණුවිල, කොළඹ, ගම්පහ, කුරුණෑගල, මාතර, හම්බන්තොට, වෙන්නප්පුව, බිංගිරිය, කුලියාපිටිය, නාගොල්ලගොඩ, මාදම්පේ යන ප්‍රදේශ වලදී ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේද සහයෙන් පවත්වන ලදී. එහිදී පොල් කොහු කෙඳී නිෂ්පාදනායතන අගය වැඩි කළ නිෂ්පාදන සඳහා යොමු කිරීමටත් ව්‍යවසායකයන් ලෙස අභිප්‍රේරණය කිරීමටත් විශ්ව විද්‍යාල සම්බන්ධ කරගනිමින් දැනුවත් කිරීම් සිදු කරන ලදී.



රූපය 3: GMP සහතිකකරණය සම්බන්ධයෙන්
කොහු කෙඳි නිෂ්පාදනායතන ලුනුවිලදී 2017 මැයි
මස පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන

GMP සහතිකකරණය සඳහා සහතිකකරණ ආයතන සමඟ එම ආයතන විගණනය සිදු කරන ලද අතර GMP සහතිකපත් 47ක් නිකුත් කරන ලදී. ඒ අනුව මෙම ව්‍යාපෘතිය යටතේ මේ වන විට සහතිකකරණය කල සම්පූර්ණ ආයතන සංඛ්‍යාව 60ක් දක්වා වර්ධනය වී ඇත.

- **කොහු වියලුම් පිට්ටනි සඳහා ආයෝජන සහය**

කොහු කෙඳි  කර්මාන්තකරුවන් හට යහපත් නිෂ්පාදන පුරුදු (GMP) සහතිකය ලබා ගැනීමට නොහැකි වීමට බලපාන ලද ප්‍රධාන සාධකයක් ලෙස වියලුම් පිට්ටනියක් නොමැති වීම සැකසුම් සංවර්ධන අංශය විසින් සිදු කල විගණන අධීක්ෂණ වලදී හඳුනා ගන්නා ලදී. ඒ අනුව වියලුම් පිට්ටනි නොමැති කොහු කෙඳි කර්මාන්තකරුවන් 50 දෙනෙකු වෙත වියලුම් පිට්ටනි සකස් කිරීම සඳහා ආයෝජන සහය ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබිණි.

ඒ අනුව 2017 වර්ෂයේ කොහු කෙඳි කර්මාන්තකරුවන් 42 දෙනෙකුට වියලුම් පිට්ටනි ඉදිකිරීම සඳහා වැයවූ මුදලින් 60%ක් ලෙස මුළු මුදල රු. 10,676,645.70ක් ආයෝජන සහය ලෙස ප්‍රතිපූර්ණය කර ලබා දීමට හැකි විය. එම ව්‍යාපෘතියේ ප්‍රගතිය 84%කි.

## 1.7.පොල්තෙල් සහ කොප්පරා කර්මාන්තකරුවන් සඳහා පහසුකම් සැලසීම තුළින් නිෂ්පාදනයේ සහ කර්මාන්තයේ තත්ත්වය ඉහළ නැංවීම

- පොල් තෙල් කර්මාන්තයේ සංවර්ධනය උපමාන නිශ්චය කිරීම සඳහා නිෂ්පාදනය ව්‍යාප්තව ඇති දිස්ත්‍රික්ක මූලික කරගනිමින් පොල් තෙල් නිෂ්පාදනායතනවල ස්වභාවය හා තත්‍ය ව්‍යාප්තිය පිළිබඳව  අධ්‍යනයක් සිදු කරන ලදී. එම ව්‍යාප්තිය වගුව 10න් ඉදිරිපත් කර ඇත.




**රූපය 04 පොල් තෙල් නිෂ්පාදනායතන හා සැකසුම් ඒකක දිස්තික්ක අනුව ව්‍යාප්තිය**

- ඒ අනුව, පොල් තෙල් නිෂ්පාදකයන් බහුලව ව්‍යාප්තව සිටින දිස්ත්‍රික්ක 4ක් මූලික කරගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහන් 07 ක් නිෂ්පාදකයන් 306 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පවත්වන ලද අතර ඔවුන් තත්ත්වයෙන් උසස් පොල් තෙල් නිෂ්පාදනය සිදු කිරීම පිළිබඳව දැනුවත් කරන ලදී.

## 1.8. සැකසුම් සංවර්ධන අංශයේ නිලධාරීන් පුහුණු කිරීමේ දායකත්වය

සැකසුම් සංවර්ධන අංශය වෙත පැවරී ඇති කාර්යයභාරය වඩාත් කාර්යක්ෂමව හා ඵලදායිව ඉටු කර ගැනීමේ අවශ්‍යතාවය මත හා අංශයේ කාර්ය මණ්ඩලය මගින් වඩාත් ප්‍රශස්ත මට්ටමින් රාජකාරි ඉටුකරවා ගැනීමේ අරමුණින් 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව පුහුණු හා මානව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඒ අනුව එම වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

එහිදී මූලික වශයෙන් විගණන පුහුණු හා රාජකාරිමය අවශ්‍යතාවය මත ISO, HACCP හා GMP සහතිකකරණය සම්බන්ධ වැඩමුළු හා වෙනත් තත්ත්ව කළමනාකරණ පාඨමාලාවන් සඳහා සැකසුම් සංවර්ධන අංශයේ කාර්යමණ්ඩලය සහභාගී කරවන ලදී. එම වැඩසටහන් පහත පරිදි වේ.

- **ISO සම්බන්ධ පාඨමාලාවන්**
  - Internal Auditing ISO 22000:2005 Food safety
  - Training Programme on ISO 14000:2008.
  - Training Programme on role of Junior managers or supervisors in the implementation of ISO 22000:2005 standard.
  - HACCP / ISO 22000 food safety management systems.
  - ISO 50001:2011 Energy management systems.

- ❖ **තත්ත්ව කළමනාකරණය සම්බන්ධ පාඨමාලාවන්**
  - ➢ Certificate course in Quality management system.
  - ➢ calibration of monitoring and measuring deveices.
  - ➢ Work shop on basic concepts of quality and productivity.
  - ➢ Result Based Project Managment

- ❖ **GMP සම්බන්ධ පාඨමාලාවන්**
  - ➢ Training Programme On GMP for coir Industry

- ❖ **කාර්යාලීය කටයුතු සම්බන්ධ පාඨමාලාවන්**
  - ➢ කාර්යාලීය ක්‍රම හා මුදල් රෙගුලාසි
  - ➢ රැස්වීම් ශිල්ප ක්‍රම
  - ➢ ගැටලු විසඳීම හා තීරණ ගැනීම

මීට අමතරව ක්ෂේත්‍රයේ කටයුතු කරනු ලබන සේවක මහත්ම මහත්මීන්ගේ දැනුම යාවත්කාලීන කිරීමේ අරමුණින් ප්‍රගති සමාලෝචන රැස්වීම් සෑම මාසයකම පැවැත්වීමට කටයුතු කරන ලදී.

තවද නවක පත්වීම් ලබා ගත් සංවර්ධන නිලධාරීන් 25 දෙනෙකු දිශාභිමුඛ පුහුණු කිරීම් සඳහා නිෂ්පාදන කර්මාන්ත වෙත ක්ෂේත්‍ර අධ්‍යන සඳහා සහභාගී කරවීමට කටයුතු කරන ලදී. එමෙන්ම එම නිලධාරීන් සඳහා සතියක කාලයක් ජාතික වැවිලි කළමනාකරණ ආයතනයෙහි ( NIPM ) සහ ලුනුවිල පොල් පර්යේෂණ ආයතනයෙහි පොල් කර්මාන්ත ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විධිමත් පුහුණුවක් ලබා දෙන ලදී.

ඒ අනුව රු.මි. 3.25 ක මුදලක් වැය කොට 2017 වර්ෂයේ සැලසුම් කර පරිදි පුහුණු වැඩසටහන් 25ක් සඳහා සැකසුම් සංවර්ධන අංශයේ සියලුම කාර්යමණ්ඩලය සහභාගී කරවීමට කටයුතු කරන ලදී.

## 1.9. කොහු ආශ්‍රිත නිෂ්පාදන පිරි සැකසුම් සහ අගය වැඩි කිරීමේ කර්මාන්ත පිළිබඳ තාක්ෂණික දැනුම ලබා ගැනීමේ විදේශ සංචාරය

කර්මාන්තකරුවන් හා පොල් සංවර්ධන අධිකාරියේ සේවයේ නියුතු නිලධාරීන් සඳහා පොල් ආශ්‍රිත කර්මාන්ත යන්ත්‍රෝපකරණ නව නිෂ්පාදන පිළිබඳ තාක්ෂණික දැනුම පුළුල් කරගැනීමේ මූලික පියවරක් වශයෙන් මෙම වර්ෂයේදී විදේශ සංචාරයක් සඳහා සහභාගී වීමට අවස්ථාව උදා කරගන්නා ලදී.
පොල් සංවර්ධන අධිකාරියේ නිලධාරීන් 05 දෙනෙකු සහ තෝරාගත් කොහු ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තකරුවන් 10 දෙනෙකු හට, කොහු ආශ්‍රිත නිෂ්පාදන පිරි සැකසුම් සහ අගය වැඩි කිරීමේ කර්මාන්ත පිලිබඳ තාක්ෂණික දැනුම ලබා ගැනීම සඳහා ඉන්දියානු (බැංගලෝර්) වැවිලි කළමනාකරණ ආයතනයේ මෙහෙයවීම යටතේ 2017/10/22 දින සිට 28 දින දක්වා පුහුණු සංචාරය සිදු කරන ලදී.



රූපය 5: පොල් සංවර්ධන අධිකාරියේ නිලධාරින් 05, කර්මාන්තකරුවන් 10 වැවිලි කළමනාකරණ ආයතනයේ අධ්‍යක්ෂ වී.ජේ. ධනුකුමාර මහතා සමඟ ඡායාරූපය



රූපය 6:Off campus field visit- southern India- Central Institute of coir technology

## ව්‍යාපෘති ඒකකය

පොල් හා පොල් ආශ්‍රිත සුළු පරිමාණයේ කර්මාන්තනියාමනය හා සංවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් වැඩසටහන් පැවැත්වීම මෙම ඒකකය මගින් සිදු කරනු ලැබේ. එම වැඩසටහන් පහත සඳහන් ප්‍රධාන තේමාවන් යටතේ සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබේ.

පොල් වගාවේ ව්‍යාප්තියට සමගාමීව කර්මාන්ත ව්‍යාප්ත කිරීම.

- පොල් ආශ්‍රිත සියලුම අමුද්‍රව්‍ය ආර්ථික ඵලදායී කටයුත්තකට යොමු කිරීමට ජනතාව දැනුවත් කිරීම සඳහා ව්‍යවසායකයින් පෙළඹවීම.
- පවත්නා සුළු පරිමාණයේ කර්මාන්ත සංවිධාන ගත කර ශක්තිමත් කප්රුක කර්මාන්ත සමිති බවට පත් කිරීම.
- නව ව්‍යවසායකයින් කර්මාන්තයට යොමු කිරීමට තාක්ෂණ පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- ගුණාත්මක නිෂ්පාදන සිදු කිරීමට අවශ්‍ය කරන තාක්ෂණික උපකරණ හා මෙවලම් ලබා දීම.
- වෙළඳ පොළ සබඳතා ගොඩ නගමින් දත්ත පද්ධතියක් පවත්වා ගෙන යාම.

### 1. පොල් වගාවේ ව්‍යාප්තියට සමගාමීව කර්මාන්ත ව්‍යාප්ත කිරීම.

දිවයිනේ පොල් වගාවෙන් 54% ක් පොල් ත්‍රිකෝණය තුල ව්‍යාප්ත වී ඇති අතර ඉතිරි භූමි ප්‍රමාණය 46% වේ. පොල් හා පොල් ආශ්‍රිත කර්මාන්ත 85% පොල් ත්‍රිකෝණය තුල ව්‍යාප්ත වී ඇති අතර ඉතිරි සුළු ප්‍රමාණය පොල් ත්‍රිකෝණයෙන් බැහැරව පවතී. මෙම ප්‍රදේශ වල අමුද්‍රව්‍ය නාස්තිය අවම කිරීම සඳහා පොල් කටු/ පොල් ලෙලි මධ්‍යස්ථාන ආරම්භ කර ඇත. ගෘහස්ථ පරිභෝජනයෙන් ඉවත ලන පොල් කටු/ පොල් ලෙලි ප්‍රයෝජනයට ගැනීම සඳහා දිවයිනේ දිස්ත්‍රික්ක 07ක දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

මේ යටතේ පොල් කටු මධ්‍යස්ථාන 25 සහ පොල් ලෙලි මධ්‍යස්ථාන 25 පිහිටුවන ලදී. මෙම කාර්ය සඳහා ප්‍රජාව දැනුවත් කිරීම හා ඒ ආශ්‍රිත ව්‍යවසායකයින් දිරිමත් කිරීම සඳහා නාම පුවරු 50ක් එම මධ්‍යස්ථාන වලට ලබා දී ඇත. පොල් කටු එකතු කිරීමේ මධ්‍යස්ථාන 24 කින් පොල් කටු කි. ග්‍රෑ. 4,877,796 ක් එක්රැස් කර කර්මාන්ත වෙත යොමු කරන ලදී. පොල් ලෙලි එකතු කිරීමේ මධ්‍යස්ථාන 22 කින් පොල් ලෙලි කි. ග්‍රෑ. 9,370,940 ප්‍රමාණයක් කර්මාන්ත වෙත යොමු කර ඇත.




රූපය7: පොල් කටු මිලදී ගැනීමේ මධ්‍යස්ථානයකට ලබා දුන් නාම පුවරුවක්

## 2. පොල් ආශ්‍රිත සියලුම අමුද්‍රව්‍ය ආර්ථික ඵලදායී කටයුත්තකට යොමු කිරීමට ජනතාව දැනුවත් කිරීම සඳහා නව ව්‍යවසායකයින් පෙළඹවීම.

දැනට පොල් වගාව ව්‍යාප්ත ප්‍රදේශවල නාස්ති වන අමු ද්‍රව්‍ය එකතු කර ප්‍රදේශයේ යටිතල පහසුකම් භාවිතා කරමින් ආරම්භ කල හැකි කර්මාන්ත සම්බන්ධව නව ව්‍යවසායකයින් දැනුවත් කර කර්මාන්ත ආරම්භ කරන ලදී.ඒ යටතේ යාපනය සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවල කොහු මොල් ආරම්භ කරන ලදී.

අමු ද්‍රව්‍ය නාස්තිය වලක්වා ගනිමින් කාර්යක්ෂමව අගය වැඩි නිෂ්පාදන සිදු කිරීම ආයතනයේ කාර්යයභාරය සහ ක්ෂේත්‍රයට සපයන සේවාවන් නියාමනය සහ එහි වැදගත්කම පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මූලිකත්වයෙන් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව හා එක්ව සාර ප්‍රභාගිර ගුවන් විදුලි වැඩසටහන්ක් පවත්වන ලදී.

## 3. පවත්නා සුළු පරිමානයේ කර්මාන්ත සංවිධාන ගත කර ශක්තිමත් කප්රුක කර්මාන්ත සමිති බවට පත් කිරීම.

මේ වන විට පොල් ආශ්‍රිත කර්මාන්ත සිදු කරන සංවිධාන එකතු කර දැනුවත් කර කප්රුක කර්මාන්ත සමිති 8ක් පිහිටුවන ලදී.කප්රුක කර්මාන්ත සමිති වල විස්තර පහත පරිදි වේ.

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීයලේකම් කොට්ඨාශය | කර්මාන්ත සමිති වල විස්තර | සමිති සංඛ්‍යාව |
|---|---|---|---|
| කුරුණෑගල | ගල්ගමුව<br>මාස්පොත<br><br>වාරියපොළ | තවාෂි බුරුසු නිෂ්පාදන සමිතිය, ගල්ගමුව<br>දිරිය ශක්ති පොල් කටු ආශ්‍රිත නිෂ්පාදන කප්රුක සමිතිය.කුඩා ගල්ගමුව .<br>එකමුතු පොල් කටු ආශ්‍රිත නිර්මාණ කප්රුක සමිතිය , කනත්තේවැව. | 03 |
| කලුතර | කලුතර | එකමුතු ස්වයං රැකියා සමිතිය.පොතුපිටිය නැගෙනහිර ,<br>ශ්‍රමශක්ති ස්වයං රැකියා සමිතිය.කුඩා වස්කඩුව , | 02 |
| මාතර | තිහගොඩ | සමගි උයන්ගොඩ , කප්රුක කර්මාන්ත සමිතිය “ | 01 |
| ගාල්ල | බලපිටිය | ජම්බුගහවත්ත කප්රුක කර්මාන්ත සමිතිය.<br>අම්පේ කප්රුක කර්මාන්ත සමිතිය. බලපිටිය , | 02 |

වගුව 8: පිහිටුවන ලද කප්රුක කර්මාන්ත සමිති

4. නව ව්‍යවසායකයින් කර්මාන්තයට යොමු කිරීමට තාක්ෂණ පුහුණු වැඩසටහන් පැවැත්වීම.

සුළු හා ගෘහස්ථ පරිමාණ කර්මාන්ත ආරම්භ කිරීමට කැමැත්තක් දක්වන ව්‍යවසායකයින් හඳුනා ගනිමින් ඔවුන් ඒකරාශි කර නිෂ්පාදන සිදු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණය ලබා දීමට පුහුණු වැඩසටහන් පැවැත්වේ.මෙහෙදී අලෙවි කිරීමට හැකියාවක් පවතින ඉල්ලුමක් සහිත නිෂ්පාදන සඳහා පුහුණුවක් ලබා දෙමින් වැඩසටහන පවත්වන අතර ඒ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා වෙළඳ සබඳතා ගොඩනැගීමට කටයුතු කරනු ලැබේ.මෙම වැඩසටහන් සඳහා ඉල්ලීම ස්වෙච්ඡා සංවිධාන හා පුද්ගලික රාජ්‍ය ග්‍රාමීය මට්ටමේ සමිති සමාගම් වලින් ලැබෙන අතර ඒ පිළිබඳව අධ්‍යනය කර සුදුසු ආයතන වලින් ලැබෙන වැඩසටහන් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.මේ යටතේ සමාජ විරෝධී වැඩ කර දැනට පුනුරුත්ථාපනය කොමසාරිස් ජනරාල් කාර්යාන්ශයට අනුබද්ධ පුනුරුත්තාපන මධ්‍යස්ථාන වල සිටින පුනුරුත්ථාපනලාභීන් සඳහා විධිමත් පුහුණුවක් ලබා දීමට කටයුතු කරනු ලැබේ.



රූපය09: සේනපුර තෘතික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු කටයුතු සිදු කරන ආකාරය

## 2017 වර්ෂයේ පවත්වන ලද පුහුණු වැඩසටහන්

තවාෂි බුරුසු පුහුණු වැඩසටහන්

| අංකය | පැවැත්වූ දිනය | පැවැත්වූ ප්‍රදේශය හා දිස්ත්‍රික්කය | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| .1 | 03,04/01/2017 | දෙකිඳ, නාවලපිටිය | 24 |
| | 5,6/01/2017 | හොරකඩ, හැටන් | 20 |
| | 07,08/01/2017 | මාතලේ | 11 |
| | 29-28/01/2017 | පෙරියන්කුලම, අනුරාධපුරය | 20 |
| | 17-15/05/2017 | බ්ලැක්වෝටර් වත්ත | 20 |

| | | | |
|---|---|---|---|
| | 04-03/03/2017 | සෝල්ලේපුර, රාජාංගනය | 25 |
| | 10,11/03/2017 | ගෝනගම, වාරියපොළ | 25 |
| | 22-20/03/2017 | ඇඹව, කුලියාපිටිය | 20 |
| | 07-05/08/2017 | මීනුවන්දෙණිය, අඹගමුව | 18 |
| | 06-04/09/2017 | සේනපුර, වැලිකන්ද | 20 |
| | 18-04,16-02/10/2017 | මුරුතුන්ගේ 1, 2 | 45 |
| | 15-13/10/2017 | මොරහේනගම | 25 |
| | 10-1209/2017 | කලුතර | 55 |
| | | මුළු ගණන | 328 |

වගුව 09: තවාෂි බුරුසු පුහුණු වැඩසටහන්

ඉදල් මුසුන් නිෂ්පාදන පුහුණු වැඩසටහන්

| අංකය | පැවැත්වූ දිනය | පැවැත්වූ ප්‍රදේශය හා දිස්ත්‍රික්කය | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| .2 | 08/01/2017 | කුලියාපිටිය | 30 |
| | 08-06/02/2017 | වැලිකන්ද, පුනරුත්ථාපන කඳවුර | 20 |
| | 16/05/2017 | හෝමාගම සංසාරාම කප්රුක සමිතිය | 23 |
| | 07/08/2017 | මීනුවන්දෙණිය, අඹගමුව | 26 |
| | 15-0914/2017 | මීරිගම | 20 |
| | 10-08/11/2017 | පුනුරුත්ථාපන කඳවුර වව්නියාව | 10 |
| | 18-16/11/2017 | සේනපුර, වැලිකන්ද | 28 |
| | | මුළු ගණන | 157 |

වගුව 10: ඉදල් මුසුන් නිෂ්පාදන පුහුණු වැඩසටහන්

පොල් කටු ආශ්‍රිත විසිතුරු භාණ්ඩ පුහුණු වැඩසටහන්

| අංකය | පැවැත්වූ දිනය | පැවැත්වූ ප්‍රදේශය හා දිස්ත්‍රික්කය | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| | 12/03/2017 | මහාරච්චිමුල්ල, අලව්ව | 21 |
| | 03-02/06/2017 | ලක්ෂ උයන, පොලොන්නරුව | 30 |
| | 07-05/06/2017 | සේනපුර, වැලිකන්ද | 21 |
| | 20-19/09/2017 | කුඩා ගල්ගමුව | 20 |
| | 26/09/2017 | දොඩංගොඩ | 25 |
| | 28-26/10/2017 | වාරියපොළ | 24 |
| | | මුළු ගනන | 141 |

වගුව 11: පොල් කටු ආශ්‍රිත විසිතුරු භාණ්ඩ පුහුණු වැඩසටහන්

පාපිසි නිෂ්පාදන පුහුණු වැඩසටහන්

| අංකය | පැවැත්වූ දිනය | පැවැත්වූ ප්‍රදේශය හා දිස්ත්‍රික්කය | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| | 08-07/01/2017 | ලක්ෂ උයන, පොලොන්නරුව | 20 |
| | 07-5/04/2017 | සේනපුර, වැලිකන්ද | 20 |
| | | මුළු ගණන | 40 |

වගුව 12: පාපිසි නිෂ්පාදන පුහුණු වැඩසටහන්

කොහු ලණු සැකසීමේ පුහුණු වැඩසටහන්

| අංකය | පැවැත්වූ දිනය | පැවැත්වූ ප්‍රදේශය හා දිස්ත්‍රික්කය | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| | 22/12/2017 | බලපිටිය, ගාල්ල | 25 |
| | | මුළු ගණන | 25 |

වගුව 13: කොහු ලණු සැකසීමේ පුහුණු වැඩසටහන්

2017 වර්ෂයේ පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්

| දිනය | වැඩ සටහන | ස්ථානය | සහභාගී වූ ගණන |
|---|---|---|---|
| 12/03/2017 | කොහු ආශ්‍රිත නිෂ්පාදන පිළිබද දැනුවත් කිරීමේ වැඩ සටහන | ඇඹව, කුලියාපිටිය | 80 |
| 24/10/2017 | හරිත දින පොල් ප්‍රදර්ශනය | මාස්පොත | 600 |
| | | මුළු ගනන | 680 |

වගුව 14: 2017 වර්ෂයේ පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්

5. ගුණාත්මක නිෂ්පාදන සිදු කිරීමට අවශ්‍ය කරන තාක්ෂණික උපකරණ හා මෙවලම් ලබා දීම.

සුළු හා ගෘහස්ථ මට්ටමේ සිදු කරන නිෂ්පාදන වෙළඳ පොළ අවශ්‍යතා අනුව ගුණාත්මක මට්ටමින් සකස් කරලීම සඳහා පවත්නා සම්ප්‍රදායික කර්මාන්ත වලට නව තාක්ෂණය මුසු කිරීම සඳහා අඩු ආදායම් ලාභීන් වෙත උපකරණ හා මෙවලම් ලබා දීමද යන්ත්‍ර සූත්‍ර සහන පදනමින් ලබා දීමට කටයුතු කරනු ලැබේ .සාර්ථකව පුහුණුව අවසන් කරන ලද පුහුණුලාභීන් සඳහා අදාල කර්මාන්තය සිදු කිරීම සඳහා උපකරණමෙවලම් ලබා දීමට කටයුතු කරන ලද/



රූපය 10: . 2018 වර්ෂයේ උපකරණ හා මෙවලම් ලබා දීම.

| අංකය | උපකරණයේ වර්ගය | බෙදා දුන් ප්‍රදේශය | ප්‍රමාණය |
|---|---|---|---|
| 1. | තවාෂි දඟ දරන උපකරණ කට්ටල | අනුරාධපුර/ පෙරියන්කුලම | 20 |
| | | නුවරඑළිය/ හැටන් | 20 |
| | | සොලෙපුර/ හැටන් | 25 |
| | | වාරියපොළ | 15 |
| | | ඇඹව/ කුලියාපිටිය | 20 |
| | | සඳලංකාව/ හෙන්ඩියගල | 20 |
| | | පොලොන්නරුව | 20 |
| | | කුලියාපිටිය/ මුරුතැන්ගේ | 30 |
| | | හඟුරන්කෙත | 10 |
| 02 | කොහු හා කම්බි කපන උපකරණ කට්ටල | අනුරාධපුර/ පෙරියන්කුලම | 2 |
| | | නුවරඑළිය/ හැටන් | 6 |

| | | | |
|---|---|---|---|
| | | රාජාංගනය/ සෝලෙපුර | 2 |
| | | වාරියපොළ | 2 |
| | | කුලියාපිටිය | 2 |
| | | සඳලංකාව/ හෙන්ඩියගල | 2 |
| | | කුලියාපිටිය/ මුරුතැන්ගේ | 6 |
| | | හඟුරන්කෙත | 2 |
| 03 | ලනු මැෂින් හා ඉදල් කොසු උපකරණ | හඳපානාගල | 05 |
| | | ලබුදූව/ ගාල්ල | 04 |
| | | කුලියාපිටිය/ මුරුතැන්ගේ | 20 |
| | | අම්බලන්ගොඩ, බලපිටිය | 25 |
| | | මුළු ගනන | 258 |

වගුව 15: 2018 වර්ෂයේ ලබා දෙන ලද උපකරණ හා මෙවලම්

6. වෙළඳපොළ සම්බධතා ගොඩ නගමින් දත්ත පද්ධතියක් පවත්වා ගෙන යාම.

පවත්වනු ලබන වැඩසටහන් අනුව පොල් ආශ්‍රිත සුළු පරිමාන ගෘහස්ථ කර්මාන්තවල නියැලෙන නිෂ්පාදකයින් සඳහා වෙළඳ පොළ පුළුල් කරලීම සඳහා ගැනුම්කරුවන් හඳුන්වා දීමත් ප්‍රදර්ශන සඳහා යොමු කිරීම හා ඊට සහාය වීමට කටයුතු කරනු ලැබේ.



රූපය 11: කප්රුක නිෂ්පාදකයින් ඉදිරිපත් කරන ලද භාණ්ඩ ගරු වැවිලි කර්මාන්ත ඇමතිතුමා විසින් නිරීක්ෂණය කරන ආකාරය

සුළු පරිමාණ ගෘහස්ථ කර්මාන්ත සිදු කරන දර්ශනය පොල් ආශ්‍රිත CRT වෙළඳ ප්‍රදර්ශනය ව්‍යවසායකයින් දිරිමත් කිරීමත් කර්මාන්ත සිදු කිරීමට ව්‍යවසායකයින්ගේ සහභාගීත්වයෙන් කොළඹ බන්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදී.

| දිනය | ප්‍රදර්ශනය | ස්ථානය |
| --- | --- | --- |
| 04/01/2017 | නිල මෙහෙවර | ගාල්ල |
| 2017/04/07-8 | වැව්ලි සවිය ගමින් ගමට | සේරුවාවිල |
| 22-21/07/2017 | තේ කර්මාන්තයට වසර 100 පිරීම නිමිත්තෙන් වෙළඳ ප්‍රදර්ශනය | යටියන්තොට |
| 13-11/08/2017 | CRT වෙළඳ ප්‍රදර්ශනය | කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව |
| 26/08/2017 | වැව්ලි සවිය | මුරුතැනගේ, කුලියාපිටිය |
| 09/10/2017 | ආහාර තාක්ෂණ ප්‍රදර්ශනය | බදුල්ල, රිදීමාලියද්ද |
| | මුළු ප්‍රදර්ශන ගනන | 06 |

වගුව 16:2018 වර්ෂයේ පවත්වන ලද ප්‍රදර්ශන වල විස්තර

## 02. තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය

තත්ත්ව පාලන කටයුතු පිළිබඳ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම මගින් අපනයන තොග වල ගුණාත්මක භාවය සහතික කිරීම, විවිධ ඉල්ලුම්කරුවන්ගේ අවශ්‍යතා පරිදි පරීක්ෂණ පහසුකම් සැපයීම, පොල් නිෂ්පාදන දේශිය වෙළඳ පොලට යොමු වීමේදි පරික්ෂා කොට සහතික නිකුත් කිරීම සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන උසස් මට්ටමක පවත්වා ගැනීම සඳහා උපදේශකත්වය සැපයීම තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයේ ප්‍රධාන වගකීමයි.
ඒ අනුව
අංශයේ කාර්යයන්;

- **අපනයනය සඳහා යොමු වන පොල් නිෂ්පාදනයන් පරීක්ෂා කිරීම හා තත්ත්වය සහතික කිරීම**
  - *දිසිදි පොල් හි ක්ෂුද්‍රජීවී* හා භෞතික රසායනික පරික්ෂා සිදුකිරීම

    පොල් නිෂ්පාදන ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම මද ආශ්‍රිත නිෂ්පාදනය වන දිසිදි පොල් කර්මාන්තය ප්‍රධාන වශයෙන් මනා තත්ත්ව පාලනයකට යොමු කරන අතර දෛනික දිසිදි පොල් නිෂ්පාදන සියල්ල තත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයේදී දිනපතා පරික්ෂාවට භාජනය කෙරේ. අපනයනය සඳහා යොමු වන මෙම නිෂ්පාදන සඳහා තත්ත්ව සහතික නිකුත් කිරීම පිණිස මෙම පරික්ෂණ ප්‍රතිඵල දායක වේ.

  - *කොහුබත්* ආශ්‍රිත නිෂ්පාදන - පරික්ෂා කිරීම
- **පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ යෙදෙන්නන්, අපනයනකරුවන් හා පාරිභෝගික ජනතාව වෙනුවෙන් ඉටු කරනු ලබන සේවාවක් ලෙසට රසායනාගාර පරික්ෂණ සේවා, සහන ගාස්තු ක්‍රමයක් යටතේ සිදුකිරීම**

  ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කර ඇති පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා වන ප්‍රමිතින් හි දැක්වෙන ක්ෂුද්‍රජීවී හා භෞතික රසායනික පරික්ෂා සිදුකිරීමේ හැකියාව පොල් සංවර්ධන අධිකාරියේ තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය සතුවන අතර පොල් කර්මාන්තයේ නියැලී ව්‍යවසායකයන්ගේ අභිවෘද්ධිය සඳහා කඩිනම් පරික්ෂණ සේවාවන් ලබාදීමට සෑම විටම කටයුතු කරනු ලැබේ.

- **දිසිදි පොල් නිෂ්පාදන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා ක්ෂුද්‍රජීවී, භෞත රසායනික පරික්ෂා සිදුකිරීම**
  අධිකාරියේ රසායනාගාරයේ සිදුකරන පරික්ෂා හැරුණු කොට දිසිදි පොල් නිෂ්පාදනාගාර ආශ්‍රිත දිසිදි හා ජල ආදර්ශ රැස්කොට පරික්ෂා කර ප්‍රතිඵල සපයා පොල් නිෂ්පාදන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම හා නිෂ්පාදනයන්හි උසස් ප්‍රමිතියක් පවත්වා ගැනීම සඳහා දායකවේ.
- **තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයේ රසායනික හා ක්ෂුද්‍රජීවී රසායනාගාර සඳහා ISO 17025 තත්ත්වය පවත්වා ගැණීමේ කටයුතු සිදුකිරීම**

- පොල් තෙල් කර්මාන්තය සෞඛ්‍යාරක්ෂිතව පවත්වා ගැනීම හා නගාසිටුවීම අරමුණු කරගනිමින් අදාල පරික්ෂණ සිදුකිරිමට පොල් තෙල් නිෂ්පාදනාගාරයන් හි සෞඛ්‍යාරක්ෂිත භාවය පරික්ෂා කිරිම හා පොල් තෙල් නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන අමුද්‍රව්‍යවන කොප්පරා, නිෂ්පාදිතය වන පොල් තෙල් හා එහි අතුරුඵලය වන පුන්නක්කු ශ්‍රී ලංකා ප්‍රමිතින්ට අනුකූළ වන්නේදැයි පරික්ෂා කිරීම.

- දේශිය වෙළඳ පොළෙහි පවතින මිශ්‍ර පොල් තෙල් හඳුනාගැනිමේ පරික්ෂා සිදුකිරිමේ සහ අපගමනය විම පරිභෝගික අධිකාරියට සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර පාලන ඒකකය

වෙත දැනුම් දීම. පොල් තෙල් නිෂ්පාදනයන්හි තත්ත්වය පරික්ෂා කිරිම සිදුකරන අතර හඳුනාගත් මිශ්‍ර පොල් තෙල් විකුණුම්කරුවන් පිළිබඳ විස්තර පාරිභෝගික කටයුතු පිළිබඳවන පාරිභෝගික අධිකාරිය සහ ආහාරමය ද්‍රව්‍ය සඳහා පාලනමය බලතල ඇති ආයතනයවන සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර පාලන ඒකකය වෙත සපයා එකී ආයතන සමඟ එක්ව කටයුතු කර මිශ්‍ර පොල් තෙල් අනුභවයෙන් පාරිභෝගික ජනතාව රැකගැනීම සඳහා සේවාවන් සැපයීම.

- පොල් ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධව පැන නැගෙන දේශිය හා විදේශිය පැමිණිලි හමුවේ නිෂ්පාදන පරික්ෂණ සිදුකිරිම.

- පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්හි වැදගත් කම පිළිබඳ දැනුවත් කිරිමේ වැඩ සටහන් සහ ප්‍රදර්ශණ සඳහා සහභාගී වීම.

- ආහාරමය වෙනත් නිෂ්පාදන පරික්ෂා කිරිමේ සේවාවන් පවත්වා ගෙන යාම.

- වර්තමානයේ පවතින ශ්‍රී ලංකා ප්‍රමිතින් යාවත්කාලීන කිරිම සහ දැනට ප්‍රමිතින් නොමැති පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා ප්‍රමිති සැකසීමට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමඟ සම්බන්ධවී වැඩ සටහන් ක්‍රියාත්මක කිරිම.

- පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ පවතින රසායනාගාරයන්හි සේවයේ නියුතු කාර්යය මණ්ඩලය උදෙසා පුහුණු වැඩ සටහන් පැවැත්වීම.

මේ අනුව ගුණාත්මක පොල් නිෂ්පාදන බිහිකිරිමත්, ඒ අනුව දේශීය හා විදේශිය වෙළඳපල වර්ධනය වීමත් අපේක්ෂා කරමින් පොල් නිෂ්පාදන පරික්ෂා කිරිම තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය විසින් සිදුකර ඇත. මෙකී සියලු කාර්යයන්, වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මකට අනුව සිදුකරනු ලබන අතර 2017 වාර්ෂික ප්‍රගතිය පහත පරිදි වේ.

## Q1 අපනයනය සහ දේශිය පරිභෝජනය සඳහා යොමු වන පොල් නිෂ්පාදනයන්හි තත්වය සහතික කිරිම

### A පොල් නිෂ්පාදනයන්හි පූර්ව අපනයන ක්ෂුද්‍ර ජීවි විශ්ලේෂණ සිදුකිරීම සහ සහතික කිරීම

පොල් මද ආශ්‍රිත නිෂ්පාදනයන්හි පරික්ෂණ කටයුතු ලෙස ප්‍රධාන වශයෙන් සිදුවන්නේ දිසිදි පොල් සඳහා වේ. දිසිදි පොල් නිෂ්පාදනාගාරයන්හි සිදුවන දෛනික නිෂ්පාදන, සැල්මොනෙල්ලා පරික්ෂාවට භාජනය කිරිම, තත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයේ ක්ෂුද්‍රජීවි රසායනාගාරයේදී සිදුකෙරේ. මේ අනුව අපනයනය සඳහා යොමුවන දිසිදි පොල් නිෂ්පාදනයන් සියල්ල පරික්ෂාවට භාජනය කෙරේ.
2017 වසර සඳහා දෛනික දිසිදි නිෂ්පාදන ආදර්ශ 7500ක ඉලක්කයක් තිරණය කරන ලදි. ආදර්ශ 7059ක් සැල්මොනෙල්ලා සඳහා පරීක්ෂා කර 2017 වසරේදි මෙම පරික්ෂණ වෙනුවෙන් 94% ක ප්‍රගතියක් අත්කර ගෙන ඇත.




| | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|---|---|---|
| ආදර්ශ ප්‍රමාණය | 6532 | 10223 | 9318 | 6498 | 11609 | 9597 | 11265 | 7097 |
| නිෂ්පාදනය MT | 28850 | 46620 | 41645 | 29200 | 50368 | 41795 | 51219 | 29557 |

**රූපය 12: දිසිදි නිෂ්පාදන හා ආදර්ශ ලැබීම**

2016 වසරේදී පරික්ෂාවට භාජනය කල දිසිදි පොල් නිෂ්පාදන අතුරින් ආදර්ශ 40ක් සැල්මොනෙල්ලා විෂගතවීම වාර්තා විය. ප්‍රතිශතයක් ලෙස විෂගතවීම 0.4%කි. 2017 වසරේදී විෂගතවීම ආදර්ශ 89ක් වන අතර 2017 වසරේදී ක්ෂුද්‍රජීවී පරික්ෂාවට භාජනය කල දිසිදි ආදර්ශයන්හි ප්‍රතිශතයක් ලෙස ගත්කල මෙය 1.26% වේ. ඒ අනුව විශගතවීම සැලකිය යුතු පරිදි වැඩිවී ඇත. දිසිදි පොල් නිෂ්පාදනාගාරයන්හි තත්ත්වය පිළිබඳව සැලකිලිමත්වීම වැදගත් වේ.



| වසර | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| විෂගතවීම් ප්‍රතිශතය | 0.5% | 0.10% | 0.12% | 0.12% | 0.2% | 0.08% | 0.14% | 0.15% | 0.27% | 0.4% | 1.2% |

**රූපය 13: සැල්මොනෙල්ලා විෂගතවීම් - දිසිදි පොල් දෛනික ආදර්ශ**

පූර්ව අපනයන ක්ෂුද්‍රජීවී විශ්ලේෂණය සිදුකිරීම සඳහා මද නොවන නිෂ්පාදන අතුරින් ප්‍රමුඛත්වය ගනු ලබන්නේ කොහු බත් ආශ්‍රිත නිෂ්පාදනයි. 2016 වසරේදී ආදර්ශ 647ක් පරීක්ෂා කර ඇති අතර 2017 වසරේදී ආදර්ශ 872ක් පරීක්ෂා කර ඇත. මෙම ආදර්ශ 872 හි පරීක්ෂණ 1064ක් සිදුකර ඇත. මෙම ආදර්ශ පරීක්ෂා කිරීම සිදුකරනු ලබන්නේ ඉල්ලුම්කරුවන් විසින් සඳහන් කරනු ලබන පරාමිතීන් සඳහා වේ. 2017 වර්ෂයේදී කොහු බත් ආශ්‍රිත නිෂ්පාදන වාර්ෂික ඉලක්කයට සාපේක්ෂව, වැඩි ප්‍රමාණයක් පරීක්ෂා සඳහා භාජනය වී ඇත. ප්‍රගතිය 109%කි. මෙම ආදර්ශයන්හි සැල්මොනෙල්ලා සහ ඊකොලි පරීක්ෂාවන් සිදුකරනු ලැබේ. පරීක්ෂා කළ ආදර්ශ අතුරින් 4.5% ක් සැල්මොනෙල්ලා විශගතවීම් වාර්තා වී ඇති අතර කිසිදු ආදර්ශයක් ඊකෝලයි බැක්ටීරියාව සඳහා වන ප්‍රමිති සීමාවන් ඉක්මවා නැත.




**රූපය 14 :කොහු බත් ආශ්‍රිත නිෂ්පාදනයන්හි ක්ෂුද්‍රජීවී පරීක්ෂාව**

**B දිසිදි පොල් නිෂ්පාදනයන්හි පූර්ව අපනයන භෞත රසායනික පරීක්ෂා සිදුකිරීම සහ සහතික කිරීම.**

**භෞතික හා සංවේදී පරීක්ෂා ලෙස,** දිසිදි පොල් හි වර්ණය, කැටිති ප්‍රමාණය, තෙතමනය, රස, සුවඳ, අපද්‍රව්‍ය, කුරුටු, තෙල් බේරීම යන පරීක්ෂා ප්‍රධානව සිදුකර ඇත.

මේ අනුව 2016 වසරේදී ආදර්ශ 11343ක් පරීක්ෂා කර ඇති අතර 2017 වසරේදී ආදර්ශ 7097 ක් පරීක්ෂා කර ඇත. මෙම ආදර්ශ 7097 හි සිදුකර ඇති සම්පූර්ණ පරීක්ෂණ ගණන 56776 කි. 2017 වසරේ ඉලක්කයට සාපේක්ෂව ප්‍රගතිය 95% කි.




**රූපය 15: දෛනික දිසිදි පොල් නිෂ්පාදනයන්හි භෞත රසායනික පරික්ෂාව**

2016 වර්ෂය තුල පරික්ෂණයට භාජනය කල දිසිදි ආදර්ශ 11,343 අතුරින් ආදර්ශ 1054ක් එනම් 9.3%ක් භෞතික ලක්ෂණයන්හි අඩුපාඩු පෙන්නුම් කරන ලද අතර 2017 වර්ෂයේදී පරික්ෂා කල ආදර්ශ 7,097න් ආදර්ශ 664 එනම් 9.4%ක් එම අඩුපාඩු පෙන්වා ඇත. මේ අනුව භෞතික ලක්ෂණයන්හි ප්‍රමිතියානුකූල නොවීම 2017 වර්ෂයේදී සැලකිය යුතු පරිදි ඉහළ ගොස් ඇත. මෙලෙස ශ්‍රී ලංකා ප්‍රමිතිය හා එකඟ නොවූ ආදර්ශ අතුරින් වැඩිම ප්‍රතිශතය වන 59% ක් වර්ග කිරීම සඳහා ප්‍රමිතියට නොගැලපීමකි. තත්ව දෝශ පහත පරිදි වේ.

| පරාමිතිය | එකඟ නොවූ ආදර්ශ | |
|---|---|---|
| | ගණන | % |
| වර්ග කිරීම | 395 | 59 |
| වර්ණය | 238 | 36 |
| මුඩු බව | 21 | 3 |
| තෙතමනය | 37 | 5 |
| දැවුනු කැබලි | 187 | 28 |
| කර ගඳ | 173 | 26 |
| දුම් ගඳ | 15 | 2 |
| බාහිර අපද්‍රව්‍ය | 24 | 4 |
| කුරුටු | 12 | 2 |
| තෙල් බේරීම | 11 | 2 |
| තෙල් සහිතවීම | 12 | 2 |

**රූපය 17:** එකඟ නොවූ ආදර්ශ

(ඇතැම් ආදර්ශ පරාමිතින් කිහිපයකින් ප්‍රමිතිය හා එකඟ නොවී ඇත.)

## Q2. පොල් ආශ්‍රිත නිෂ්පාදන පරික්ෂා කිරිමේ සේවා පවත්වා ගැනීම

දේශිය නිෂ්පාදකයන්ගේ විවිධ පොල් නිෂ්පාදන විශ්ලේෂණය කිරිමේ සේවාව පවත්වා ගැනීම තත්ව පාලන හා තත්ව ආරක්ෂණ අංශය විසින් සිදුකරයි. ක්ෂුද්‍රජීවි පරික්ෂා, රසායනික පරික්ෂා, භෞතික පරික්ෂා සහ සංවේදි පරික්ෂා මේ යටතේ සිදු කෙරේ. මෙම සේවාව සාධාරණ මිලකට, සිදුකරන අතර ඉල්ලුම් කරුගේ අවශ්‍ය පරාමිතින්ට අදාලව පරික්ෂා කර වාර්තා නිකුත් කරනු ලැබේ. පොල් ආශ්‍රිත නිෂ්පාදනකරුවන්, පාරිභෝගික ජනතාව, සුළු, මධ්‍යම හා මහා පරිමාණ වෙළඳ මහතුන් සහ අපනයන කරුවන් ආදී වු ඕනෑම කාණ්ඩයක් සඳහා පොල් ආශ්‍රිත නිෂ්පාදන පරික්ෂා කිරිමේ සේවාව ලබා දෙනු ලැබේ.

මද වශයෙන් මේදය ඉවත් කළ දිසිදි පොල්, කොප්පරා, පොල් කෙදි, පොල් තෙල්, පුන්නක්කු, කොහු බත් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සහ පොල් කිරි හා කිරි ආශ්‍රිත පොල් පිටි වෙනත් නිෂ්පාදන ආදි වු විවිධ පොල් නිෂ්පාදන ද්‍රව්‍යයන් ශ්‍රී ලංකා ප්‍රමිතියට අදාලව පරික්ෂා කිරිමේ සේවාව පවත්වා ගෙන යනු ලැබේ. මේ සඳහා අවශ්‍ය වන නවීන රසායනාගාර උපකරණ, තත්ව පාලන අංශය සතු වන අතර කඩිනම් ප්‍රතිඵල ලබාදීම තත්ව පාලන අංශයෙන් සිදුකරනු ලැබේ.

ප්‍රමිතියානුකූල ලෙස පොල් ආශ්‍රිත නිෂ්පාදන නිපදවීම හා පරික්ෂා කර එහි තත්ත්වයන් පිළිබඳව අවබෝධය ලබා ගැනිම උදෙසා නිෂ්පාදකයින් දිරිගැන්වීම සඳහාත්, ශ්‍රී ලාංකික භාවය රැකෙන පරිදි තත්වයෙන් උසස් පොල් නිෂ්පාදන නිරතුරුව විදේශිය වෙළඳපොළ කරා යොමු කරවීම පිණිස අපනයන කරුවන් දිරිගැන්වීම සඳහාත්, පොල් සංවර්ධන අධිකාරියෙහි ඉහත කී ලියාපදිංචි කාණ්ඩ සඳහා 15%ක වට්ටම් ගාස්තුවක් ලබාදේ.

පරික්ෂා කර ගැනීම සඳහා පොල් මද ආශ්‍රිත නිෂ්පාදන ප්‍රධාන වශයෙන් යොමුවන අතර 2016 වසරේදි ආදර්ශ 742ක් පරික්ෂා කර ඇත. 2017 වසර තුල ආදර්ශ 868ක් විශ්ලේෂණයකර ඇත. ඉලක්කය වන ආදර්ශ 600ට සාපේක්ෂ ප්‍රගතිය 145% වේ. මෙම ආදර්ශ 868 හි සිදුකර ඇති සම්පුර්ණ පරික්ෂණ ගණන 2346 කි. 2017 වසරේදි පොල් මද ආශ්‍රිත නිෂ්පාදන අතුරින් සල්ෆඩයොක්සයිඩ් හා ඇෆ්ලටොක්සින් පරික්ෂණ සඳහා පමණක් දිසිදි ආදර්ශ 366ක් විශ්ලේෂණය කර ඇත. පොල් තෙල් ආදර්ශ පරික්ෂාවද 2016ට සාපේක්ෂව සැලකිය යුතු පරිදි ඉහළ ගොස් ඇත. මෙය පරික්ෂා කළ මුළු ආදර්ශ ප්‍රමාණයෙන් 38%කි. මේ යටතේ පරික්ෂා කළ සියළුම ආදර්ශ වර්ග පහත දැක්වේ.




**රූපය 16: පොල් ආශ්‍රිත නිෂ්පාදනයන් පරික්ෂා කිරිමේ සේවාවන් පවත්වා ගැනීම**

| වර්ෂය | දිසිදි පොල් (ආදර්ශ) | පුන්නක්කු (ආදර්ශ) | පොල් තෙල් (ආදර්ශ) | කොප්පරා ආදර්ශ) ( | මද වශයෙන් මේදය ඉවත් කරන ලදි දිසිදි පොල් (ආදර්ශ) | Coconut spread ) ආද (ර්ශ | පොල් ක්‍රීම් / කිරම ) ආදර්ශ ( | පිටි කල පොල් ) ආදර්ශ ( | පොල් නොවන ආදර්ශ | දිසිදි පොල් ආදර්ශ ) ඇෆ්ල ටොක්සින් හා සල්ෆර් ඩයොක්සයිඩ් |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2014 | 122 | 5 | 161 | 4 | 81 | -- | 11 | -- | 05 | 710 |
| 2015 | 35 | 10 | 158 | 3 | 105 | 01 | 11 | 01 | 01 | 214 |
| 2016 | 58 | 2 | 191 | 1 | 112 | -- | 4 | -- | -- | 374 |
| 2017 | 42 | - | 332 | - | 121 | - | 07 | - | - | 366 |

වගුව 18: **පොල් ආශ්‍රිත නිෂ්පාදනයන් පරීක්ෂා කිරිමේ සේවාවන් පවත්වා ගැනීම**

**Q3. A) ISO තත්ත්ව සහතිකය ලබා ගැනිමේ කාර්යයන්**

පොල් සංවර්ධන අධිකාරියේ තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය මගින් නිකුත් කරනු ලබන පරික්ෂණ සඳහා ජාත්‍යාන්තර පිළිගැනීමක් ලැබෙන පරිදි හා පරික්ෂණ කටයුතු නිවැරදිව, විධිමත්ව හා ක්‍රමාණුකූලව සිදුකිරිම සඳහා, ISO 17025 ප්‍රතිතන තත්ත්වයට අදාල කාර්යයන් පවත්වා ගෙන යනු ලැබේ. ඒ අනුව වාර්ශිකව උපකරණ ක්‍රමාංකනය කිරීම ජාත්‍යාන්තර හා දේශියව inter laboratory සහ inter laboratory වෘත්තිමය කුසලතා ඇගයිමේ පරික්ෂණ සඳහා පෙනී සිට ඇති අතර සතුටුදායක මට්ටමේ පවතී.

ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය විසින් පිරිනමනු ලබන ISO 17025 තත්ත්ව සහතිකය, පොල් තෙල් පරික්ෂණ ක්‍රමවේදයන් සඳහා තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයේ රසායනික විශ්ලේෂණ අංශය විසින් 2012 වසරේදී අත්කර ගනු ලැබූ අතර එය 2017 වසරේදී පැවති සුපරික්ෂණ පරික්ෂාවෙන් සමත්ව 2015 – 2018 වසර තෙක් ප්‍රතිතන තත්ත්වය දිර්ඝ කරන ලදි.

SLAB සහතික පත



දිසිදි පොල් හි ක්ෂුද්‍රජීවී පරික්ෂණ වන සැල්මොනෙල්ලා, සම්පූර්ණ ඍණාවාස සංඛ්‍යාව, දිලීර හා පුස් සංඛ්‍යාව, කොලිෆෝම් සංඛ්‍යාව, ඊ. කෝලයි සංඛ්‍යාව සඳහා 2017 ජනවාරි මස පැවති සුපරික්ෂණ පරික්ෂණයෙන් සමත්ව ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් පිරිනමනු ISO 17025 ප්‍රතීතන තත්වය 2018 ඔක්තෝම්බර් මස 27 දින දක්වා දිර්ඝ කරන ලදි.


SLAB
SRI LANKA ACCREDITATION BOARD
Certificate of Accreditation
Sri Lanka Accreditation Board for Conformity Assessment
hereby declares that
Microbiology Laboratory
Quality Control and Quality Assurance Division
Coconut Development Authority
having being found to comply with the accreditation criteria for testing/calibration laboratories as described in ISO / IEC 17025 : 2005 has been accredited as a testing laboratory under the field of
Biological Testing
and has been assigned the accreditation number
TL 030-02
This certificate is issued on 28 October 2015 and is valid until
27 October 2018
The accreditation was granted for the first time on 28 October 2015
The scope and conditions of accreditation are specified in the Schedule of Accreditation bearing the accreditation number appearing in this certificate.
Director / CEO
Sri Lanka Accreditation Board for Conformity Assessment
Colombo, Sri Lanka

SLAB සහතික පත

**B පුහුණු වැඩ සටහන් පැවැත්වීම**

තත්ත්ව පාලන අංශයේ කාර්යයන් කාර්යක්ෂම හා නිවැරදිව සිදුකිරීම සඳහා අවශ්‍ය වන පුහුණුව රසායනාගාරයේ සේවක පිරිස වෙනුවෙන් ලබාදී ඇති අතර වෙනත් බාහිර රසායනාගාරයන්හි සේවක පිරිස වෙනුවෙන් තත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය විසින් පුහුණු වැඩ සටහන් පවත්වා ඇත. වාර්ෂික සැලැස්මට අනුව පහත පරිදි ප්‍රගතිය ලබා ඇත.

| | පුහුණු වැඩ සටහන | සහභාගී වූ සේවක සංඛ්‍යාව | පුහුණුව පැවැත්වූ ආයතනය |
|---|---|---|---|
| 1 | Handling & usage of Scientific instrument | 2 | SLATL - Sri Lanka Association of Testing Laboratory |
| 2 | Training programme on uncertainty estimation in measurement | 3 | MUSSD - Measurement units, Standards and Services Department |
| 3 | Workshop on Good Manufacturing Practices (GMP) for Food Industry | 2 | SLSI -Sri Lanka Standards Institute |
| 4 | Workshop on current Development in Food Analysis Techniques | 2 | Ministry of Health |
| 5 | Microbiology Training | 14 | Kelaniya University (in house |

| | | | |
|---|---|---|---|
| | | | training) |
| 6 | Microsoft Excel Advance Analysis Tools | 01 | Adams Skils Development Centre |
| 7 | Latest Advances Techniques in sample preparation – Microwave digestion | 02 | Mile stone - Heyles |
| 8 | Analytical Approaches to Current Food Safety Issues | 04 | India –CFTRI Central Food Technological Research Institute Mysore |

වගුව 19: පුහුණු වැඩ සටහන් පැවැත්වීම

**Q4 අපනයනය සඳහා නිෂ්පාදනයවන පොල් නිෂ්පාදන කර්මාන්තයන්හි තත්ත්වය සුරක්ෂිත කිරිම**

දිසිදි පොල් නිෂ්පාදන ක්‍රියාවලිය වැඩි දියුණු කිරිම සඳහා ක්ෂුද්‍රජීවි හා භෞත රසායනික පරික්ෂා සිදුකිරිම, කර්මාන්ත ශාලා පරික්ෂා කිරිම සහ උපදේශක දායකත්වය සැපයීම. මේ යටතේ සිදුකරනු ලබන කාර්යයන් වේ.

2017 වර්ෂය තුල ක්ෂේත්‍ර පරික්ෂා 557ක් පැවැත්වීමට හැකියාව ලැබී ඇත. නිෂ්පාදන කරුවන්ගේ ඉල්ලීම මත පරික්ෂා කිරීම් වැඩිවී ඇති හෙයින් 2017 වසරේ ඉලක්කයට සාපේක්ෂ ප්‍රගතිය 139%කි.

දිසිදි පොල් නිෂ්පාදන තත්ත්වය වැඩි දියුණු කිරිම සඳහා ක්ෂුද්‍රජීවි පරික්ෂා සිදුකිරිම 2016 වර්ෂය සඳහා ආදර්ශ 257ක් වන අතර 2017 වර්ෂය සඳහා ආදර්ශ 264කි. මෙම ආදර්ශ 264 හි සිදුකර ඇති සම්පූර්ණ පරික්ෂණ සංඛ්‍යාව 792 කි. 2017 වසරේදි ඉලක්කයට සාපේක්ෂව ප්‍රගතිය 88%කි.

තවද දිසිදි පොල් නිෂ්පාදනයේදී භාවිතා කරනු ලබන ජලය නිසි ප්‍රමිතියෙහි පවතින්නේද යන්න පරික්ෂා කිරිම සඳහා එම ජලයේ ක්ෂුද්‍රජීවි හා රසායනික විශ්ලේෂණය සිදුකරනු ලැබේ. ක්ෂුද්‍රජීවි හා රසායනික විශ්ලේෂණ ආදර්ශ 194ක් පරික්ෂා කර ඇත. 2017 වසරේ වාර්ෂික ඉලක්කයට සාපේක්ෂ ප්‍රගතිය 97%කි.

**Q5. පොල් තෙල් කර්මාන්තය නඟාසිටුවීම**

**A මිශ්‍ර පොල් තෙල් පිළිබඳ වෙළඳ පොළ අධීක්ෂණ කටයුතු**

ආහාරයක් වශයෙන් පොල් තෙල්වල ඇති සෞඛ්‍යාරක්ෂිත ගුණය පිළිබඳව හා එම නිෂ්පාදන ප්‍රමිතියානුකූලව නිපදවීම සඳහා යොදා ගනු ලබන අමුද්‍රව්‍ය මෙන්ම, තත්ත්වය බාලවීමකින් තොරව වෙළඳපොළ යොමු වීම, අරමුණුකර ගනිමින් තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය විසින් පරික්ෂණ හා සමීක්ෂණ කාර්යයන් සිදුකර ඇත.

සෞඛ්‍ය අමාත්‍යාංශය සහ පාරිභෝගික අධිකාරිය වෙත මිශ්‍ර පොල් තෙල් පිළිබඳ ලැබී ඇති විශ්ලේෂණ ප්‍රතිඵල ලබාදී නීතිමය ක්‍රියාදාමයන් මගින්, පිරිසිදු පොල් තෙල් ලෙස මිශ්‍ර පොල් තෙල් වෙළඳාම සිදුකරන වෙළඳසැල් යම් පාලනයකට යටත් කිරිමට දායකවී ඇත.

දිවයිනේ දිස්ත්‍රික්කමය වශයෙන් වෙළඳපොලෙහි පවතින පොල් තෙල් ආදර්ශ රැස්කොට ඒවා මිශ්‍ර පොල් තෙල් වේ දැයි විමර්ශනය කිරිම සඳහා විශ්ලේෂණයන් නොකඩවා පැවැත්වීම 2017 වසරේද සිදුකර ඇති අතර කුඩා, මධ්‍යම හා මහා පරිමාණ වෙළඳසැල් සියල්ල ආවරණයවන පරිදි විධිමත්ව මෙම අධීක්ෂණ කටයුතු සිදුකර ඇත. 2017 වසරේදි ආදර්ශ 100ක් පරික්ෂා කර, මිශ්‍ර පොල් තෙල් වාර්තාවිමේ ප්‍රතිශතය 80 % ක් ලෙස පැවති අතර 2016 වසරේදි සිදුකරනු ලැබූ මෙවැනි ආදර්ශ

ප්‍රමාණයෙන් 47%ක ප්‍රතිශතයක් මිශ්‍ර පොල් තෙල් ලෙස වාර්තාවී ඇත. ඒ අනුව 2017 වසර තුළ පොල් තෙල් මිශ්‍ර කිරිමෙහි වැඩි නැඹුරුවීමක් පෙනී යයි. පොල් තෙල් මිශ්‍ර කිරිමක් සිදු නොකලද, ප්‍රමිතිය හා එකඟ නොවූ පොල් තෙල් වෙළඳ සැල් ආශ්‍රිතව පවතින බව ප්‍රතිඵල අනුව වාර්තා වී ඇත. ඒ අනුව නිදහස් මේද අම්ල ප්‍රමාණය ප්‍රමිතිය හා එකඟ නොවීම මත 16% ක් ද, අයඩින් අගය එකඟ නොවීම මත කුරුටු මිශ්‍ර පොල් තෙල් ලෙස හඳුනාගත් තෙල් 86%ක් වර්තා වී ඇත.

**B පොල් තෙල් කර්මාන්තයේ තත්ත්වය වැඩි දියුණු කිරිම**

පොල් තෙල් නිෂ්පාදනය ප්‍රමිතියානුකුල තත්ත්වයට පත්කිරීම සඳහා පොල් තෙල් මෝල් ආශ්‍රිතව තත්ත්ව පාලන වැඩ සටහන් ක්‍රියාවට නංවන ලදී. මේ අනුව පොල් තෙල් නිෂ්පාදනයේ අමුද්‍රව්‍ය වන කොප්පරා නිසි ප්‍රමිතියෙන් පවතිද යන්නත්, නිෂ්පාදනය කරනු ලබන පොල් තෙල් ගුණාත්මක තත්ත්වයේ පවතිද යන්නත්, පොල් තෙල් නිස්සාරණය කාර්යක්ෂමව සිදුවේද යන්නත් අධ්‍යයනය කිරිම සඳහා පිළිවෙලින් කොප්පරා, පොල් තෙල් හා පුන්නක්කු ආදර්ශයන් පොල් තෙල් නිෂ්පාදනාගාර ආශ්‍රිතව රැස්කර පරික්ෂණ ප්‍රතිඵල නිකුත් කර ඇත. මේ අනුව 2017 වර්ෂය සඳහා පොල් තෙල් ආදර්ශ 32ක්ද, කොප්පරා ආදර්ශ 32ක්ද , පුන්නක්කු ආදර්ශ 31ක්ද පරික්ෂා කර ඇත. මීගමුව, හලාවත හා කුරුණෑගල යන දිස්ත්‍රික්කයන් හි පිහිටි පොල් තෙල් නිෂ්පාදනාගාරයන් මේ අනුව පරික්ෂා කර ඇති අතර, ප්‍රමිතිය හා එකඟ නොවීම, පොල් තෙල් නිෂ්පාදනය 66%, කොප්පරා 75% ක් හා පුන්නක්කු 87% ක් වාර්තා වී ඇත. ප්‍රමිතිය හා එකඟ නොවීම 2016 වසරේදි පිළිවෙලින් 61%, 70% හා 90%කි. ප්‍රමිතිය හා එකඟ නොවීම සම්බන්ධව සැකසුම් සංවර්ධන අංශය හරහා නිෂ්පාදන කරුවන් දැනුවත් කිරිමට ප්‍රතිඵල ලබාදී ඇත.

මෙය තත්ත්ව පාලන අංශයේ කාර්තුමය ඉලක්කයක් සහිත වැඩ සටහනකි. පළමු හා දෙවන කාර්තු ඉලක්ක නිසිපරිදි සම්පුර්ණ කර ඇත. නමුත් තුන්වන හා හතර වන කාර්තුවලට අදාලව සැකසුම් සංවර්ධන අංශය විසින් මෙම ආදර්ශ වෙනුවට සැකසුම් සංවර්ධන අංශයේ සහ පාරිභෝගික අධිකාරියේ අවශ්‍යතාව පරිදි යොමු කර ඇති වෙනත් ආදර්ශ පරික්ෂා කර ඇත.

පොල් තෙල් කර්මාන්තයේ ගැටලු හේතුවෙන් පාරිභෝගික අධිකාරිය හා සම්බන්ධවී පොල් තෙල් විශේෂ ආදර්ශ 10ක් සඳහා පරික්ෂණ 52ක් සිදුකර ඇත. ප්‍රමිතිය හා එකඟ නොවීම 40% කී.

සැකසුම් සංවර්ධන අංශයේ අවශ්‍යතාව පරිදි දෛනිකව පරික්ෂා කිරීමේ පදනම මත පොල් තෙල් සහ කොහු බත් ආදර්ශ රැස්කොට ඇත. පොල් තෙල් ආදර්ශ 35ක් පරික්ෂණ සඳහා යොමු කර ඇති අතර එයින් සමත් වී ඇති ආදර්ශ ගණන 10කි. සම්පුර්ණ පරික්ෂණ ගණන 175කි. ප්‍රමිතිය හා එකඟ නොවීම 31% කී. කොහු බත් ආදර්ශ 34ක් පරික්ෂණ සඳහා යොමු කර ආදර්ශ 4ක් පමණක් සමත්වී ඇත. අසමත් ප්‍රතිශතය 88% කි. සම්පුර්ණ පරික්ෂණ ගණන 210කි. රසායනාගාර ධාරිතාව පරිදි කටයුතු කර ඇති අතර 2017 හි තත්ව පාලන අංශයේ ක්‍රියාකාරි සැලැස්මට අදාලව පළමු හා දෙවන කාර්තුමය ප්‍රගතිය සහ ඉහතකී විශේෂ ආදර්ශ පරික්ෂාවන්ද එකතුව සමස්ත ආදර්ශ පරික්ෂාවේ ප්‍රගතිය 99%කි.

**Q6 නව ප්‍රමිතින් ඇති කිරිම හා ප්‍රමිති සංශෝධනය කිරිම**

පොල් කර්මාන්තයට අදාල නව ප්‍රමිතින් සංශෝධනය කිරීමට තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශය විසින් ප්‍රමිති ආයතනය සමඟ එක්ව කටයුතු කරනු ලැබේ.

2017 වසරේදි පොල් තෙල් ප්‍රමිතිය සංශෝධනය කිරීම සඳහා අවශ්‍යවන පරික්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමට කටයුතු කර ඇති අතර ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් පවත්වා ඇති ක්‍රියාකාරි කමිටු සඳහා සහකාර අධ්‍යක්ෂ (තත්ත්ව පාලන හා තත්ව ආරක්ෂණ) සහභාගීවී ඇත.

**වෙනත් බාහිර ක්‍රියාකාරම්**

1. දැනුවත් කිරිමේ වැඩ සටහන් සඳහා දායකවීම

| වැඩ සටහන | පැවැත්වූ ආයතනය ස්ථානය | දිනය |
|---|---|---|
| 1. National workshop on the WTO agreement on Sanitary and phytosanitary measures and technical barriers to trade | Taj Samudra Hotel Colombo | 2017/02/20 -21 |
| 2. තත්ත්වයෙන් උසස් ඇසුරුම් සහිත පොල් තෙල් දේශීය වෙළඳ පොලට හදුන්වා දීමේ වැඩමුළුව | ගම්පහ<br>කුලියාපිටිය<br>ගාල්ල<br>කුරුණෑගල<br>මිනුවන්ගොඩ<br>පන්නල<br>කළුතර | 15/08/2017<br>22/08/2017<br>25/08/2017<br>13/09/2017<br>20/09/2017<br>02/10/2017<br>03/10/2017 |
| 3. සාර ප්‍රභාගිර ගුවන් විදුලි වැඩ සටහන | ගුවන් විදුලි සංස්ථාව | 09/07/2017<br>.ව.පෙ 24/12/2017<br>9.00 – 8.00දක්වා |
| 4. පොල් තෙල් කර්මාන්තයට අදාල තාක්ෂණික දැනුම ලබාදීම සඳහා වු කුරුණෑගල දිස්ත්‍රික් වැඩමුළුව | කාර්මික සංවර්ධන මණ්ඩලය | 29/12/2017 |

වගුව 20: දැනුවත් කිරිමේ වැඩ සටහන් සඳහා දායකවීම

1. පොල් කර්මාන්ත ක්ෂේත්‍රයේ අවශ්‍යතාව සඳහා සහ පොල් සංවර්ධන අධිකාරියෙහි සැකසුම් සංවර්ධන අංශයේ නව සේවකයන් සඳහා පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව පුහුණු වැඩ සටහන් 06ක් පවත්වා ඇති අතර සහභාගි වූ සංඛ්‍යාව 27කි.

2. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් පවත්වනු ලැබූ ජාත්‍යන්තර පොල් ප්‍රදර්ශනයේදි තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයේ කාර්යයභාරය විදහා දැක්වෙන ප්‍රදර්ශන කුටියක් සැලසුම් කර ප්‍රේක්ෂකයන් දැනුවත් කිරීම සිදුකර ඇත.

3. අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය සහභාගිවන දේශිය හා විදේශිය ප්‍රදර්ශන සඳහා නිදර්ශක පිළියෙල කර ලබාදීම සිදුකර ඇත.




**රූපය 17,18, :දේෂීය වෙළද ප්‍රදර්ශන**

**තත්ත්ව පාලන අංශයේ සමස්ථ ප්‍රගතිය හා ආදායම ඉපැයීම**

2017 වසර තුළ සම්පූර්ණ ආදර්ශ 16,628ක් පරික්ෂා කර ඇති අතර පරික්ෂණ 69,894ක් සිදුකර ඇත. වාර්ෂික ඉපැයීම රු. මිලියන 15.85කි.

## 3. අලෙවි සංවර්ධන සහ පර්යේෂණ අංශය

පොල් සංවර්ධන අධිකාරියේ ප්‍රධාන මෙහෙයුම් අංශයක් ලෙස අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය, 2017 වසරේදී සිය සේවාදායකයින් වන පොල් අලෙවිකරුවන් /අපනයනකරුවන්,කර්මාන්තකරුවන් සහ අනෙකුත් සේවා අවශ්‍යතා සපුරාගන්නවුන් සඳහා සුවිශේෂී වූ කාර්යයන් හා සේවාවන් රැසක් ඉටු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස 2017 වසර තුළ ශ්‍රී ලංකාව මුහුණ දුන් පොල් ඵලදාවේ දැඩිපසුබෑම යටතේ වුවදපොල් හා පොල් ආශ්‍රිත අපනයන ආදායමපෙර වසරේ වාර්තා වූ අපනයන ආදායම ද ඉක්මවමින් පොල් කර්මාන්ත ඉතිහාසයේ මෙතෙක් වාර්තාගත ඉහළම අපනයන ආදායම වූ රුපියල් බිලියන 91ක් ලෙස වාර්තාකිරීමට සමත් විය.මෙහිදී පොල් අලෙවිකරුවන්/අපනයනකරුවන්ගේ අපනයන වර්ධනය සඳහා බෙහෙවින් ඉවහල් වන නිවැරදි අලෙවිකරණ දත්ත, තොරතුරු වාර්තා කාර්යක්ෂමව සැපයීම,නව වෙළඳපල සහ ගැණුම්කරුවන් සොයා ගැනීමට අදාළ සේවාවන් හා අනෙකුත් සේවාවන් කාර්යක්ෂමව ඉටු කිරීමෙහිලා අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය 2017 වසරේදී ද සුවිශේෂ කාර්යයක් ඉටු කරන ලදී.

### 2017 වර්ෂය තුළ ක්‍රියාත්මක සැලැස්මට අනුව ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යයන්

- පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා නව ජාත්‍යන්තර වෙළඳපල සහ ගැණුම්කරුවන් හඳුනාගැනීම මගින් පොල් කර්මාන්තයේ අපනයන ආදායම වර්ධනය කර ගැනීමේ අරමුණින් කොහු හා වගා මාධ්‍ය පිළිබඳව ජර්මනියේ එසෙන්ස්හි පැවති IPM ප්‍රදර්ශනය, ඩුබායිහි පැවති IPM උද්‍යාන වගා ප්‍රදර්ශනය, පොල් මද ආශ්‍රිතව එක්සත් රාජධානියේ පැවති IFE ප්‍රදර්ශනය, බ්‍රසීලයේ පැවති APAS ප්‍රදර්ශනය, ඕස්ට්‍රේලියාවේ පැවති Fine Food ප්‍රදර්ශනය, ජර්මනියේපැවති Food Ingredients ප්‍රදර්ශනය යනජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන සඳහා අපනයනකරුවන්ට/නිෂ්පාදකයින්ට අනුග්‍රාහකත්වය ලබාදෙමින් ඔවුන් සමඟ පොල් සංවර්ධන අධිකාරිය සහභාගී වීම.
- පොල් කර්මාන්ත ක්ෂේත්‍රය අධීක්ෂණය කිරීම සහ පහසුකම් සැපයීම - අපනයනකරුවන්, වෙළඳුන්, පොල් වතු හා අතරමැදියන් ලියාපදිංචි කිරීම
- පොල් හා තැඹිලි අපනයනය සඳහා අවසරපත් නිකුත් කිරීම හා තාවකාලික අපනයනයන් සඳහා අවසරපත් නිකුත් කිරීම
- පොල් ආශ්‍රිත අපනයන හා ආනයන අධීක්ෂණ කටයුතු
- වෙළඳ ආරවුල් නිරාකරණය කිරීම
- ගෙඩි පොල් හා කොප්පරා වෙන්දේසි පැවැත්වීම
- දිනපතා පොල් හා පොල් ආශ්‍රිත වෙළඳපල මිල ගණන් පුවත්පත් සඳහා ලබාදීම
- පොල් ආශ්‍රිත නිෂ්පාදන, අපනයන/ආනයන ප්‍රමාණ, වෙන්දේසි මිල ගණන්, ලෝක වෙළඳපලේ පොල් ආශ්‍රිත මිල ගණන් ඇතුළත් සති වාර්තා, මාසික වාර්තා සහ 2016වසර සඳහා ශ්‍රී ලංකා පොල් සංඛ්‍යාති වාර්තාව නිකුත් කිරීම.

- දැනට ජාත්‍යන්තරව වැඩි ඉල්ලුමක් තිබෙන පොල් ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳව දැනුවත් කිරීම, ඇසුරුම්කරණය, ප්‍රමිතිකරණය සහ අවශ්‍ය අනෙකුත් උපදෙස් ලබාදීමේ අරමුණින් වැඩසටහන් පැවැත්වීම.
- දේශීය අධ්‍යාපන හා වෙළඳ ප්‍රදර්ශන 17කට සහභාගීවීමෙන් පොල් ආශ්‍රිත කර්මාන්ත හා ඒවායේ වැදගත්කම පිළිබඳව මහජනතාව හා පාසැල් සිසුන් දැනුවත් කිරීම.අගය එකතු කළ පොල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය හා ඉහළ අපනයන ආදායමක් ලබා ගැනීම සඳහා දේශීය හා ජාත්‍යන්තර වෙළඳපල පිළිබඳව ව්‍යවසායකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, වාණිජ දෙපාර්තමේන්තුව, විදේශ කටයුතු අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සමඟ වෙළඳ ගිවිසුම් සඳහා සාකච්ඡාවලට සහභාගි වීම හා අවශ්‍ය තොරතුරු ලබා දීම.
- පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනකරුවන් සඳහා විදේශීය වෙළඳ විමසුම් ලබාදීම.
- ගෙඩි පොල් සඳහා ආදේශකයක් වන පොල් කිරි හා පොල් කිරි පිටි භාවිතය පිළිබඳව ජනතාව මාධ්‍ය මඟින් දැනුවත් කිරීම
- කළුතර හා කුරුණෑගල දිස්ත්‍රික්ක වල පොල් තෙල් නිෂ්පාදන කර්මාන්ත හඳුනාගැනීම, නිෂ්පාදන පිරිවැය ගණනය කිරිම සහ දැනට පවතින ගැටළු හඳුනාගැනීම සඳහා සමීක්ෂණ පැවැත්වීම.

**2017 වසර තුළ අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය මගින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් හා සේවාවන් සහ ඉන් ලබා ගත් ප්‍රගතිය පහත දැක්වේ.**

## 3.1 ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගි වීම

පොල් හා ඒ ආශ්‍රිත අගය එකතු කරන ලද නිෂ්පාදන අපනයනය කිරීමේදී නව ගැණුම්කරුවන් හා නව වෙළඳපල අත්පත් කර ගැනීම තුළින් පොල් කර්මාන්තයේ අපනයන ආදායම වර්ධනය කර ගැනීමේ අභිලාශයෙන් විදේශීය වෙළඳ ප්‍රදර්ශන වලට සහභාගී වීම සහ අපනයනකරුවන්/නිෂ්පාදකයින් සඳහා අනුග්‍රාහකත්වය ලබාදීම පොල් සංවර්ධන අධිකාරිය විසින් සෑම වසරකම සිදු කරනු ලබයි. එම රටවල තානාපති කාර්යාල හා සම්බන්ධ වෙමින් ශ්‍රී ලාංකික පොල් නිෂ්පාදන සඳහා නව ගැණුම්කරුවන් හඳුනා ගැනීම සඳහා පොල් සංවර්ධන අධිකාරිය ක්‍රියා කරන අතර, අදාළ රටවල වාණිජ මණ්ඩල හා සම්බන්ධ වෙමින් එකී අවස්ථා තවදුරටත් පුළුල් කර ගැනීමට මෙම වසරේදී හැකියාව ලැබුණි.

මෙවැනි ප්‍රදර්ශන සඳහා අපනයනකරුවන් / නිෂ්පාදකයින් සමඟ සහභාගි වීමෙන් විදේශීය ඇණවුම් වැඩි වශයෙන් ලබා ගැනීමටත්, පවතින වෙළඳ පොළ ආරක්ෂා කර ගැනීමටත්, නව ගැණුම්කරුවන් හඳුනා ගැනීමටත්, විදේශීය රටවල භාවිතාවන හා ඉදිරි වෙළඳපල අත්පත් කර ගන්නා තරඟකාරී භාණ්ඩයන් පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමටත්, ජාත්‍යන්තර ප්‍රමිතීන් හා ජාත්‍යන්තර ප්‍රජාව බලාපොරොත්තු වන මට්ටමේ නිෂ්පාදන සහ ඒවායේ ප්‍රමිතියමෙන්ම ගුණාත්මක භාවය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමටත් හැකියාව ලැබේ.මෙසේ ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන සඳහා

අපනයනකරුවන් සහභාගි කරවීමේදී ලබා ගන්නා නව ඇණවුම් මගින් පොල් කර්මාන්තයේ අපනයන ආදායම වර්ධනය කිරීමට මහඟු රුකුලක් වේ.

**2017 වසරේදී පහත සඳහන් ජාත්‍යන්තර ප්‍රදර්ශන සඳහා පොල් සංවර්ධන අධිකාරිය සහභාගී විය.**

i. පොල් කෙඳි ආශ්‍රිත අගය වැඩිකළ නිෂ්පාදනයන් වශයෙන් සැලකෙන වගාමළු, කොහු මල් පෝච්චි, මිහිසළු, බුරුසු, කොහු බත් කැට යන නිෂ්පාදන ඉලක්ක කර ගනිමින් උද්‍යාන සහ ගෙවතු අලංකරණය සඳහා වන ජර්මනියේ එසෙන්ස්හි පැවැත්වූ IPM -2017ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය සඳහා අපනයනකරුවන් පස්දෙනෙකු සහභාගී කරවූ අතර, එහිදී ලබා ගත් ඇණවුම් කීපයක් දැනටමත් අපනයනය කර ඇති අතර තවදුරටත් ඇණවුම් සඳහා අදාළ ද්විපාර්ශවික සාකච්ඡා මේ වන විටත් සිදු කරමින් හා අදාල භාණ්ඩවල මිල ගණන් හුවමාරු කර ගනිමින් පවතින බව සහභාගි වූ අපනයනකරුවන් විසින් පොල් සංවර්ධන අධිකාරිය වෙත වාර්තා කර ඇත.




**රූපය 21,22: ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන**

ii. ලන්ඩන් හි පවත්වන ලද ප්‍රදර්ශනයකට පොල් සංවර්ධන අධිකාරිය 2017 වසරේදී ප්‍රථම වරට සහභාගී විය. අපනයන/නිෂ්පාදන ආයතන 06ක් ආහාර හා පාන වර්ග පිළිබඳ වූ ife 2017 ප්‍රදර්ශනය සඳහා සහභාගී කරවූ අතර මෙම ප්‍රදර්ශනයට සහභාගී වීම තුළින් ලාංකීය පොල් නිෂ්පාදන අපනයන/නිෂ්පාදන ආයතන වෙත එක්සත් රාජධානියේ පොල් මද ආශ්‍රිත භාණ්ඩ ආනයන ආයතන සැලකිය යුතු ප්‍රමාණයක් සම්බන්ධ කරගැනීමට හැකියාව ලැබී ඇත. දැනටමත් ආයතන කීපයක්මගින් අපනයනයන් සිදුකර ඇති අතර ඉදිරියේදී තවත් ඇණවුම් ලබාගැනීමට හැකියාව ඇති බව ප්‍රදර්ශනය සඳහා සහභාගී වූ ආයතන විසින් දන්වා ඇත.

ඇමරිකා මහාද්වීපයට අයත් රටක් වන බ්‍රසීලයෙහි පොල් ආශ්‍රිත භාණ්ඩ සඳහා ඉල්ලුමක් පවතින නමුත් ශ්‍රී ලාංකීය අපනයනකරුවන් හට මෙතෙක් බ්‍රසීලයෙහි සිය භාණ්ඩ සඳහා අලෙවි ප්‍රවර්ධන කටයුතු කිරීමේ අවස්ථාවක් නොලැබුණි. එබැවින් බ්‍රසීලයේ සාවෝ පඕලෝ නගරයෙහි පැවැත්වූ APAS වෙළඳ ප්‍රදර්ශනය හරහා ලාංකීය පොල් මද ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමෙන් එම

භාණ්ඩ පිළිබඳ ගැණුම්කරුවන්/ පාරිභෝගිකයින් දැනුවත් කිරීමේ මහඟු අවස්ථාවක් උදාකරගැනීම සඳහා මෙම ප්‍රදර්ශනයට අපනයන/නිෂ්පාදන ආයතන 04ක් සඳහා අනුග්‍රාහකත්වය ලබාදීමට හැකියාව ලැබුණි.මෙම ප්‍රදර්ශනයට සහභාගී වු ආයතන දෙකක් එමගින් ලැබු ඇණවුම් සඳහා දැනටමත් සිය අපනයනයන් සිදු කර ඇති අතර ඉදිරියේදීත් මෙම අපනයනයන් සඳහා ඇණවුම් ලැබෙනු ඇතැයි විශ්වාසය පළකර ඇත.




iii. ශ්‍රී ලාංකිකයින් ඇතුළු ආසියාතිකයින් විශාල වශයෙන් ඕස්ට්‍රේලියාවේ ප්‍රාන්තයන්හි විසිරි ජීවත්වන බැවින් ශ්‍රී ලාංකීය පොල් මද ආශ්‍රිත නිෂ්පාදන සිඩ්නි නගරයේ පැවැත්වූ “FINE FOOD” ප්‍රදර්ශනය හරහා ප්‍රවර්ධනය කිරීමෙන් එම භාණ්ඩ පිළිබඳ ගැණුම්කරුවන් පාරිභෝගිකයින් දැනුවත් කිරීමේ මහඟු අවස්ථාවක් උදාකර ගැනීමේ හැකියාව පවතින බැවින් 2017 වසරේදී ප්‍රථම වරට මෙම ප්‍රදර්ශනය සඳහා අපනයන/නිෂ්පාදන ආයතන පහක් සහභාගී කරවීමට පොල් සංවර්ධන අධිකාරිය අනුග්‍රාහකත්වය දක්වන ලදී. එම ප්‍රදර්ශනයට සහභාගී වු අපනයන/නිෂ්පාදන ආයතන දන්වා සිටියේ ඔවුන්ට මෙම ප්‍රදර්ශනයට සහභාගී වීම තුළින් සැලකිය යුතු වෙළඳ විමසුම් ප්‍රමාණයක් ලැබී ඇති බවත් දැනට පවතින ඉහළ පොල් මිල හේතුවෙන් ඔවුන්ට මෙම ලැබී ඇති ඇණවුම් සම්පුර්ණ කරගැනීමට අවකාශ දැනට නොමැති බවත්ය.

iv. තැඹිලි අපනයන සඳහා ලැබී ඇති ඇණවුම් දැනට ක්‍රියාත්මක කර ඇති බවද දන්වා ඇත. පොල් මිලෙහි තරමක අඩුවීමක් ඇති වු විට ලැබී ඇති ඇණවුම් සඳහා අපනයනයන් සිදු කිරීමට හැකියාව පවතින බවද එම ආයතන දන්වා ඇත.







**රූපය 23,24 ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන**

v. FI – Europe 2017 ප්‍රදර්ශනය වසර දෙකකට වරක් පවත්වන ප්‍රදර්ශනයක් වන අතර 2017 වසරේදී මෙම ප්‍රදර්ශනය ජර්මනියේ ෆ්‍රැන්ක්ෆර්ට් නගරයේදී පවත්වන ලදී. මෙම ප්‍රදර්ශනය




**රූපය ,25:** FI – Europe 2017 ප්‍රදර්ශනය

සඳහා ආයතන පහක් සහභාගී කරවූ අතර සැලකිය යුතු ඇණවුම් ප්‍රමාණයක් ලැබී ඇති බව ප්‍රදර්ශනයට සහභාගී වූ අපනයන/නිෂ්පාදන ආයතන විසින් දැනුම් දෙන ලදී.

vi. උද්‍යාන හා ගෙවතු අලංකරණය සඳහා පැවති IPM - DUBAI, 2017වෙළඳ ප්‍රදර්ශනය සඳහා අපනයනකරුවන් පස්දෙනෙකුසමඟ පොල් සංවර්ධන අධිකාරිය දෙවනවරට සහභාගි විය. විශේෂයෙන් මැද පෙරදිග කලාපයේ ගැණුම්කරුවන් මේ සඳහා සහභාගි වූ අතර, සහභාගි වූ ශ්‍රී ලාංකික අපනයනකරුවන්සමඟ නව ගැණුම්කරුවන් මෙන්ම දැනට ශ්‍රී ලංකාවෙන් පොල් ආශ්‍රිත භාණ්ඩ අපනයනය කරන ගැණුම්කරුවන්ද සාකච්ඡා පැවැත්වූ අතර, ඉදිරියේදී එම වෙළඳ විමසුම් සඳහා ඇණවුම් ලැබෙනු ඇති බවට විශ්වාසය පළකර ඇත.

## 3.2 නිෂ්පාදකයින් හා අනාගත ගැණුම්කරුවන්ගේ ජාලයක් ඇති කිරීම

පොල් සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවිය ප්‍රතිනිර්මාණය කිරීම ආරම්භ කර ඇති අතර එමඟින් මෙම කාර්යය ඉටුකරගැනිමට හැකියාව ලැබේ.

### 3.2.1 පොල් හා පොල් ආශ්‍රිත නිමි භාණ්ඩ අලෙවිකරණ සම්බන්ධ සියල්ලන් හා පොල් වතු ලියාපදිංචිය

පොල් කර්මාන්ත ක්ෂේත්‍රයෙහි අපනයනයන්හි නියැලෙන අපනයනකරුවන්ගේ ලියාපදිංචිය සහ පොල් වතු ලියාපදිංචිය 2016 වසරට සාපේක්ෂව 2017 වසරේදී පිළිවෙලින් 6% ක සහ 3% ක පමණ සුළු පසුබෑමක් පෙන්නුම් කළ අතර වෙළඳුන්ගේ ලියාපදිංචිය 58% ක පමණ ඉහළ යාමක් පෙන්නුම් කරන ලදී. මෙයට බලපෑ ප්‍රධාන හේතුව වූයේ වෙළඳපල තුළ ඇතිවූ දැඩි පොල් හිඟයයි.

**ලියාපදිංචි කටයුතු - 2016/2017**

| ලියාපදිංචි කිරීම් | 2016 | 2017 |
|---|---|---|
| අපනයන කරුවන් | 590 | 553 |
| බ්‍රෝකර්වරුන් | 14 | 16 |
| වෙළඳුන් | 55 | 88 |
| පොල් වතු | 265 | 257 |

වගුව 21: **ලියාපදිංචි කටයුතු**

## 3.3 පොල් හා කොප්පරා වෙන්දේසි පැවැත්වීම

### 3.3.1 කොළඹ ගෙඩි පොල් වෙන්දේසිය

පොල් වගාකරුවන් හට ඔවුන්ගේ පොල් තොග සාධාරණ මිලට අලෙවි කර ගැනීමේ හා උසස් තත්ත්වයේ පොල් තොග ගැණුම්කරුවන් හට සාධාරණ මිලකට ලබාදීමේ අරමුණින් 1994 වසරේ සිට පුරා වසර 23ක් මෙහෙයවනු ලැබූ ගෙඩි පොල් වෙන්දේසිය 2017 වසරේදීද අඛණ්ඩව පවත්වන ලද අතර, ඒ යටතේ 2017 වසරේදී කොළඹ පොල් වෙන්දේසි 49ක් පැවැත්වීමට අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශයට හැකි විය.

වගාකරුවා හා ගැණුම්කරුවා යන දෙපාර්ශවයටම අවාසියක් නොවන ආකාරයට පොල් වෙන්දේසියතුළින් නිරන්තරයෙන් මිල ගණන් තීරණයවන තත්ත්වයක් තුළ රටේ සමස්ත පොල් මිල තීරණය කරන තීරක සාධකය කොළඹ පොල් වෙන්දේසිය බවට පත්ව ඇත.

2017 වසරේදී වෙන්දේසිය සඳහා පොල් ගෙඩි 47,212,509 ක ප්‍රමාණයක් ඉදිරිපත් කර තිබුණි.

| වර්ෂය | ගෙඩි ප්‍රමාණය | | සාමාන්‍ය මිල රු. (ගෙඩි 1000 කට) |
|---|---|---|---|
| | ඉදිරිපත් කළ ප්‍රමාණය | විකුණූ ප්‍රමාණය | |
| 2016 | 87,379,350 | 52,038,756 | 27,264.31 |
| 2017 | 47,212,509 | 33,319,412 | 48,621.62 |

වගුව 22: කොළඹ පොල් වෙන්දේසිය 2016/2017

2016 හා 2017 වසරේ රට තුළ පැවති දැඩි නියඟය හේතුවෙන් 2016 වසරට සාපේක්ෂව 2017 වසරේ පොල් ඵලදාවේ 19%කඅඩුවීමක් දක්නට ලැබුණි. එබැවින් 2017 වසරේදී කොළඹගෙඩි පොල් වෙන්දේසිය සඳහාද ඉදිරිපත් කළ පොල් ගෙඩි ප්‍රමාණය 2016 වසරට සාපේක්ෂව 46%ක අඩුවීමක් දක්නට ලැබුණි.

### 3.3.2. ප්‍රාදේශීය ගෙඩි පොල් වෙන්දේසිය

2017 වසරේදීද මසකට වරක් බැගින් අවස්ථා 12කදී කුලියාපිටිය ප්‍රාදේශීය පොල් වෙන්දේසිය පවත්වන ලද අතර කුඩා හා මධ්‍යමපරිමාණයේ පොල් වගාකරුවන්ට ඔවුන්ගේ පොල් තොග සඳහා සාධාරණ මිලක් ලබා ගැනීමට හැකිවන පරිදි වෙන්දේසිය ක්‍රියාත්මක කරනු ලබන අතර එහි ප්‍රගතිය පහත දැක්වේ.

| වර්ෂය | ගෙඩි ප්‍රමාණය | | සාමාන්‍ය මිල රු. (ගෙඩි 1000 කට) |
|---|---|---|---|
| | ඉදිරිපත් කළ ප්‍රමාණය | විකුණූ ප්‍රමාණය | |
| 2016 | 3,345,936 | 2,519,009 | 27,754.00 |
| 2017 | 1,604,274 | 1,208,234 | 49,165.68 |

වගුව 23. ප්‍රාදේශීය ගෙඩි පොල් වෙන්දේසිය

2016වසරට සාපේක්ෂව 2017 වසරේදී කුලියාපිටිය ප්‍රාදේශීය පොල් වෙන්දේසිය සඳහා ඉදිරිපත් වූ පොල් ගෙඩි ප්‍රමාණයේ 52% ක පහත වැටීමක් දක්නට ලැබුණි.

### 3.3.3 කොප්පරා වෙන්දේසිය

2017 වසරේදී අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය විසින් කොප්පරා වෙන්දේසි 28 ක් පවත්වන ලද අතර 2016 වසරට සාපේක්ෂව 2017 වසරේදී කොප්පරා වෙන්දේසිය සඳහා ඉදිරිපත් වූ කොප්පරා ප්‍රමාණයේ 8% ක පමණ වැඩිවීමක් දක්නට ලැබුණි.

| වර්ෂය | ඉදිරිපත් කළ ප්‍රමාණය (කි.ග්‍රෑ.) | විකුණූ ප්‍රමාණය (කි.ග්‍රෑ.) | සාමාන්‍ය මිල ගණන් (රු.කි.ග්‍රෑ 250 පාරමක් සඳහා) | |
|---|---|---|---|---|
| | | | විශිෂ්ඨ අංක 1 | විශිෂ්ඨ අංක 2 සහ 3 |
| 2016 | 211,394 | 209,666 | 38,088 | 37,060 |
| 2017 | 228,954 | 225,373 | 55,953 | 54,768 |

වගුව 24. කොප්පරා වෙන්දේසිය 2016/2017

### 3.3.4 වෙළඳ ආරවුල් සම්බන්ධ කටයුතු

පොල් වෙන්දේසියේදී හා කොප්පරා වෙන්දේසියේදී අලෙවිකරුවන් හා ගැණුම්කරුවන් අතර ඇතිවන යම් යම් වෙළඳ ආරවුල් සමථයකට පත්කිරීම සඳහා මැදිහත්කරු ලෙස 2017 වසරේදීද අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය සුවිශේෂී කාර්යය භාරයක් ඉටු කළ අතර පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයන හා නැවත ආනයනය කරන අවස්ථාවලදී ඇති වූ වෙළඳ ආරවුල් නිරාකරණය කිරීම සඳහා ද අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය වැඩි දායකත්වයක් ලබා දෙන ලදී.

## 3.4 පෞද්ගලික අංශයේ සහභාගීත්වයෙන් අලෙවි මාර්ග සංවිධානය කිරිම

### 3.4.1 දේශීය වෙළඳ ප්‍රදර්ශන

පොල් ආශ්‍රිත කර්මාන්ත හා එමගින් නිපදවන විවිධ නිෂ්පාදන, ඒවායේ වැදගත්කම හා පොල් සංවර්ධන අධිකාරියේ කාර්ය භාරයන් පිළිබඳව මහජනතාව හා පාසැල් සිසුන් දැනුවත් කිරීමේ අරමුණින් දිවයින පුරා පැවති වෙළඳ, කෘෂිකර්ම හා අධ්‍යාපන ප්‍රදර්ශන 17 කට 2017 වසරේදී අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය සහභාගි වූ අතර එහිදී ප්‍රදර්ශන නැරඹීමට පැමිණි මහජනතාව හා පාසැල් සිසුන් පොල් ආශ්‍රිත කර්මාන්ත, දේශීය හා විදේශීය වෙළඳපළ පිළිබඳව දැනුවත් කරන ලදී.






රූපය 26,27, -දේශීය වෙළඳ ප්‍රදර්ශන:

පහත දැක්වෙන දේශීය ප්‍රදර්ශන සඳහා අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය සහභාගි විය.

| ප්‍රදර්ශනයේ නම | ස්ථානය | සංවිධානය |
|---|---|---|
| යාපනය ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය | යාපනය නගර සභා ක්‍රීඩාංගණය | ශ්‍රී ලංකා ප්‍රදර්ශන හා සම්මේලන මධ්‍යස්ථානය |
| නාගරික පුනර්ජීවන අලුත් අවුරුදු පොළ | බත්තරමුල්ල සෙත්සිරිපාය පරිශ්‍රය | මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය |
| යොවුන්පුරය අධ්‍යාපන, වෘත්තිය හා වෙළඳ ප්‍රදර්ශනය | ත්‍රිකුණාමලය මැක්හෙයිසර් ක්‍රීඩාංගණය | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය |
| තිරසර යුගයක හරිත උද්‍යානය | සිරිමාවෝ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |
| වැවිලි සවිය ගමින් ගමට | සේරුවාවිල | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |
| Agro Royal අධ්‍යාපනික හා වෙළඳ ප්‍රදර්ශනය | කොළඹ රාජකීය විද්‍යාලය | රාජකීය විද්‍යාලයීය කෘෂි විද්‍යා සංගමය |

| | | |
|---|---|---|
| මහනුවර පුෂ්පදාන බාලිකා විද්‍යාලයීය 75 වන සංවත්සර සැමරුම්අධ්‍යාපනික ප්‍රදර්ශනය | මහනුවර පුෂ්පදාන බාලිකා විද්‍යාලය | මහනුවර පුෂ්පදාන බාලිකා විද්‍යාලය |
| **ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයට වසර 150 ක් සපිරීම නිමිත්තෙන් පැවැත්වූ ප්‍රදර්ශන මාලාව** | **බදුල්ල විල්ස් පාර්ක් ක්‍රීඩාංගණය<br>යටියන්තොට වින්සන්ට් පෙරේරා ක්‍රීඩාංගණය<br>කොත්මලේ ගාමිණී දිසානායක ක්‍රීඩාංගණය** | **ශ්‍රී ලංකා තේ මණ්ඩලය** |
| විවෘත ආර්ථිකයේ 40 වන සංවත්සර සැමරුම | මහරගම ජාතික තරුණ සේවා සභාව | අග්‍රාමාත්‍ය කාර්යාලය |
| ප්‍රෝෆුඩ් ප්‍රෝපැක් හා ඇග්බිස් | සිරිමාවෝ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව | ශ්‍රී ලංකා ප්‍රදර්ශන හා සම්මේලන මධ්‍යස්ථානය |
| CRT වෙළඳ ප්‍රදර්ශනය - 2017 | සිරිමාවෝ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |

| **ප්‍රදර්ශනයේ නම** | **ස්ථානය** | **සංවිධානය** |
|---|---|---|
| වැවිලි සවිය ගමින් ගමට | කුලියාපිටිය | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |
| ත්‍රිකුණාමලය ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය | ත්‍රිකුණාමලය මැක්හෙයිසර් ක්‍රීඩාංගණය | ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය |
| ජාතික ආහාර නිෂ්පාදන සංග්‍රාමය | මහියංගනය - රිදීමාලියද්ද | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |
| කොළඹ ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය - 2017 | ශ්‍රී ලංකා ප්‍රදර්ශන හා සම්මේලන මධ්‍යස්ථානය | ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය |

වගුව 25,26,27- දේශීය ප්‍රදර්ශන සඳහා අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය සහභාගී වීම

### 3.4.2 ප්‍රදර්ශනාත්මක වැඩසටහන් පැවැත්වීම

2017 වසරේදිද අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය සහභාගී වූ දේශීය ප්‍රදර්ශන වලට සමගාමීව, පරිභෝජනයේදී සිදුවන පොල් නාස්තිය අවම කිරීමේ අරමුණෙන් පොල් මද ආශ්‍රිත නිෂ්පාදනයන්ගෙන් සකසා ගන්නා ආහාර පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ ප්‍රදර්ශනාත්මක වැඩසටහන් (Demonstrations) පැවැත්වීම සිදුකරන ලදී.

ඊට අමතරව ජාතික ආහාර නිෂ්පාදන සංග්‍රාම ආරම්භක සතිය - 2017 ට සමගාමීව ඉසුරුපාය, සෙත්සිරිපාය, සුහුරුපාය හා කටුනායක නිදහස් වෙළඳ කලාප පරිශ්‍ර තුළද මෙවැනි වැඩසටහන් පැවැත්වීම සිදුකරන ලද අතර මෙම වැඩසටහන් සඳහා නෙස්ලේ ලංකා සමාගම, රේණුකා ඇග්‍රි ෆුඩ්ස් ආයතනය, සිලෝන් බිස්කට්ස් සමාගම වැනි පෞද්ගලික ව්‍යවසායකයින්ගේ සහයද ලබා ගන්නා ලදී.

## 3.5 දේශීය හා විදේශීය පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන භාවිතයන් හඳුනාගැනීම සඳහා අලෙවි සමීක්ෂණ පැවැත්වීම

2017 වසරේදී අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය විසින් කළුතර හා කුරුණෑගල දිස්ත්‍රික්කයන්හි පොල් තෙල් නිෂ්පාදකයන් හා අලෙවිකරුවන් හඳුනා ගැනීම සඳහා සමීක්ෂණ සිදු කරන ලදී. මෙම සමීක්ෂණය තුළින් පහත අරමුණු ඉටුකර ගැනීමට අපේක්ෂා කරන ලදී.

- දේශීය පොල් තෙල් නිෂ්පාදනය ගණනය කිරීම සඳහා කළුතර හා කුරුණෑගල දිස්ත්‍රික්කයන්හි පොල් තෙල් නිෂ්පාදන ආයතනවල නිවැරදි දත්ත හා තොරතුරු ලබා ගැනීම.
- පොල් තෙල් නිෂ්පාදකයන් හා අලෙවිකරුවන් මුහුණදෙන ගැටළු පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම හා පොල් තෙල් කර්මාන්තයේ නිෂ්පාදන පිරිවැය හඳුනා ගැනීම.

## 3.6 පොල් හා පොල් ආශ්‍රිත භාණ්ඩ පිළිබඳ නිෂ්පාදනයන්, වෙළඳාම සහ අපනයන සඳහා තොරතුරු සන්නිවේදනය කිරීම

පොල් හා ඒ ආශ්‍රිත කර්මාන්තකරුවන්ට මෙන්ම අපනයනකරුවන්ට සිය නිෂ්පාදන සඳහා මිල ගණන් තීරණය කිරීමේදී අදාළ නිවැරදි වෙළඳ තොරතුරු හා දත්ත ලබා ගෙන නිවැරදි විශ්ලේෂණයක් තුළින් සිය කර්මාන්ත හා වෙළඳ රටාව තීරණය කිරීම සඳහාත්,ඔවුන්ගේ තීරණ ගැනීමේ හැකියාව පහසු කරලීම සඳහාත් 2017 වසරේදීද අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශයේ තොරතුරු සේවාව පහත දක්වා ඇති ක්‍රියාවලීන් තුළින් විශේෂ කාර්යයභාරයක් ඉටුකරන ලදී.

- පොල් කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන තොරතුරු, අපනයන සහ ආනයන තොරතුරු හා දත්ත ලබා ගෙන අදාළ පාර්ශවකරුවන් වෙත බෙදා හැරීම

- පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදනවල දෛනික මිල ගණන් ලබා ගනිමින් ඉංග්‍රීසි සහ සිංහල මාධ්‍යයෙන් දිනපතා පුවත්පත් මඟින් 2017 වසරේදීද ප්‍රකාශයට පත් කිරීම.




- ප්‍රකාශන 49 කින් සමන්විත "Coco Market Focus" සති වාර්තා ප්‍රකාශනය 2017 වසරේදීද ප්‍රකාශයට පත් කළ අතර, එහි පොල් හා කොප්පරා වෙන්දේසි මිල ගණන්,දේශීය පොල් ආශ්‍රිත භාණ්ඩ

සඳහා වන ගොවිපල මිල ගණන්, තොග මිල ගණන් හා ජාත්‍යන්තර මිල ගණන් ඇතුළත් විය.

- ප්‍රකාශන 12 කින් සමන්විත "Coco Market Focus" මාසික සඟරාව 2017 වසර තුළදීද ප්‍රකාශයට පත් කරන ලදී.
  සියලුම පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්ගේ අපනය ප්‍රමාණයන්, මිලගණන්, අපනයනය කරන ලබනු රටවල් ස ආනයනය කරනු ලබන බාද්‍ය තෙල්, පොල් තෙල්, සක්‍රීය කාබ ආදී නිෂ්පාදනයන්හී ආනයන ප්‍රමාණයන් හා මිලගණන් ඒවා ඇතුළත් වූ අතර, පොල් කර්මාන්ත ක්ෂේත්‍රයේ හා අපනය ක්ෂේත්‍රයේ නියැලි පාර්ශවකරුවන් සඳහා මෙම ප්‍රකාශය සිය වෙළඳ තීරණ ගැනීම සඳහා බෙහෙවින් ඉවහල් විය.




- පොල් හා ඒ ආශ්‍රිත සියලුම අපනයන හා ආනයන ආශ්‍රිත මිල ගණන්, අපනයනය කරනු ලබන රටවල්, ලාංකීය පොල් එලදාව, ආසියා ශාන්තිකර පොල් ප්‍රජාව නියෝජනය කරනු ලබන රටවල්හී පොල් එලදා දත්ත, නිෂ්පාදන හා අපනයන තොරතුරු, පොල් වෙන්දේසිය හා සම්බන්ධ පාර්ශවකරුවන්ගේ තොරතුරු, අපනයනකරුවන්ගේ තොරතුරු ඇතුළත් අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය මගින් ප්‍රකාශයට පත් කරන Sri Lanka Coconut Statistics-2016 ප්‍රකාශනය 2017 වසරේදී නිකුත් කළ අතර මෙම ප්‍රකාශනය දේශීය හා විදේශීය වශයෙන් ඉහළ ඉල්ලුමක් ඇති පොල් කර්මාන්තය හා අපනයන ක්ෂේත්‍රයේ දත්ත, තොරතුරු හා විස්තර ඇතුළත් පරිපූර්ණ වාර්ෂික ප්‍රකාශනයකි.




- **වර්තමාන හා අපේක්ෂිත පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදනයන් පිළිබඳ තොරතුරු විධිමත්ව රැස්කිරීම, සටහන් කිරීම හා ප්‍රචාරණය කිරීම**
  දේශීය හා විදේශීය වශයෙන් පොල් හා ඒ ආශ්‍රිත කර්මාන්ත ආශ්‍රිතව මිල ගණන් මත තීරණ ගැනීම සඳහා පහත සඳහන් ආයතන වෙත අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය 2017 වසරේදී දත්ත ලබා දීම සිදු කරන ලදී.
  - ශ්‍රී ලංකා මහ බැංකුව
  - ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
  - අපනයන සංවර්ධන මණ්ඩලය
  - කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සහ අනෙකුත් රාජ්‍ය, අර්ධ රාජ්‍ය ආයතන
  - එමෙන්ම, ආසියානු පැසිපික් පොල් ප්‍රජාව, විදේශ සඟරා (Cocommunity, Oil World, UCAP, Indian Coconut Journal) ආදී විදේශීය ආයතන හා සම්බන්ධ වෙමින් ලබා

ගන්නා තොරතුරු හා දත්ත නිරන්තරයෙන් ලාංකීය පොල් ප්‍රජාවට ලබා දීමෙන් විශේෂ කාර්යයභාරයක් 2017 වසරේදීද අලෙවි සංවර්ධන හා පර්යේෂණ අංශය විසින් ඉටු කරන ලදී.

### 3.6.1 පොල් කර්මාන්තයේ අපනයන ආදායම

පොල් හා පොල් ආශ්‍රිත කර්මාන්තයේ අපනයන ආදායම (2007- 2017)

| වසර | වටිනාකම | |
|---|---|---|
| | (රු. මිලියන) | (ඇ. ඩො. මිලියන) |
| 2007 | 24,097 | 217.83 |
| 2008 | 28,094 | 259.33 |
| 2009 | 29,081 | 253.00 |
| 2010 | 32,433 | 286.86 |
| 2011 | 47,306 | 427.85 |
| 2012 | 46,667 | 365.72 |
| 2013 | 47,952 | 371.40 |
| 2014 | 72,880 | 558.21 |
| 2015 | 75,259 | 553.63 |
| 2016 | 84,702 | 581.74 |
| 2017 | 91,198 | 598.19 |

වගුව 28- පොල් හා පොල් ආශ්‍රිත කර්මාන්තයේ අපනයන ආදායම




**රූපය 30: අපනයන ආදායම**

පොල් කර්මාන්ත ඉතිහාසයේ පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීමෙන් මෙතෙක් ලබා ඇති ඉහළම වාර්තාගත අපනයන ආදායම 2017 වසරේදී ලබා ගත් අතර, එය රුපියල් බිලියන 91 ක් වූ අතර, එය 2016 වසරට සාපේක්ෂව 8% ක වර්ධනයකි.

2017 වසරේදී පොල් මද ආශ්‍රිත නිෂ්පාදිතයන්හී අපනයන ආදායමේ 3% ක වර්ධනයක් පෙන්වූ අතර, පොල් කෙඳි ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදනයන්හී අපනයන ආදායමේ 13% ක වර්ධනයක් වාර්තා කර ඇත.

එමෙන්ම, පොල් කටු ආශ්‍රිත නිෂ්පාදිතයන්හී අපනයන ආදායම 18% ක වර්ධනයක් ද අමුද්‍රව්‍ය ස්වරූපයේ කොහු අපනයනයන්හී ආදායමේ 2% ක වර්ධනයන් ද පෙන්නුම් කළ අතර, 2018 වසරේ පොල් හා පොල් ආශ්‍රිත කර්මාන්තයෙහි අපනයන ආදායම රු. බිලියන 105 ඉක්මවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 3.7 නව නිෂ්පාදන, අගය එකතු කිරීම්, වෙළඳපල ප්‍රවර්ධනය හඳුන්වාදීම සහ වෙළඳපල ප්‍රවිෂ්ඨය වැඩිකිරීම

**3.7.1** පසුගිය වසර කිහිපයට සාපේක්ෂව 2017 වසරේදීද නව ගැණුම්කරුවන් හඳුනා ගැනීම හේතුවෙන් තැඹිලි අපනයනයේ පැහැදිලි වර්ධනයක් දැකිය හැකි විය. එමෙන්ම 2016 වසරට සාපේක්ෂව 2017 වසරේ පොල් ක්‍රීම් හා පොල් පිටි අපනයනයේ සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කර ඇති අතර පොල් වතුර හා පොල් බටර් අපනයනයේද වර්ධනයක් දක්නට ඇත. 2018 වසරේද මෙම නිෂ්පාදනයන්ගේ ඉහළ ඉල්ලුමක් ජාත්‍යන්තර වෙළඳපලෙන් අපේක්ෂා කෙරේ.

**3.7.2** පොල් සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවිය මගින් වඩාත් විධිමත් ලෙස දත්ත හුවමාරු කර ගැනීමේ කටයුතු 2017 වසරේදීද සිදු කරන ලදී.

**3.7.3** අගය එකතු කළ පොල් මද ආශ්‍රිත නිෂ්පාදන හා පරිසර හිතකාමී පොල් ආශ්‍රිත නිෂ්පාදන භාවිතය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ අරමුණින් මුද්‍රිත මාධ්‍ය ඔස්සේ ප්‍රවර්ධන සේවාවන් 2017 වසරේදීද සිදු කරන ලදී.

## 3.8 අලෙවි සංවර්ධන සහාය සේවා

- නිෂ්පාදන / වෙළඳපොලවල් හා විවිධ සේවාවන් පිළිබඳව උපදේශක සේවාවන් ලබාදීම,දේශීය හා ජාත්‍යන්තර වෙළඳ ඇණවුම් පිළිබඳ තොරතුරු කර්මාන්තකරුවන්ට/ අපනයනකරුවන්ට/ගැණුම්කරුවන්ට ලබා දීම.

  පොල් කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ නිෂ්පාදනයන් සඳහා පුරෝකථනයන් සැකසීම, වෙළඳ ප්‍රතිපත්ති සැකසීම සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට සහාය වීම.

# පොල් නිෂ්පාදිත අපනයන - 2016/2017

**සංසන්දනාත්මක සංඛ්‍යා ලේඛන**

| නිෂ්පාදන වර්ගය | ප්‍රමාණය (මෙ.ටො.) | | | වටිනාකම (රු.මිලියන) | | |
|---|---|---|---|---|---|---|
| | **2016** | **2017** | % වෙනස | **2016** | **2017** | % වෙනස |
| **1. පොල් මද නිෂ්පාදිතයන්** | | | | | | |
| 1) පොල් තෙල් | 7,094 | 6,310 | -11 | 3,797.86 | 3,815.56 | 0.5 |
| 2) නැවුම් පොල් තෙල් | 15,585 | 13,816 | -11 | 9,891.86 | 10,590.29 | 7 |
| 3) දිසිදි පොල් | 49,206 | 29,418 | -40 | 15,384.67 | 13,537.64 | -12 |
| 4) කොප්පරා | 1,184 | 501 | -58 | 250.93 | 171.45 | -32 |
| 5) ගෙඩිපොල් (1000 ගෙඩි) | 30,433 | 10,232 | - | 2,158.82 | 831.94 | - |
| 6) තැඹිලි (ගෙඩි) | 4,057,002 | 5,155,971 | 27 | 439.24 | 459.70 | 5 |
| 7) පුන්නක්කු | 16,851 | 3,503 | -79 | 670.43 | 143.34 | -79 |
| 8) ඔයිල් කේක් | 271 | 303 | 12 | 18.11 | 66.17 | 265 |
| 9) පොල් කිරම | 3,652 | 6,446 | 77 | 1,375.35 | 2,760.28 | 101 |
| 10) පොල් කිරි | 30,497 | 32,867 | 8 | 6,451.75 | 8,227.86 | 28 |
| 11) පොල් කිරිපිටි | 6,793 | 6,234 | -8 | 4,165.13 | 4,723.15 | 13 |
| 12) මේදය ඉවත් කළ පොල් | 5,730 | 5,652 | -1 | 1,029.52 | 1,281.85 | 25 |
| 13) පොල් වතුර | 3,078 | 3,945 | 28 | 409.76 | 686.26 | 67 |
| 14) පොල් අරක්කු (ලීටර්) | 25,680 | 36,128 | 41 | 15.65 | 21.94 | 40 |
| 15) විනාකිරි (ලීටර්) | 50,892 | 41,534 | -18 | 16.14 | 10.92 | -32 |
| 16) ෆැටි ඇසිඩ් | 125 | 101 | -19 | 15.23 | 15.94 | 5 |
| 17) පොල් බටර් | 51 | 67 | 31 | 32.51 | 42.97 | 32 |
| 18) පොල් පිටි | 722 | 1,180 | 63 | 96.28 | 227.66 | 136 |
| ***උප එකතුව - පොල් මද නිෂ්පාදිතයන්*** | | | | **46,219.24** | **47,614.91** | **3** |
| **2. කෙඳි නිෂ්පාදිතයන්** | | | | | | |
| 19) ගුදිරිකෙඳි | 18,647 | 16,836 | -10 | 936.73 | 898.57 | -4 |
| 20) බ්‍රිස්ටල් කෙඳි | 15,525 | 24,068 | 55 | 770.72 | 1,221.93 | 59 |
| 21) අඹරන ලද කෙඳි | 60,698 | 53,933 | -11 | 2,770.94 | 2,439.58 | -12 |
| ***උප එකතුව - කෙඳි නිෂ්පාදිතයන්*** | **94,870** | **94,837** | **-0.03** | **4,478.39** | **4,560.08** | **2** |
| **3. පොල් කටු නිෂ්පාදිතයන්** | | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 22) පොල් කටුඅඟුරු | 5,142 | 9,254 | 80 | 380.02 | 705.85 | 86 |
| 23) පොල් කටු හා පොල් කටු කුඩු | 418 | 320 | -24 | 24.18 | 24.98 | 3 |
| 24) සක්‍රීය කාබන් | 34,987 | 39,591 | 13 | 10,352.99 | 11,962.12 | 16 |
| **උප එකතුව -පොල් කටුනිෂ්පාදිතයන්** | **40,547** | **49,165** | **21** | **10,757.19** | **12,692.96** | **18** |
| **4. නිමි භාණ්ඩ නිෂ්පාදිතයන් (කොහු කෙඳි ආශ්‍රිත)** | | | | | | |
| 25) කොහු ලණු | 1,169 | 1,729 | 48 | 141.23 | 170.02 | 20 |
| 26) කොහු කඹ | 7,349 | 8,480 | 15 | 1,171.78 | 1,277.00 | 9 |
| 27) තවාෂි බුරුසු (සංඛ්‍යාව) | 25,206,957 | 21,835,274 | -13 | 600.21 | 555.24 | -7 |
| 28) කොසු හා බුරුසු (සංඛ්‍යාව) (තවාෂි බුරුසු හැර) | 23,754,924 | 25,602,409 | 8 | 3,164.95 | 4,101.12 | 30 |
| 29) රබර්මිශ්‍ර කොහු පැඩ් හා ඇඳන් මෙට්ට (සංඛ්‍යාව) | 247,234 | 532,037 | 115 | 152.16 | 170.27 | 12 |
| 30) කොහු ලණු පැදුරු හා බුමුතුරුණු (වර්ගමීටර්) | 475,777 | 281,290 | -41 | 504.04 | 285.70 | -43 |
| 31) කොහුකලාල (වර්ගමීටර්) | 16,832 | 656 | -96 | 13.02 | 1.60 | -88 |
| 32) කොහුබත් | 186,820 | 202,720 | 9 | 9,407.48 | 10,776.88 | 15 |
| 33) පොල්ලෙලි කැබලි | 21,471 | 19,080 | -11 | 1,467.45 | 1,367.05 | -7 |
| 34) මිහිසළු | 3,865 | 4,544 | 18 | 644.08 | 723.84 | 12 |
| 35) උද්‍යාන වගා සඳහා යොදා ගන්නා කොහු නිෂ්පාදිතයන් | 69,412 | 75,619 | 9 | 5,779.18 | 6,591.03 | 14 |
| **උප එකතුව - කොහු ආශ්‍රිත නිමි භාණ්ඩ නිෂ්පාදිතයන්** | | | | **23,045.58** | **26,019.75** | **13** |
| **5. වෙනත් නිෂ්පාදිතයන්** | | | | | | |
| 36) පොල් ඉරටු | 6,136 | 7,939 | 29 | 201.34 | 310.37 | 54 |
| 37) පොල් ලී | - | 0.081 | - | - | 0.064 | - |
| **උප එකතුව - වෙනත් නිෂ්පාදිතයන්** | **6,136** | **7,939** | **29** | **201.34** | **310.43** | **54** |
| **මුළු අපනයන ආදායම** | | | | **84,701.74** | **91,198.13** | **8** |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව*

වගුව 29: පොල් නිෂ්පාදිත අපනයන - 2016/2017

**සටහන -** 2017 වසරේ ගෙඩි පොල් අපනයනය කිරීම ජුනි මස දක්වා පමණක් සිදුවි

# 4.පරිපාලන අංශය

පරිපාලන අංශයේ මූලික පරමාර්ථය වනුයේ ආයතනයේ සියලු අංශයන් සඳහා සහාය සේවාවන් ලබාදීම හා පහසුකම් සැපයීම, අධිකාරියේ මනා පැවැත්ම හා ප්‍රවර්ධනය වෙනුවෙන් අදාළ වන සියලුම ආයතනික කටයුතු, මානව සම්පත් සංවර්ධනය හා පරිපාලන කටයුතු මෙහෙයවීම ද එමඟින් ආයතනයේ අනෙකුත් ක්‍රියාකාරී අංශවලට ස්වකීය කාර්යයභාරය ඉටු කිරීමේදී සහාය වීම මෙන්ම සමස්ත ආයතනයේ සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක වීමයි.

## 4.1 සේවක සංඛ්‍යාව

මෙම අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 259 කි. 2017 වර්ෂයේදී සේවයේ යෙදී සිටි සේවක සංඛ්‍යාව 221 වූ අතර එම සේවක සංඛ්‍යාව 32 දෙනෙකු කළමනාකරණ මට්ටමේ අය වූහ. සේවක සංඛ්‍යාව පහත සේවා ගණයන්ගෙන් සමන්විත විය.

1. ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණය
2. කළමනාකාර සේවා ගණය
3. කනිෂ්ඨ කළමනාකාර සේවා ගණය
4. ආශ්‍රිත නිලධාරී සේවා ගණය
5. කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණය
6. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන ) සේවා ගණය
7. ප්‍රාථමික ශිල්පීය සේවා ගණය
8. ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය
9. ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය

- මෙම අධිකාරිය සඳහා අනුමත කාර්යය මණ්ඩලයේ පවතින පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම සහ බඳවා ගැනීමේ සිට විශ්‍රාම යාම දක්වා කාර්ය මණ්ඩල පරිපාලනයට අදාල සියලුම කටයුතු සිදු කිරීම.

### පුරප්පාඩු සම්පූර්ණ කිරීමෙන් ලැබෙන සමාජ ප්‍රතිලාභය

1971 පොල් සංවර්ධන පනත යටතේ පොල් සංවර්ධන අධිකාරිය වෙත පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම තුළින් ගෘහස්ත පරිභෝජනය සහ කර්මාන්තය සඳහා පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන සැපයුම තහවුරු කිරීම මඟින් 1971 පොල් සංවර්ධන පනත යටතේ පොල් සංවර්ධන අධිකාරිය වෙත පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම තුළින් ගෘහස්ත පරිභෝජනය සහ කර්මාන්තය සඳහා පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන සැපයුම තහවුරු කිරීම මඟින් පොල් කර්මාන්තය දීර්ඝ කාලීන වාණිජාමය ඵලදායීතා, තිරසාරත්වය හා ජාතික ආර්ථිකය සඳහා ඉහළ දායකත්වයක් කරා ගෙන ඒම පොල් සංවර්ධන අධිකාරියේ කාර්යභාරය වේ.

මෙහිදී පොල් ආශ්‍රිත නිෂ්පාදන හා නිෂ්පාදන ක්‍රම විධිමත් කිරීමේ සහ ප්‍රවර්ධනයේදී සහාය වීම, පොල් ආශ්‍රිත කර්මාන්ත නවීකරණය සඳහා තාක්ෂණික සේවාවන් සැපයීම හා මග පෙන්වීම, සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, යෝග්‍ය තාක්ෂණය හඳුන්වාදීම තුළින් පිරිවැය අවම කරලීමට සහාය වීම, මූල්‍ය සහනාධාර ලබාදීම, කර්මාන්ත ව්‍යාප්තිය හා රැකියා උත්පාදනයන් සිදු කිරීම, ගෘහාශ්‍රිත කර්මාන්ත නංවාලීම/ ස්වයං රැකියා උත්පාදනය සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදීම, අපනයනය සඳහා යොමු වන දිසිදි පොල් නිෂ්පාදනයන් පරීක්ෂා කිරීම හා තත්ත්ව සහතික නිකුත් කිරීම, රසායනාගාර පරීක්ෂණ සේවාවන් පවත්වාගෙන යාම, අගය එකතු කළ පොල් ආශ්‍රිත නිෂ්පාදනයන් දේශීය හා ජාත්‍යන්තරව ප්‍රවර්ධනය කිරීම, පොල් භාවිතයේදී සිදුවන නාස්තිය අවම කිරීම, දේශීය හා විදේශීය පාරිභෝගිකයින් අතර පරිසර හිතකාමී පොල් නිෂ්පාදනයන් භාවිතය ප්‍රචලිත කිරීම සහ

පරිභෝජනයට ජනතාව යොමු කිරීම, පොල් කර්මාන්ත ක්ෂේත්‍රයේ උන්නතියට අදාළ අලෙවි සංවර්ධන හා පර්යේෂණ ක්‍රියාවලින් සිදු කිරීම ආදී වශයෙන් වූ කාර්යයන් ඉටු කරවා ගැනීම මෙම පුරප්පාඩු සම්පූර්ණ කරලීම මගින් සිදු කරනු ලැබේ.

2017 වර්ෂයේදී සම්පූර්ණ කරන ලද පුරප්පාඩු

| තනතුර | සම්පූර්ණ කරන ලද පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යක්ෂ (අලෙවි සංවර්ධන හා පර්යේෂණ.) | 01 |
| සහකාර අධ්‍යක්ෂ (සැකසුම් සංවර්ධන) | 01 |
| ඉංජිනේරු (සිවිල්) | 01 |
| නීති නිලධාරි | - |
| ජ්‍යෝෂ්ඨ පරීක්ෂක | 04 |
| ආර්ථික පර්යේෂණ නිලධාරි | - |
| සැකසුම් සංවර්ධන නිලධාරි | 05 |
| මූල්‍ය නිලධාරි | 01 |
| පරිපාලන නිලධාරී | 01 |
| සභාපති ලේකම් | - |
| වැඩසටහන් සහකාර (තත්ත්ව පාලන) | 03 |
| වැඩසටහන් සහකාර (අලෙවි සංවර්ධන හා පර්යේෂණ) | - |
| වැඩසටහන් සහකාර (තාක්ෂණික සේවා) | - |
| පොත් තබන්නා | 01 |
| පරීක්ෂක | 04 |
| රසායනාගාර කාර්මික ශිල්පී | 05 |
| කළමනාකරණ සහකාර | 06 |
| රියදුරු | 01 |
| රසායනාගාර සහායක | - |
| කාර්යාල සහායක | 01 |
| ක්ෂේත්‍ර සහායක | 03 |

වගුව 30: 2017 වර්ෂයේදී සම්පූර්ණ කරන ලද පුරප්පාඩු

2016 වර්ෂය තුළ සේවකයින් 07 දෙනෙකු සේවයෙන් විශ්‍රාම ලබා ඇති අතර සේවකයින් 04 දෙනෙකු ඉල්ලා අස්වී ඇත.

## 4.2 මානව සම්පත් සංවර්ධන වැඩසටහන්

මානව සම්පත අධිකාරියේ මෙහෙවර හා අරමුණු ලඟා කර ගැනීම සඳහා වඩා ඵලදායිව හා සඵලදායීව යොදා ගැනීමට හැකිවන පරිදි මෙම අධිකාරියේ සේවක මහත්ම මහත්මීන්ගේ කාර්යක්ෂමතා හා ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා 2016 වර්ෂයේ දේශීය පුහුණු සංවර්ධන පාඨමාලා විවිධ විෂයන් ඔස්සේ සංවිධානය කිරීමට කටයුතු කරන ලදී. මෙහිදී පුහුණු සංවර්ධන පාඨමාලා මෙහෙයවනු ලබන රාජ්‍ය ආයතන සඳහා ප්‍රමුඛත්වය ලබා දෙමින් පාඨමාලා සංවිධානය කිරීමට කටයුතු කර ඇත. 2016 වර්ෂයේ දී අධිකාරියේ කාර්යය මණ්ඩලය වෙත පසුගිය වර්ෂයන්වලදී ලබා දීමට නොහැකි වූ හා අත්‍යාවශයෙන්ම ලබා දිය යුතු පුහුණු පාඨමාලා සඳහා සහභාගී කරවීම පාලන අංශයේ අරමුණ විය.



පුද්ගල ආකල්ප හා කුසලතා වර්ධනය, නවක කාර්යය මණ්ඩලය සඳහා රාජ්‍ය සේවය පිළිබඳ අවබෝධය ලබා දීම, කණ්ඩායම් හැඟීම වර්ධනය, රැකියා පරිසරයේ ඇති වී තිබෙන නව්‍යතා හඳුන්වා දීම හා ආයතනික පරිසරය කෙරෙහි හැඩගැස්වීම අරමුණ විය.

ඒ අනුව කාර්යය මණ්ඩලය වෙනුවෙන් පුහුණු හා සංවර්ධන කටයුතු සඳහා වැය කරන මුදල් අනාගත ආයෝජනයක් සේ සලකා පුහුණු අවශ්‍යතා හඳුනාගෙන අදාල පුහුණු කටයුතු සඳහා යොමු කිරීම සිදු කරන ලදී.

**දේශීය පුහුණු සංවර්ධන කටයුතු**

| | පාඨමාලාවේ නම | පවත්වන ලද ආයතනය | සහභාගී වූ ගණන | පැවති දින ගණන |
|---|---|---|---|---|
| 01 | කොන්ත්‍රාත් පරිපාලනය,ගෙවීම් කිරීමේ ක්‍රියා පටිපාටිය සහ කොන්ත්‍රාත් ලිපි ගොනු නඩත්තුව පිළිබඳ වැඩමුළුව | නිපුනතා සංවර්ධන පදනම | 01 | දින 01 |
| 02 | Training Programme on role of junior managers or supervisors in the implementation of ISO 22000:2005 standard | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | 24 | දින 01 |
| 03 | Uncertain Estimation in mesurement science | මිනුම් ඒකක,ප්‍රමිතිය හා සේවා දෙපාර්තමේන්තුව | 3 | දින 01 |
| 04 | Work shop on good manufacturing practices(GMP) for food industry | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | 12 | දින 01 |

| | | | | |
|---|---|---|---|---|
| 05 | Microsoft Excel-Advanced Analysis Tool | Adamas skill Development center | 01 | දින 02 |
| | සීමා. M.C. එන්ටර්ප්‍රයිසස් (පුද්.) සමාගම | 181,152.00 | |
| | සීමා. K.M.N. එක්ස්පෝට් & ඉම්පෝට් (පුද්.) සමාගම | 470,798.00 | **651,950.00** |
| | **ප්‍රාග්ධන සංවර්ධන අරමුදල** | | |
| | **ණයගැතියෝ හා ආපසු ගෙවන තැන්පත්** | | |
| | ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පත් | | 25,000.00 |
| | මන්වනායක තෙල් මෝල | | 90,000.00 |
| | සීමා. යුනයිටඩ් මෝටර්ස් (පුද්.) සමාගම | 12,900,000.00 | |
| | සීමා. රොටැක් ඉන්ස්ටෘමන්ට් (පුද්.) සමාගම | 4,871,957.75 | |
| | සීමා. ඇනලිටිකල් ඉන්ස්ටෘමන්ට් (පුද්.) සමාගම | 6,291,853.85 | |
| | සීමා. හෙම්සන්ස් ඉන්ටර්නැෂනල් (පුද්.) සමාගම | 5,883,400.00 | |
| | සීමා. ඇවොන්ෆැටමො කෙමිකල්ස් (පුද්.) සමාගම | 47,597.35 | |
| | M.A.L. අනුරසිරි බ්‍රදර්ස් | 2,465,274.28 | |
| | E.G. ධර්මසිරිවර්ධන ඇසෝසියේට්ස් | 105,930.75 | |
| | සීමා. නිව් ඉන්ටීරියර්ස් (පුද්.) සමාගම | 850,092.73 | |
| | P C ග්ලෝබල් සිස්ටම්ස් | 24,400.00 | |
| | සීමා. ක්වලිකෙම් ඉන්ටර්නැෂනල් (පුද්.) සමාගම | 115,000.00 | |
| | ඩේටා ටෙක් බිසිනස් | 34,941.50 | |
| | සීමා. W.E.C.O. හෝල්ඩිංස් (පුද්.) සමාගම | 1,766,779.50 | |
| | M.A.L. අනුරසිරි බ්‍රදර්ස් | 244,575.00 | 35,601,802.71 |
| | | | **35,716,802.71** |

| | | | |
|---|---|---|---|
| | **<u>මෝල් සංවර්ධන අරමුදල</u>** | | |
| | PSS තෙල් අරමුදල් කප්රුක දිරිය ණය අරමුදල | | **4,672,656.04** |
| ***16*** | **<u>ආපසු ගෙවන තැන්පත්</u>** | | |
| | **<u>GB.O.</u>** | | |
| | **<u>තත්ව සහතික</u>** | | |
| | ස්ටැසන් එක්ස්පෝට්ස් | 15,462.13 | |
| | C.W. මැකී හා සමාගම | 1,708.98 | |
| | G.P. ද සිල්වා | 9,572.00 | **26,743.11** |
| | **<u>ආපසුගෙවිය යුතු තැන්පත්</u>** | | |
| | M.A.L. අනුරසිරි හා සහෝදරයෝ | 12,776.95 | |
| | W.A.D.R.B. කුමාර | 15,500.00 | |
| | | | **28,276.95** |
| | **<u>තැන්පත් මුදල්</u>** | | |
| | Y.C.K. ජයතිලක මහතා | | **12,245.77** |
| | **<u>ටෙන්ඩර් තැන්පත්</u>** | | |
| | ගාමිණී කන්ස්ට්‍රක්ෂන් | 4,000.00 | |
| | හේමචන්ද්‍ර සිවිල් ඉංජිනියර්ස් | 4,000.00 | |
| | හිරු කන්ස්ට්‍රක්ෂන් & එන්ටර්ප්‍රයිසස් | 4,000.00 | |
| | කල්හාරා බිල්ඩර්ස් | 4,000.00 | |
| | නෙවිල්ස් | 4,000.00 | |
| | P.H. සිරිමන් ද සිල්වා හා පුත්‍රයෝ | 4,000.00 | |
| | සීමා. ක්වලිකෙම් ඉන්ටර්නැෂනල් (පුද්.) සමාගම | 45,000.00 | |
| | සීමා. ෂුවර්බිල්ඩ් කන්ස්ට්‍රක්ෂන් (පුද්.) සමාගම | 4,000.00 | |
| | S. සෙල්වකුමාර | 4,000.00 | |
| | සීම. A.B. සෙකියුරිටීස් (පුද්.) සමාගම | 5,000.00 | |
| | A.K.I.L. අමරසිංහ | 5,000.00 | |
| | සීමා. ඇඩම්ජී ලුක්මන්ජී (පුද්.) සමාගම | 5,000.00 | |
| | සීමා. අස්සලාරච්චි කන්ස්ට්‍රක්ෂන් (පුද්.) සමාගම | 5,000.00 | |
| | සීමා. C P ලංකා සමාගම | 15,000.00 | |
| | ෆීල්ඩ් සෙකියුරිටි සර්විස් | 5,000.00 | |
| | H.D. ගුණසිරි | 5,000.00 | |
| | සීමා. ඉරාම් ආම් සෙකිරියුටි සර්විසස් (පුද්.) සමාගම | 5,000.00 | |
| | ජානක මංචනායක | 5,000.00 | |
| | සීමා. මොනාරෝ හෝල්ඩිංස් (පුද්.) සමාගම | 5,000.00 | |
| | නාමල් කාරියවසම් | 5,000.00 | |
| | ඕෂන් මැරීන් සර්විස් | 5,000.00 | |
| | පයනියර් ආරක්ෂක සේවය | 5,000.00 | |
| | ආරක්ෂක සේවා සඳහා ප්‍රතිපාදන | 5,000.00 | |
| | ක්වීන් ස්ටාර් ආරක්ෂක සේවා | 5,000.00 | |
| | රයිස් මිල්ක් කොම්පෝස්ට් ෆැබ්රික් | 5,000.00 | |
| | සීමා. ශ්‍රීපා කන්ස්ට්‍රක්ෂන් (පුද්.) සමාගම | 5,000.00 | |
| | සුනිල් වෙල්ඩිං වර්ක් ෆර්නිචර් | 5,000.00 | |
| | W.A. ආරක්ෂක සේවය | 5,000.00 | |
| | සීමා. W.E. ආරක්ෂක සේවා (පුද්) සමාගම | 5,000.00 | |
| | සීමා. W.M. ආරක්ෂක සේවා (පුද්.) සමාගම | 5,000.00 | |
| | ඩෙසිකොලංකා එක්ස්පෝට් | 50,000.00 | |
| | සීමා. කන්ස්ට්‍රක්ෂන් ඉංජිනියරිං (පුද්.) සමාගම | 50,000.00 | |
| | සීමා. PC ට්‍රේඩිං (පුද්.) සමාගම | 125,871.00 | |
| | | | **417,871.00** |
| | **<u>ලත් අත්තිකාරම්</u>** | | |
| | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව (මාස 3) | | **1,029,000.00** |
| | | | **1,514,136.83** |
| ***17*** | **<u>අත්තිකාරම් ලෙස ලැබීම්</u>** | | |
| | **<u>GB.O.</u>** | | |
| | ප්‍රධාන මද නිෂ්පාදන ලියාපදිංචිය | 70,000.00 | |
| | සුළු මද නිෂ්පාදන ලියාපදිංචිය | 60,000.00 | |
| | කොහු නිෂ්පාදන ලියාපදිංචිය | 35,000.00 | |
| | කොහු මෝල්කරුවන් ලියාපදිංචිය | 19,559.20 | |
| | කොප්පර වෙළඳුන් ලියාපදිංචිය | 4,000.00 | |
| | DC මෝල්කරුවන් ලියාපදිංචිය | 45,000.00 | |
| | සැපයුම්කරුවන් ලියාපදිංචිය | 166,000.00 | |
| | පොල් තෙල් මෝල්කරුවන් ලියාපදිංචිය | 35,000.00 | |
| | පොල් වතු ලියාපදිංචිය | 2,000.00 | |
| | පොල් විවිධ නිෂ්පාදන අලෙවිකරුවන් ලියාපදිංචිය | 1,164,500.00 | |
| | | | **1,601,059.20** |

**18** <u>උපචිත වියදම්</u>

**G.B.O.**

| | | |
|---|---|---|
| E.T.F. - ගෙවීමට ඇති | 213,846.10 | |
| E.P.F. - ගෙවීමට ඇති | 1,591,073.12 | |
| පිරියත හා යන්ත්‍රෝපකරණ නඩත්තුව | 183,864.50 | |
| කාසි - ගෙවීමට ඇති | 1,024.18 | |
| පාරිතෝෂිත | 858,348.00 | |
| N.B.T | 120,401.78 | |
| සුබසාධන | 99,155.00 | |
| ජලය | 32,949.48 | |
| දුරකථන | 671,388.82 | |
| අභ්‍යන්තර ගමන් වියදම් | 410,563.20 | |
| විදුලිය | 413,560.30 | |
| මුද්දර ගාස්තු - ගෙවිය යුතු | 101,700.00 | |
| ලිපිද්‍රව්‍ය | 169,495.50 | |
| වැටුප් | 160,537.15 | |
| ඉන්ධන හා ලිහිසිතෙල් | 257,241.51 | |
| ප්‍රවාහන | 139,353.58 | |
| ආරක්ෂක සේවා | 380,150.00 | |
| පිරිසිදු කිරීමේ සේවා | 304,384.90 | |
| විගණන ගාස්තු | 1,377,835.00 | |
| වාහන නඩත්තුව | 55,255.00 | |
| අලෙවි ප්‍රවර්ධන & අත්තිකාරම් | 51,380.00 | |
| අතිකාල | 337,382.00 | **7,930,889.12** |

**19** <u>රාජ්‍ය ප්‍රදාන ප්‍රාග්ධනය</u>

| | |
|---|---|
| ශේෂය - 01-01-2017 දිනට | 39,536,064.92 |
| එකතු කළා : ලත් මහාභාණ්ඩාගාර ප්‍රදාන - 2017 වසර සඳහා | 25,563,506.13 |
| ප්‍රදාන ක්‍රමක්ෂය - 2017 වසර සඳහා | (36,154,342.53) |
| ශේෂය - 31-12-2017 දිනට | **28,945,228.52** |

**20** <u>ප්‍රාග්ධන සංවර්ධන ප්‍රදාන</u>

| | |
|---|---|
| ශේෂය - 31-12-2017 දිනට | **77,652,767.37** |

**21** <u>වියදම ඉක්මවන උපචිත ආදායම</u>

| **GBO** | Rs. |
|---|---|
| ශේෂය - 01-01-2017 දිනට | 75,732,989.52 |
| පූර්ව වසරේ ගැලපුම් (2016 ගෙවූ 2017 ට අදාළ වරිපනම් & බදු) | 1,139,337.60 |
| අතිරික්ත / හිඟ | 147,323,826.92 |
| ශේෂය - 31-12-2017 දිනට | **224,196,154.04** |

| **ප්‍රාග්ධන සංවර්ධන අරමුදල** | |
|---|---|
| ශේෂය - 01-01-2017 දිනට | **96,102,701.33** |
| අතිරික්ත /හිඟ -2017 | **(36,454,350.42)** |
| ශේෂය - 31-12-2017 දිනට | **59,648,350.91** |

| **PSS තෙල් අරමුදල** | |
|---|---|
| උපචිත අරමුදල - 01-01-2017 දිනට | 320,492,758.68 |
| අතිරික්ත /හිග - 2017 | 27,639,778.52 |
| උපචිත අරමුදල - 31-12-2017 දිනට | **348,132,537.20** |

| **NRI අරමුදල** | |
|---|---|
| ශේෂය - 01-01-2017 දිනට | 189,017.61 |
| ලත් පොලිය | 16,000.46 |
| GBO වෙත මාරුකළ | (73,341.00) |
| ශේෂය - 31-12-2017 දිනට | **131,677.07** |

| **MDF** | ජය ඉසුරු අරමුදල | පොල් සංවර්ධන අරමුදල | එකතුව |
|---|---|---|---|
| ඉතුරුම් ගිණුම | | 63,436,458.09 | |
| අඩමාන ගිණුම | | 1,871,775.75 | |
| ප්‍රාග්ධන සංවර්ධන අරමුදලින් ආපසු ලැබිය යුතු | | 6,396,556.28 | |
| ණයගැතියෝ | | (300.00) | |
| මුදාහල ජය රක්ෂණ ණය | 9,591,588.13 | | |
| ස්ථාවර තැන්පත් | 13,302,369.56 | | |
| ඉතුරුම් ගිණුම | 4,164,194.99 | | |
| Pss තෙල් අරමුදලට (ණය) ගෙවිය යුතු | (4,672,656.04) | | |
| ප්‍රාග්ධන සංවර්ධන අරමුදල | 688,597.19 | | |
| TB පොලී - අයවිය යුතු | 138,200.49 | | |

| | | | | |
|---|---|---|---|---|
| **ශේෂය - 01-01-2017** දිනට | | **23,212,294.32** | **71,704,490.12** | **94,916,784.44** |
| ඉතුරුම් ගිණුම | පිටුව -26 | | 22,341,513.33 | |
| අඩමාන ගිණුම | | | 1,871,775.75 | |
| ප්‍රාග්ධන සංවර්ධන අරමුදලින් අයවිය යුතු | | | 3,221,989.14 | |
| ණයගැතියෝ | | | (200.00) | |
| මුද්‍රාහළ ජයඉසුර ණය | | 12,432,717.58 | - | |
| ස්ථාවර තැන්පත් | | 12,328,475.29 | - | |
| ඉතුරුම් ගිණුම | | 4,210,361.77 | - | |
| Pss තෙල් අරමුදලට (ණය) ගෙවිය යුතු | | (4,672,656.04) | - | |
| ප්‍රාග්ධන සංවර්ධන අරමුදල | | 688,597.19 | - | |
| TB පොලී - ආපසු ගෙවීමට ඇති | | 186,447.07 | - | |
| **ශේෂය - 31.12.2017** දිනට | | **25,173,942.86** | **27,435,078.22** | **52,609,021.08** |

**හෙලිදරවු කිරීම්**

**නෛතික බැදීම්**

**1. නඩු අංකය 13360/MR**

හිරියාල ගොවි සමාගමෙන් රු. 1450000/- ක් අය කර ගැනීම සඳහා හිරියාල ගොවි සමාගමට එරෙහිව දිසා අධිකරණයේ නඩුවක් ගොනු කර තිබේ. නීතිපති දෙපාර්තමේන්තුව පොල් සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පෙනී සිටි. මෙහිදී සීමා. හිරියාල ගොවි සමාගම මාසික වාරික ලෙස රු. 1,450,000/- ගෙවීමට එකග වී ඇති බැවින් 2018.01.16 වන දින එකහතා කොන්දේසි දිසා අධිකරණයේදි සකසා ඇත.

2. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වංචා සිද්ධියට සැකකර පොල් සංවර්ධන අධිකාරියේ හිටපු ගණකාධිකාරිවරයෙකු වූ ශාන්ත රාජපක්ෂ මහතාට එරෙහිව නඩුවක් ගොනු කර ඇත. මෙය කොළඹ මහාධිකාරණයේ මේ වන විට ඇසෙමින් පවතින නඩුවකි.

3. පොල් සංවර්ධන අධිකාරියේ සේවකයෙකු විසින් පොල් සංවර්ධන අධිකාරියට එරෙහිව මූලික අයිතිවාසිකම් නඩුවක් පවරා ඇත. මෙම නඩුව ශ්‍රේෂ්ඨාධිකරනයේ ඇසෙමින් පවති.

**වෙනත්**

කොළම් කොටුවේ ඩූක් වීදියේ ගොඩනැගිල්ලේ පළමු මාලය 2017.05.04 දින ගින්නෙන් විනාශ විය. ගොඩනැගිල්ල, ලී බඩු, පරිසනක හා වෙනත් දෑ සඳහා වූ අලාභය ආසන්න වශයෙන් රු. මිලියන 3.9 ක් ලෙස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ඇස්මේන්තු කර ඇත. අවසන් මුදල 2018.02.15 දින වනතෙක් ස්ථිර කර නොතිබුනි.

## පොල් සංවර්ධන අධිකාරිය

**<u>මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන සටහන් - 31.12.2017 අවසන් වන වර්ෂය සඳහා</u>**

| | | |
|---|---|---|
| **1 පොලී ආදායම** | | |
| **G.B.O.** | | |
| පොලිය - සේවක ණය | 745,861.55 | |
| පොලිය -ආයෝජන (භාණ්ඩාගාර බිල්පත්) | 295,238.82 | |
| පොලිය - ස්ථාවර තැන්පත් | 27,609,261.66 | **28,650,362.03** |
| | | |
| **ප්‍රාග්ධන සංවර්ධන අරමුදල** | | |
| පොලිය - භාණ්ඩාගාර බිල්පත් | 97,769.83 | |
| පොලිය- ස්ථාවර තැන්පත් | 3,697,714.59 | |
| | | **3,795,484.42** |
| **P.S.S.** තෙල් අරමුදල | | |
| පොලිය -භාණ්ඩාගාර බිල්පත් | 6,108,840.55 | |
| පොලිය - බැංකු ණය | 607,916.70 | |
| පොලිය -ස්ථාවර තැන්පත් | 20,804,689.81 | |
| තැන්පත් ගිණුම් පොලී | 118,331.46 | |
| | | **27,639,778.52** |
| | | |
| **N.R.I.** අරමුදල **-** භාණ්ඩාගාර බිල්පත් පොලිය | | **16,000.46** |
| | | |
| **MDF** අරමුදල | | |
| පොලිය -ස්ථාවර තැන්පත් | 1,558,879.59 | |
| පොලිය - බැංකු ණය | 308,482.65 | |
| තැන්පත් ගිණුම් පොලි | 94,286.08 | **1,961,648.32** |
| | | |
| | | **62,063,273.75** |
| **2 කුලී ආදායම** | | |
| **G.B.O.** | | |
| සීමා. රාජ්‍ය වතු | | 4,116,000.00 |
| | | |
| **ප්‍රාග්ධන සංව. අරමුදල** | | |
| කුලි ආදායම - දූන්කන්නාව වහරක්ගොඩ නෙල්ලිය | | 62,976.00 |
| | | |
| | | **62,976.00** |
| **3 ලියාපදිංචි ගාස්තු** | | |
| **G.B.O.** | | |
| අපනයනකරුවන් - ප්‍රධාන මද නිෂ්පාදන | 2,725,250.00 | |
| අපනයනකරුවන් - සුළු මද නිෂ්පාදන | 2,092,566.00 | |
| අපනයනකරුවන්කෙහු & ◌ොහු නිෂ්පාදන | 6,102,862.00 | |
| ලියාපදිංචිය -කොප්පරා වෙලඳුන් | 102,250.00 | |
| ලියාපදිංචිය -සිකරුවන් & අතරමැදියන් | 32,746.00 | |
| ලියාපදිංචිය - D.C. ◌ෝල්කරුවන් | 960,250.00 | |
| ලියාපදිංචිය - ◌ොල් තෙල් ◌ෝල්කරුවන් | 1,632,935.00 | |
| ලියාපදිංචිය - ◌ොහු ◌ෝල්කරුවන් | 356,240.80 | |
| ලියාපදිංචිය - ◌ොප්පරා නිෂ්පාදනය | 305,362.51 | |
| ලියාපදිංචිය - අඟුරු නිෂ්පාදනය | 39,000.00 | |
| ලියාපදිංචිය - සැපයුම්කරුවන් | 270,500.00 | |
| ලියාපදිංචිය - Coconut වතු හිමිකරුවන් | 132,200.00 | |
| ලියාපදිංචිය - ◌ොල් කිරි සැකසුම් | 148,900.00 | |
| ලියාපදිංචිය - සක්‍රිය කාබන් | 75,000.00 | |
| අධිභාර - ප්‍රමාද ලියාපදිංචි ගාස්තු | 599,068.92 | |
| ලියාපදිංචිය - ◌ොල් විවිධ නිෂ්පාදන | 1,272,363.40 | |
| ලියාපදිංචිය - මාළු ◌ොල් | 2,550,000.00 | **19,397,494.63** |
| | | |
| **4 වෙන් දේසි මුදල්** | | |
| ◌ොග ගාස්තු ආදායම - ◌ොප්පරා & මාළු ◌ොල් | | 1,980,955.61 |
| **අඩු කළා :** වියදම් | | |
| ශාලා ගාස්තු | 112,950.00 | |
| වෙන්දේසි ගාස්තු | 1,000,000.00 | |
| වෙනත් | 74,075.00 | (1,187,025.00) |
| | | **793,930.61** |

| | | | | |
|---|---|---|---|---|
| 5 | **රසායනාගාර ආදායම** | | | |
| | තත්ව සහතික | | 776,927.24 | |
| | DC නියැදිකරන & අත්හදා බැලීම් ගාස්තු - DC | | 23,696,803.85 | |
| | අත්හදා බැලීමේ ගාස්තු - පොල් තෙල් | | 1,347,779.47 | |
| | ජල සාම්පල ගාස්තු | | 788,785.33 | |
| | | | | **26,610,295.89** |
| 6 | **විවිධ ආදායම්** | | | |
| | **G.B.O.** | | | |
| | ටෙන්ඩර් තැන්පත් | | 77,500.00 | |
| | පුවත්පත් විකිණීම | | 116,657.50 | |
| | වාහන කුලී | | 46,432.50 | |
| | විවිධ ආදායම් | | 247,231.09 | |
| | ලේබල් ගාස්තු | | 3,460,744.00 | **3,948,565.09** |
| 7 | **දූන්කන්නාව පොල් වත්ත හා මෝල** | | | |
| | පොල් අලෙවි කිරීම් | 1,323,015.00 | | |
| | **වියදම්** | | | |
| | පෝල කැඩීමේ වියදම් | (120,620.00) | | |
| | කම්කරු කුලී | (746,429.79) | | |
| | විදුලිය | (476,509.32) | | |
| | වෙනත් වියදම් | (147,068.02) | (167,612.13) | (167,612.13) |
| | | | | **3,780,952.96** |
| 8 | **ප්‍රතිඇගයුම් අතිරික්තය** | | | |
| | ප්‍රතිඇගයුම් සංචිතය - වාහන සඳහා 01.01.2017 | | | 46,049,983.00 |
| | ප්‍රතිඇගයුම් අතිරික්තය | | | 61,140,981.00 |
| | | | | **107,190,964.00** |
| | වාහන ප්‍රතිඇගයුම් මුදල | | | (64,975,000.00) |
| | ප්‍රතිඇගයුම් සංචිතය ඉක්මවා වාහන ප්‍රතිඇගයුම් මුදල | | | **42,215,964.00** |
| 9 | **ප්‍රාග්ධන සංවර්ධන පදනම** | | | |
| | වෙනත් ආදායම් | | | 3,904,596.45 |
| | | | | **199,308,441.41** |
| 10 | **සැකසුම් සංවර්ධන වැඩසටහන්** | | | **26,646,718.87** |
| 11 | **ලෙවි සංවර්ධන & පර්යේෂණ වැඩසටන්** | | | **52,063,408.38** |
| 12 | **තත්ව පාලන & තත්ව සහතික** | | | **17,387,570.64** |

ඩීසි මෝල්කරුවන්ට සේවා ලබාගත් ණයගැතියෝ 31-12-2017 දිනට

| මෝල් අ. | මෝල්කරුගේ නම | එකතුව (රු.) |
|---|---|---|
| 62 | සීමා. ඩෙසිකෝ ලංකා (පුද්,) සමාගම, ගනේවත්ත මෝල, ගනේවත්ත, නිකදලුපොත | 52,785.00 |
| 63 | විලෝ DC හා තෙල් මෝල, පුත්තලම පාර, තිබිල්ල, හලාවත | 65,981.75 |
| 64 | රත්කරව්ව DC & තෙල් මෝල, මාස්පොත | 52,785.00 |
| 67 | මාරවිල CPCS සංගමය, මාරවිල | 68,913.75 |
| 69 | සීමා. බදුවත්ත (පුද්.) DC මෝල | 189,146.25 |
| 71 | සීමා. මාදම්පේ මිල්ස් (පුද්.) සමාගම, තඹගල්ල, කාක්කපල්ලිය | 82,110.00 |
| 72 | ශා. ජෝශප් DC මනුෆැක්චර්ස් (පුද්.) සමාගම, කොළඹ පාර, වටිනාපහ | 54,251.25 |
| 75 | සිරියන්ගනි DC හා කොහු මෝල, ගිරිඋල්ල පාර, කටාන | 52,725.00 |
| 76 | *සීමා. S.A. සිල්වා හා පුත්‍රයෝ ලංකා (පුද්.) සමාගම, ලෝලුවාගොඩ මෝල, ලෝලුවාගො | 87,975.00 |
| 77 | ශා. ආනා කර්මාන්තශාලාව, දලුව, මාම්පුරි | 4,398.75 |
| 79 | *සීමා. රේනුකා ඇග්‍රෝ එක්ස්පෝට්ස් | 56,100.00 |
| 80 | දූනගහ CPCS, කෙහෙල්ඇල්ල මෝල, බඩල්ගම | 27,858.75 |
| 84 | පොත්තේවෙල DC හා තෙල් මෝල, මීරිගම පාර, බාංදූරාගොඩ | 41,055.00 |
| 85 | *සීමා. විවි (පුද්.) වතු සමාගම | 81,600.00 |
| 88 | සිමා. සොනික් එක්ස්පො (පුද්.) සමාගම | 74,778.75 |
| 89 | කුඩාවැව මෝල, කුඩාවැව | 71,846.25 |
| 91 | සඳලංකා C.P.C.S | 1,683.00 |
| 93 | ග්‍රීන් ෆාම් මෝල, කලුවාරිප්පුව, කටාන | 118,766.25 |
| 94 | සිරිකත DC මෝල, කොච්චිකඩේ | 17,595.00 |
| 95 | සීමා. CBL කොකොස් (පුද්.) සමාගම, කොළඹ පාර, අලව්ව | 253,640.24 |
| 102 | * සීමා. N M K කොකො ලැන්ඩ් (පුද්.) සමාගම | 119,276.25 |
| 103 | ශා. තෙරේසි DC මෝල, කටාන | 23,460.00 |
| 105 | සීමා. D.Y.හා D.U. රාජපක්ෂ (පුද්.) සමාගම, හේනේගම DC මෝල | 43,503.00 |
| 107 | චන්ද්‍රා DC මෝල, කන්දවල, කටාන | 5,865.00 |
| 108 | බත්තුළුඔය DC මෝල, පුත්තලම පාර, බත්තුළුඔය | 27,858.75 |
| 111 | සීමා. කුදිඉරිප්පු කොකනට් ප්‍රොඩියුසර්ස් (පුද්,) සමාගම | 89,441.25 |
| 113 | බැලුම්මහර DC මෝල, බැලුම්මහර, මුදුන්ගොඩ | 61,582.50 |
| 114 | සීමා. දෙව්මිනි කොකනට් ප්‍රොඩක්ට්ස් (පුද්.) සමාගම, නාත්තන්ඩිය මෝල, නාත්තන්ඩිය | 51,318.75 |
| 115 | බෝගමුව DC මෝල, අලුත්ගම, බෝගමුව, අලුත්ගම | 5,865.00 |
| 119 | මාතම්මන DC මෝල, මිනුවන්ගොඩ | 14,665.50 |
| 120 | ෆාතිමා DC & තෙල් මෝල, නයිනමඩම | 51,318.75 |
| 122 | ශාන්ත ජෝශප් DC & කොහු මෝල, කටාන | 43,987.50 |
| 124 | මිනුවන්ගොඩ මෝල, මිනුවන්ගොඩ | 79,177.50 |
| 126 | ලක්ෂ්මි DC මෝල, බට කන්ද, බඩල්ගම | 184,747.50 |
| 127 | වික්ටෝරියා DC මෝල,  වෙල්පල්ල | 114,367.50 |
| 130 | සීමා. බෝයගනේ DC (පුද්.) මෝල, බෝයගනේ, කුරුණෑගල | 36,656.25 |
| 131 | සීමා. ජයකොඩි (පුද්,) මෝල, නාත්තන්ඩිය පාර, දංකොටුව | 23,460.00 |
| 132 | සීමා. ඒසියන් ඇග්‍රෝ නිෂ්පාදන (පුද්,) සමාගම | 149,557.50 |
| 134 | ගුණවර්ධන DC මෝල, ගාලවත්ත, කටාන | 90,907.50 |
| 136 | වෙල්වින් DC මෝල, මිනුවන්ගොඩ | 23,460.00 |
| 139 | සීමා. සංහිද (පුද්,) DC මෝල | 54,251.25 |
| 144 | ස්වනී DC මෝල, මීගමුව | 11,730.00 |
| 145 | දූනගහ CPCS, දූනගහ | 2,932.50 |
| 148 | සීමා. RMP කොකනට් ප්‍රොඩියුසර්ස් (පුද්.) සමාගම | 7,331.25 |
| 149 | සීමා. මවික්සෙල් ඉන්ටර්නැෂනල් (පුද්.) සමාගම | 221,595.00 |
| 150 | සීමා. NDC එක්ස්පෝට් (පුද්.) සමාගම | 85,042.50 |
| 151 | සීමා වයඹ D.C. හා තෙල් මෝල්කරුවෝ | 57,183.75 |
| | | **3,136,537.24** |
| | | |

## ණයගැතියෝ - මාළු පොල් & කොප්පරා තොග ගාස්තුව
## 31.12.2017 දිනට

| කොප්පරා | මුදල (රු.) |
| --- | --- |
| | |
| **කොප්පරා තොග ගාස්තු** | |
| සීමා. G & J මැතිව් (පුද්.) සහ සමාගම | 41,356.44 |
| L.S.T. ද S. විජේරත්න සහ සමාගම | 23,242.95 |
| | |
| **මාළු පොල් වෙන්දේසි ගාස්තු** | |
| ජාතික පශුසම්පත් සංවර්ධන මණ්ඩලය | 104,291.18 |
| සීමා. හලාවත වැවිලි සමාගම | 173,616.00 |
| පොල් පර්යේෂණ ආයතනය | 16,426.53 |
| පොල් වගා කිරීමේ මණ්ඩලය | 212,356.16 |
| P.P. ගුණසේකර මිය | (3,101.60) |
| සීමා. ලලාන් රබර් (පුද්.) සමාගම | 37,350.77 |
| සීමා. කුරුණෑගල වතු සමාගම | 28,942.36 |
| සීමා. ඇල්කඩුව වතු සමාගම | 126,024.41 |
| සීමා H.L. ද මැල් (පුද්.) & සමාගම | 23,624.73 |
| C. දීපාල් මැතිව් මයා | 1,397.71 |
| සීමා. කෑගල්ල වතු සමාගම | (582.00) |
| පොල්කනත්ත වත්ත | 252.00 |
| දික්ලන්ද වත්ත | 2,553.00 |
| හල්පේ වත්ත **(වෛද්‍ය P.S. ද සිල්වා)** | 569.25 |
| සීමා. ය්ග්රෝ (පුද්.) සමාගම | 202.95 |
| ගනේකන්ද වත්ත **(ජනවසම)** | (101.70) |
| පියල් වඩනම්බි මයා **(ඩිග්ගලි & නිකමඩවත්ත)** | 1.00 |
| ශ්‍රී ලංකා කුකුළු සංවර්ධන සමාගම | (7,969.72) |
| **එකතුව** | **780,452.42** |

පොල් සංවර්ධන අධිකාරිය

# පුනරාවර්තන වියදම්

| 2016 | විස්තරය | අනු එකතුව | 2017<br>එකතුව |
|---|---|---|---|
| | **පුද්ගල පාරිශ්‍රමික** | | |
| 47,768,080 | වැටුප් & වේතන | 67,794,895.83 | |
| 41,778,020 | ජීවන වියදම් & වෙනත් දීමනා | 38,203,693.50 | |
| 11,689,593 | E.P.F. & E.T.F. | 15,856,094.05 | |
| 5,348,152 | අතිකාල & නිවාඩු පඩි | 4,548,814.70 | |
| 2,615,105 | සුබසාදන වියදම් | 3,313,576.00 | |
| 1,559,506 | පුහුනු & සම්මන්ත්‍රණ | 1,288,803.22 | |
| 110,758,456 | | | **131,005,877.30** |
| | **ගමන් වියදම්** | | |
| 5,325,008 | ගමන් වියදම් (දේශිය) | 5,321,657.68 | |
| - | ගාල් කිරීමේ ගාස්තු | 226,560.00 | |
| 5,325,008 | | | **5,548,217.68** |
| | **සැපයුම් & අවශ්‍යතා** | | |
| 8,305,120 | ලිපිද්‍රව්‍ය & වෙනත් අවශ්‍යතා | 7,910,814.48 | |
| 5,178,298 | ඉන්ධන & ලිහිසි තෙල් | 4,371,609.96 | |
| 408,968 | නිල ඇඳුම් | 592,647.01 | |
| - | පොත් & වාර සඟරා | - | |
| 5,259,331 | රසායනාගාර රසායන ද්‍රව්‍ය, වීදුරු භාණ්ඩ & වෙනත් පාරිභෝජ්‍ය දෑ | 8,285,333.77 | |
| 127,805 | වෙනත් අවශ්‍යතා | 440,243.77 | |
| 19,279,522 | | | **21,600,648.99** |
| | **අලුත්වැඩියා & නඩත්තුව** | | |
| 4,943,408 | ව්‍යුහයන් / ගොඩනැගිලි | 580,851.95 | |
| 1,988,279 | යන්ත්‍ර කාර්යාල උපකරණ & ලී බඩු | 2,227,538.61 | |
| 6,775,529 | වාහන | 4,620,079.04 | |
| 13,707,217 | | | **7,428,469.60** |
| | **ප්‍රවාහන, දුරකතන, උපයෝග්‍යතා & වෙනත් සේවා** | | |
| 3,974,807 | දුරකතන | 4,089,647.70 | |
| 1,746,848 | ප්‍රවාහන | 1,663,911.54 | |
| 5,987,693 | රක්ෂණ | 5,036,519.61 | |
| 2,280,325 | ආරක්ෂක සේවා | 2,561,525.00 | |
| 1,659,265 | පිරිසිදු කිරීමේ සේවා | 1,956,437.30 | |
| - | වාහන කුලී | 6,622,840.00 | |
| 6,925,350 | විදුලිය & ජලය | 5,837,094.54 | |
| 2,499,988 | වරිපනම් & බදු | 1,204,272.00 | |
| 23,796 | නෛතික ගාස්තු | 367,500.00 | |
| 484,528 | තැපැල් ගාස්තු & මුද්දර ගාස්තු | 483,657.00 | |
| 300,000 | විගණක ගාස්තු | 650,000.00 | |
| 40,745 | බැංකු ගාස්තු | 54,091.85 | |
| 25,923,344 | | | **30,527,496.54** |
| | **බදු හා වෙනත් පැනවීම්** | | |
| 225,000 | ආර්ථික සේවා ගාස්තු | 211,200.00 | |
| | වැට් බදු | 884,498.65 | |
| 12,375 | මුද්දර බදු | 15,775.00 | |
| 237,375 | | | **1,111,473.65** |
| | **වෙනත්** | | |
| 113,626 | සභාපතිවරයාගේ සංග්‍රහ දීමනා | 288,805.00 | |
| - | ගිනි ආපදා | 1,078,506.85 | |
| 1,607,506 | අධ්‍යක්ෂ මණ්ඩල දීමනා | 1,667,938.49 | |
| 2,586,360 | අලෙවි ප්‍රවර්ධන | 2,090,026.85 | |
| 4,307,493 | | | **5,125,277.19** |
| **179,538,415** | **මුලු වියදම** | | **202,347,461** |

## 6. අභ්‍යන්තර විගණන අංශය

2017 වර්ෂයට අදාල අභ්‍යන්තර විගණන සැලැස්ම අධිකාරියේ ක්‍රියාකාරී අංශ වන සැකසුම් සංවර්ධන අංශය, අලෙවි සංවර්ධන හා ආර්ථික පර්යේෂණ අංශය සහ තත්ත්ව පාලන හා තත්ත්ව ආරක්ෂණ අංශයන්හි ක්‍රියාකාරී සැලැස්ම ආවරණය වන පරිදි සහ ඊට අමතරව පරිපාලන අංශය සහ මුදල් අංශ වල කටයුතු ආවරණයවන ආකාරයට විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සහ භාණ්ඩාගාරයේ නියෝජිත මහතාගේ උපදෙස් පරිදි සකස් කර ක්‍රියාත්මක කරන ලදි.

ඒ අනුව, අනුමත කල විගණන සැලැස්ම පරිදි විගණන පරීක්ෂාවන් සිදුකර වාර්තාවන් 25 ක් ඉදිරිපත් කරන ලද අතර, ක්‍රියාකාරී අංශයන්හි 2017 ක්‍රියාකාරී සැලැස්ම ආවරණය වන පරිදි කරුණු 07 කට අදාලව සහ පාලන හා මූල්‍ය අංශ ආවරණය වන පරිදි කරුණු 06 කට අදාලවත් විගණන පරීක්ෂාවන් සිදුකර විගණන වාර්තාවන් ඉදිරිපත් කොට ඇත. මීට අමතරව, කළමනාකාරිත්වය විසින් පවරන ලද විශේෂ විමර්ශන 07 ක් සිදුකරන ලද අතර, ඉන් 01 ක් මූලික පරීක්ෂණයක්ය. මෙම විමර්ශණ වලට අදාල වාර්තා සියල්ලම වර්ෂය තුළ සිදුකර කළමනාකාරිත්වය වෙත ඉදිරිපත් කර ඇත.

### 6.1 විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

### 6.1.1 සංයුතිය සහ ගණපූර්ණය

රාජ්‍ය ආයතනවල යහපාලනයට අදාල මාර්ගෝපදේශ අත්පොත නමින් වූ 2003.06.02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 4.7.1 දරණ පරිච්ඡේදය සහ 2010.12.04 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/55 ප්‍රකාරව පොල් සංවර්ධන අධිකාරියේ විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා, එම චක්‍රලේඛ විධිවිධාන අනුව එම කමිටුවේ කටයුතු පවත්වාගෙන යාම සිදුකෙරේ. විගණන හා කළමනාකරණ කමිටු මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. සමාලෝචනයට බඳුන්වන වර්ෂයෙහිදී පහත නම් සදහන් අධ්‍යක්ෂවරුන් කමිටු සාමාජිකයන් ලෙස කටයුතු කරන ලදී.

**2017.03. 06 දින පැවති 2017/01 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම**

1. ආර්.එම්.පී.කේ නාමල් බණ්ඩාර මයා -භාණ්ඩාගාර නියෝජිත
2. එන්.එස් වනසිංහ මයා -අමාත්‍යංශ නියෝජිත
3. ඩබ්.එම්.වයි.ටී.ප්‍රනාන්දු මෙය -සාමාජික
4. එම්.ජී.එස්.සී. ජයරත්න මයා -සාමාජික

**2017.06.22 දින පැවති 2017/02 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම**

1. ආර්.එම්.පී.කේ නාමල් බණ්ඩාර මයා -භාණ්ඩාගාර නියෝජිත
2. එන්.එස් වනසිංහ මයා -අමාත්‍යංශ නියෝජිත
3. ඩබ්.එම්.වයි.ටී.ප්‍රනාන්දු මෙය -සාමාජික
4. එම්.ජී.එස්.සී. ජයරත්න මයා -සාමාජික

**2017.10.04 දින පැවති 2017/03 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම**

1. ආර්.එම්.පී.කේ නාමල් බණ්ඩාර මයා -භාණ්ඩාගාර නියෝජිත
2. එන්.එස් වනසිංහ මයා -අමාත්‍යාංශ නියෝජිත
3. ඩබ්.එම්.වයි.ටී.ප්‍රනාන්දු මෙය -සමාජික
4. එච්.ජී.එස්.සී.ජයරත්න -සමාජික

**2017.1 දින පැවති 2017/04 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම**

1. ආර්.එම්.පී.කේ නාමල් බණ්ඩාර මයා -භාණ්ඩාගාර නියෝජිත
2. එන්.එස් වනසිංහ මයා -අමාත්‍යාංශ නියෝජිත
3. ඩබ්.එම්.වයි.ටී.ප්‍රනාන්දු මෙය -සමාජික
4. එච්.ජී.එස්.සී.ජයරත්න -සමාජික

විගණකාධිපතිවරායාගේ නියෝජිතයකු හා ප්‍රධාන අභ්‍යන්තර විගණක රැස්වීම සඳහා සහභාගී වූහ. කමිටුවෙහි, කළමනාකරණය නියෝජනය කරන සාමාජිකයින් කිසිවෙකු නොමැත. අධ්‍යක්ෂ ජනරාල්වරයා ආරාධනයෙන් රැස්වීම සඳහා සහභාගි වේ. කළමනාකරණයේ අනෙකුත් සාමාජිකයින්ගේ සහභාගීත්වය කමිටුවට අවශ්‍ය වූ විට, රැස්වීම සඳහා සහභාගී වීමට ආරාධනා කරනු ලබයි. කමිටුවෙහි ගණපූර්ණය සාමාජිකයින් 03 කි.

## 6.2 කමිටුවෙහි කාර්යය භාරය

- පූර්ව අවසාන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව සමාලෝචනය කරමින් කමිටු උපදෙස් සහ නිර්දේශ නිසි පරිදි ක්‍රියාත්මක කිරීම පිළිබඳ විමසා බැලීම.
- ආකෘති සහ අන්තර්ගතය සමාලෝචනය කිරීම සහ පොල් සංවර්ධන අධිකාරියෙහි මූල්‍ය වාර්තාකරණ ක්‍රමයෙහි විශ්වසනීයත්වය අධීක්ෂණයට ලක් කිරීම.
- බාහිර සහ අභ්‍යන්තර විගණන කාර්යයෙහි විෂය මූලිකත්වය හා සඵලදායකත්වය සහතික කිරීම සඳහා යොදා ඇති ක්‍රියා මාර්ග නියාමනය හා සමාලෝචනය කිරීම.
- අභ්‍යන්තර පාලනයන් හි යෝග්‍යතාවය සහ සාර්ථකත්වය සමාලෝචනය කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.
- අභ්‍යන්තර විගණන වාර්තා, බාහිර විගණන විමසුම් හා ඒ සඳහා ගන්නා ලද පියවර සමාලෝචනය කිරීම.
- නියාමන සහ මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතා සමඟ අනුගත විම සහ අදාළ නියාමන අධිකාරීන් සමඟ පවත්නා සම්බන්ධතා සහතික කිරීම සඳහා වන ආචාර ධර්මානුකූල ප්‍රමිතීන් හා ක්‍රියාපරිපාටින් පිළිබඳ සමාලෝචනය කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.

## 6.3 රැස්වීම් සහ ක්‍රියාකාරකම්

සමාලෝචිත වර්ෂය තුළ හතරවරක් (04) කමිටුව හමුවන ලදී. රැස්වීම සඳහා කමිටු සාමාජිකයන්ගේ පැමිණීම පහත සඳහන් පරිදි වේ.

| අධ්‍යක්ෂවරයාගේ නම | සහභාගී වූ ගණන |
|---|---|
| ආර්.එම්.පී.කේ.නාමල් බණ්ඩාර මයා | 04 |
| එන්.එස් වනසිංහ මයා | 04 |
| ඩබ්.එම්.වයි.ටී.ප්‍රනාන්දු මිය | 04 |
| එච්.ජී.එස්.සී.ජයරත්න මයා | 04 |

සමාලෝචිත වර්ෂය කමිටුව විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් ක්‍රියාවට නංවන ලදී.

## 6.3.1 අභ්‍යන්තර විගණනය

- අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු වලට අදාලව 2017 වර්ෂය සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිර්දේශයන්ද සැලකිල්ලට ගනිමින් පිලියෙල කරනු ලැබූ අභ්‍යන්තර විගණන වැඩසටහන සහ විගණන සැලැස්ම සාකච්ඡාවට භාජනය කර, වැඩිදුරටත් විගණනයට භාජනය කලයුතු ක්ෂේත්‍රයන් පිළිබඳ උපදෙස් දීම සහ විගණන වැඩසටහන සහ විගණන සැලැස්ම මණ්ඩලීය අනුමැතිය සඳහා නිර්දේශ කිරීම.
- 2017 වර්ෂය සඳහා වන අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීමෙහි සඵලදායකත්වය අධීක්ෂණයට ලක් කරන ලදී.
- අනාගතයේදී නැවත සිදුවීම් වළක්වනු පිණිස කාලීන නිරවද්‍ය පියවරයන් ගැනීමේ අරමුණින් යුතුව විශේෂ අභ්‍යන්තර විගණන සොයාගැනීම් හා ඒවා සඳහා කළමණාකරණයේ ප්‍රතිචාර සමාලෝචනයට ලක් කරන ලදී.

## 6.3.2 බාහිර විගණනය

- 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පොල් සංවර්ධන අධිකාරිය සම්බන්ධයෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද විගණන විමසුම්වලට අදාලව කළමනාකරණය විසින් දක්වන ලද පිළිතුරු සමාලෝචනයට ලක් කරන ලද අතර, විශේෂයෙන් පෙන්වාදෙන ලද ගැටලු නැවත ඇති වීම වළක්වනු පිණිස කළමනාකරණය විසින් ගන්නා ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳව පසු විපරම් කරන ලදී.

### 6.3.3 මුද්‍රා වාර්තාකරණය

- වාර්ෂික විගණනය කරන ලද මුද්‍රා ප්‍රකාශ අධීක්ෂණ හා නියාමන අධිකාරිය විසින් නියම කරන ලද අවශ්‍යතාවයන්ට හා අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇති බවට සහතික කිරීමේදී මණ්ඩලයට සහයවන ලදී.

### 6.3.4 රැස්වීම් වාර්තා/ මණ්ඩලයට වාර්තා කිරීම්

- කමිටු පැවැත්වීම පිළිබඳ යෝග්‍ය රැස්වීම් වාර්තා මණ්ඩලීය ලේකම් කාර්යාලයෙහි පවත්වාගෙන යනු ලැබේ. රැස්වීම්වල සියලුම වාර්තා සහාගත කරන ලද අතර, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සම්මත කර ගන්නා ලදුව කමිටුව විසින් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලීය අනුමැතිය ලබා ගනු ලැබේ. ක්‍රමික පදනමක් මත කැපී පෙනෙන කරුණු සම්බන්ධයෙන් පසු පියවරයන් ගනු ලැබේ. අධිකාරියෙහි අනුගත රාමුවට සහ යෝග්‍ය අවස්ථාවන්හිදී ගන්නා ලද නිවැරදි කිරීමේ සහ වළක්වාලීමේ පියවරයන් සම්බන්ධයෙන් පසු විපරම් සිදුකර ඇත.

මගේ අංකය / எனது இல. / My No. පීඑල්ජ්/ඩී/සීඩීඒ/01/2017/02 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2018 ඔක්තෝබර් 17 දින

සභාපති

පොල් සංවර්ධන අධිකාරිය

**පොල් සංවර්ධන අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

පොල් සංවර්ධන අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1971 අංක 46 දරණ පොල් සංවර්ධන පනතේ 43 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මුල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මුල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනිම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන් වංචා හෝ වැරදි හේතුවෙන් මුල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මුල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

---------------

2.1 තත්ත්වාගණනය කළ මතය

---------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට පොල් සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

-------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 53 ඡේදය අනුව ප්‍රත්‍යාගණනය සිදු කල වත්කමක ධාරණ අගයේ අඩු වීමක් එම වත්කම් පන්තිය සම්බන්ධයෙන්ම වූ ප්‍රත්‍යාගණන අතිරික්තයට එරෙහිව සෘජුවම හර කල යුතු වුවද දුන්කන්නාව වත්තේ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් වූ රු. 8,673,540 ක ප්‍රත්‍යාගණන ඌණතාවය එම වත්කම් පන්තිය සම්බන්ධයෙන් වූ ප්‍රත්‍යාගණන අතිරික්තයට එරෙහිව හර කිරීම වෙනුවට වර්ෂයේ ලාභයට එරෙහිව කපාහැර තිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

--------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුල මිලදීගෙන තිබූ රු. 3,429,422 ක වායුසමීකරණ යන්ත්‍ර සහ විදුලි පංකා, කාර්යාල ලී බඩු හා උපකරණ යටතේ දැක්වීම වෙනුවට ගොඩනැගිලි යටතේ දැක්වීම හේතුවෙන් ගොඩනැගිලි ශේෂය එම වටිනාකමින් හා ගොඩනැගිලි ක්ෂය රු. 489,185 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වලට ගෙන තිබුණි.

(ආ) පොල් පර්යේෂණ මණ්ඩලයට බදු දී නැවත අධිකාරිය වෙත 2016 වර්ෂයේදී පවරා ගෙන තිබූ "දූන්කන්නාව වත්තෙහි" කොහු මෝලට අයත් යන්ත්‍රෝපකරණ, පරිගණක හා කාර්යාල ලිබඩු හා උපකරණ අයිතම 164 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණන සංචිත ගිණුම් ශේෂය රු.107,190,964 ක්වූ නමුත් මෝටර් වාහනවල 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණිත වටිනාකම වන රු.64,975,000 මුදල ප්‍රත්‍යාගණන සංචිතයේ අවසන් ශේෂය ලෙස ගලපා එහි වෙනස වන රු.42,215,964 මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයට මාරු කර තිබුණි. මේ හේතුවෙන් වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් නිරූපනය විය.

(ඈ) කප්රුක ජය ඉසුරු ණය යෝජනා ක්‍රමයට අදාල සහන පොලී වියදම වූ රු.2,745,383 ක ප්‍රමාණය සමාලෝචිත වර්ෂයට අදාල වියදමක් ලෙස ගිණුම් ගත නොකර ණයගැතියෙකු ලෙස මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයට පොලී වියදම හා සමාලෝචිත වර්ෂය අවසානයට ණයගැති ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.2.3 අවිනිශ්චිත ගිණුම්

මූල්‍ය ප්‍රකාශන වල 2016 වර්ෂයේ සිට පවතින රු. 1,871,776 ක අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයන් සම්බන්ධයෙන් ඒවා ඉදිරියෙන් දක්වා තිබූ සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොවුණි.

| | ගිණුම් විෂයය | වටිනාකම රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| (i). | දිසිදි පොල් මෝල් හිමියන්ට සපයා ඇති සේවාවන් වෙනුවෙන් (Service Rendered to D.C. Millers) මුදල් ලැබීම | 2,000,913 | ලදුපත් |
| (ii). | ණයට විකුණුම් | 3,136,537 | ඉන්වොයිස් |

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

(අ) සෙස් අරමුදල යටතේ පවතින ණය ගැතියන්ගෙන් වර්ෂ 5 කට වඩා වැඩි කාලයක සිට පවතින රු. 180,485 ක ශේෂයක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි

(ආ) පෞද්ගලික සමාගමක් වෙත 1984, 2002 සහ 2004 යන වර්ෂ වලදී ලබා දී තිබූ ණය මුදලෙන් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට රු.31,550,000 ක් අය විය යුතුව පැවතුණි. ණය මුදලට අදාල පොලිය වූ රු.40,116,090 ක ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ශේෂයක් ලෙස දක්වා නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

------------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.140,413,563 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.96,418,633 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 43,994,930 ක වර්ධනයක් විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව රජයේ ආදායම රු.14,310,017 කින් අඩු වුවද වෙනත් ආදායම් රු.133,833,931 කින් වැඩි වීම සහ සේවක පාරිශ්‍රමික වියදම රු.20,020,168 කින් හා පුහුණු හා සංවර්ධන වියදම් රු.29,292,265 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේදී රු.36,419,413 ක්වූ අතිරික්තය 2014 වර්ෂය වනවිට රු.15,457,175 ක් දක්වා පිරිහී තිබුණද 2017 වර්ෂය වනවිට රු.140,413,563 ක් දක්වා වර්ධනය වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය හා රජයට ගෙවූ බදු නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු 118,356,413 වූ දායකත්වය 2014 වර්ෂයේදී රු.116,614,175 දක්වා පිරිහී තිබුණද 2015 වර්ෂයේ සිට විචලනයන් සහිතව සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.309,001,563 ක් දක්වා වර්ධනය වී තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මුළු ආදායමෙන් සියයට 39 ක් භාණ්ඩාගාර ප්‍රදාන වලින් සමන්විත වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂය හා සැසඳීමේදි සමාලෝචිත වර්ෂයේ දී වෙනත් ආදායම් සියයට 70 කින් ඉහල ගොස් තිබුණු අතර පොලී ආදායම, රසායනාගාර ආදායම, පරීක්ෂණ හා සැකසුම් ගාස්තු ඉහල යාම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂය හා සැසදීමේ දි සමාලෝචිත වර්ෂයේ දී ජංගම අනුපාතය 1:18 සිට 1: 8 දක්වා පහල ගොස් තිබුණි.

3.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

--------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ නිලධාරියෙකු විසින් සමාලෝචිත වර්ෂයේදී රැකියාවේ උසස් වීමක් පිළිබඳව මූලික අයිතිවාසිකම් කඩ වීම සම්බන්ධයෙන් අධිකාරියට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් පවරා තිබුණි.

(ආ) අධිකාරියේ හිටපු ගණකාධිකාරිවරයෙකු සිදුකර තිබූ මුදල් වංචාවට අදාලව රු.2,000,000 ක් සඳහා මහාධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතින අතර රු.1,300,000 කට අදාලව වංචා විමර්ශන කාර්යාංශය විසින් පරීක්ෂණ සිදු කරමින් පැවතුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

4.1 කාර්යසාධනය

------------------

4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ ව්‍යාපෘති ඒකකයෙන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර තිබූ තාක්ෂණික හුවමාරු මධ්‍යස්ථාන 5 ක් පිහිටුවීමට සහය වීම හා ගුණාත්මක නිෂ්පාදන සිදු කිරීමට අවශ්‍ය උපකරණ 300 ක් ලබා ගැනීමට සහ නිෂ්පාදන දත්ත ලබා ගැනීම හා ලබාදීමට

දත්ත පද්ධතියක් සැකසීම අරමුණුකර රු. මිලියන 5.3 ක් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණද අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය තුළ එකී ක්‍රියාකාරකම් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පොල් ත්‍රිකෝණයෙන් බැහැර පොල් ආශ්‍රිත අගය වැඩිකළ නිෂ්පාදන සිදුකර ලීමට සහය වීම වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 3.5 ක් වෙන් කර තිබුණද, එයින් උපයෝජනය කර තිබුණේ රු. මිලියන 0.54 ක් පමණක් විය.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පොල් කිරි, පොල් කිරිපිටි, පොල් ක්‍රීම් පාරිභෝගික ජනතාව අතර ප්‍රචලිත කිරීමේ අරමුණින් වැඩසටහන් ප්‍රචාරය කරවා ගැනීම වෙනුවෙන් අධිකාරිය විසින් 2014 වර්ෂයේ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට හා රූපවාහිනී සංස්ථාවට ගෙවා තිබූ මුදලින් ප්‍රචාරණය නොවූ වැඩසටහන් වෙනුවෙන් එකී ආයතනවලින් පිළිවෙලින් රු.136,970 ක් හා රු.7,060,032 අයවිය යුතු වුවද එකී මුදල් අයකර ගැනීමට හෝ ඒ වෙනුවෙන් වෙනත් වැඩසටහන් ප්‍රචාරය කරවා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නොහැකි වී තිබුණි.

(ආ) ආයතනයේ කාර්යමණ්ඩලයට අදාලව සෞඛ්‍ය හා රෝහල් රක්ෂණාවරණයට අදාල ප්‍රසම්පාදන කටයුතු මාස 2 දින 19 ක් ප්‍රමාද වීම හේතුවෙන් එම කාලය තුල නිලධාරින්ගේ නේවාසික ප්‍රතිකාර ලබා ගැනීම් සහ වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම වෙනුවෙන් පිළිවෙලින් රු. 293,677 ක් හා රු. 308,823 ක් අධිකාරිය විසින් ගෙවීමට සිදුව තිබුණි.

(ඇ) ශ්‍රී ලාංකිය පොල් නිෂ්පාදනය අපනයනය කිරීමේ Ceylon Coconut සන්නාම නාමය ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන තුරු අධිකාරියට නොහැකි වී තිබුණි.

4.3 කාර්යමණ්ඩල පරිපාලනය

----------------------------

සමාලෝචිත වර්ෂය අවසන් වන විට අධිකාරියේ කාර්යය මණ්ඩලයෙහි අධ්‍යක්ෂ (සැකසුම් සංවර්ධන), අධ්‍යක්ෂ අලෙවිකරණ (ජාත්‍යන්තර), නීති නිලධාරි, තත්ව පාලන නිලධාරි යන තනතුරු වල පුරප්පාඩු පැවතියද අදාල තනතුරු වලට සුදුසුකම්ලත් නිලධාරින් පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

5. තිරසාර සංවර්ධනය

5.1. තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීම

2017 අගෝස්තු 14 දිනැති එන්පී/එස්පී/එස්ඩීජී/17 දරණ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කර තිබූ චක්‍රලේඛය සහ තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව පොල් සංවර්ධන අධිකාරිය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතු ද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි. ඊට අදාලව පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) තිරසාර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීම සඳහා අධිකාරිය විසින් හඳුනාගත් කාර්යයන් වාර්ෂික සැලැස්මට අතුළත් කර නොතිබූ අතර එම කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂික අයවැයට ඇතුළත් කර නොතිබුණි.

(ආ) කිසියම් කාර්යයක නිවැරදි කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවැතීම අත්‍යාවශ්‍ය වුවත්, අධිකාරිය විසින් තිරසර සංවර්ධන ඉලක්කයන්හි ළඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහිකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

6.1 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

රසායනාගාරය නවීකරණය කිරීමේ කටයුතු සඳහා 2017 සැප්තැම්බර් 25 දින කොන්ත්‍රාත්කරුවෙකු සමග එලඹ තිබූ රු.17,105,455 ක ගිවිසුම අනුව අදාල ඉදිකිරීම 2017 දෙසැම්බර් 25 වනවිට අවසන් විය යුතු වුවත් විගණන දිනය වූ 2018 ජූලි 30 වන විටත් අදාල ඉදිකිරීම් නිමකර නොතිබුණි. ඒ හේතුවෙන් 2017 වර්ෂයේදී මිලදී ගත් රු. 17,950,802 ක රසායනාගාර උපකරණද අදාල අරමුණු වලට යොදාගැනීමට නොහැකි වී තිබුණි.

7. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩු පාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | i. ස්ථාවර වත්කම් නිවැරදි ලෙස වර්ගීකරණය කර ගිණුම්ගත නොකිරීම.<br>ii. ජ'නල් සටහන් මඟින් ගැලපීම් සිදු කිරීමේ දී වගකිව යුතු නිලධාරින්ගේ නිර්දේශය අනුව සිදු නොකිරීම. |
| (ආ) මානව සම්පත් කළමනාකරණය | ප්‍රධාන තනතුරු වල පවතින පුරප්පාඩු සඳහා අවශ්‍ය බඳවා ගැනීම් කටයුතු සිදු නොකිරීම. |
| (ඇ) අයවැය පාලනය | අයවැයගත මුදල් අදාල අරමුණු ඉටු කර ගැනීම වෙනුවෙන් යොදාගෙන නොතිබීම. |
| (ඈ) වත්කම් කළමණාකරනය | කොටුව ආදිපාද වීදියේ කාර්යාල ගොඩනැගිල්ලේ ඇති වූ ගිනි හානිය සම්බන්ධයෙන් වූ වාර්තාව ලබාදීමේ ප්‍රමාදයක් පැවතීම හා නියෝගයක් ලබා නොගෙන පිරිවැය රු. 3,312,462 ක කාර්යාල උපකරණ හා පරිගණක උපාංග පොත් වලින් ඉවත් කර තිබීම. |

එච්.එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති